ISSN 1391 - 1031
2019 ජූලි
25 වෙළුම 03 කලාපය
ආධාරය රු 40/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"අපි මුල පිරීම පටන් ගතිමු. කිනම් රටක නිර්ධන පංතිය විසින් කිනම් දවසක හා කිනම් වෙලාවක මේ ක්‍රියාදාමය සම්පූර්ණ කරනු ලබතිද යන්න වැදගත් නොවේ. වැදගත් දෙය නම්, අවහිරය මඟ හරවා, මාර්ගය විවෘත කර, මාවත පෙන්වා දී තිබීමය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**12වැනි වෙළුම,**
**41 පිටුව**

# ආණ්ඩුව ඉල්ලා අස්වෙනු!

# ජ.වි.පෙ. වීදි බසී

තවදුරටත් රට පාලනය කිරීමට හෝ මහජනතාවගේ වගකීම් ඉටුකිරීමට හැකියාවක් නොමැති වූද, වසර හතරහමාරක කාලය තුළ රට සියලු ක්ෂේත්‍රයන්හි විශාල කඩාවැටීමකට ලක් කර තිබෙන්නා වූද රට විශාල ණය කන්දක හිරකොට තිබෙන්නා වූද, පොදු ජනතාවගේ ආර්ථික ප්‍රශ්න, තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්න, ගොවි ජනතාවගේ අස්වැන්න පිළිබඳ ප්‍රශ්න, පාරිභෝගික ජනතාවට අත්‍යාවශ්‍ය භාණ්ඩවලට සහන මිලක් නොලැබීම යන කිසිදු ගැටලුවකට සුහදායී පිළිතුරක් ලබාදීමට නොහැකි වූද ආණ්ඩුවට ඉල්ලා අස්වන ලෙස බල කරමින් දැවැන්ත උද්ඝෝෂණ ව්‍යාපාරයක් ජනතා විමුක්ති පෙරමුණ විසින් ආරම්භ කොට ඇත.

මෙම තොරතුරු අනාවරණය කෙරුණේ පසුගිය 27වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. එහිදී අදහස් දක්වමින් ජනතාවගේ මහජන ආරක්ෂාව තහවුරු කිරීමට ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් ආණ්ඩුවත් අසමත් වී ඇති බවත් 21වැනිදා ප්‍රහාරය සම්බන්ධයෙන් බුද්ධි අංශ මගින් සවිස්තරාත්මක තොරතුරු ලබාදී තිබියදීත් ආණ්ඩුව එය වළක්වා ගැනීමට සමත් නොවූ බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, වත්මන් ආණ්ඩුව කිසිදු වගකීමක් ඉසිලිය නොහැකි ආණ්ඩුවක් බව තහවුරු කර ඇති බැවින් මෙම පාලනය ඉවත් කළ යුතුව තිබෙන බව අවධාරණය කළේය.

"රට පාවාදෙන, ඉතාම අහිතකර පන්නයේ ආර්ථික ගිවිසුම්වලට අත්සන් කිරීමට මේ ආණ්ඩුව කටයුතු කරමින් තිබෙනවා. ඒ වගේම රටේ ස්වාධීනත්වයට, ස්වෛරීත්වයට හානි කරන ගිවිසුම් මේ ආණ්ඩුව විසින් අත්සන් කරමින් තිබෙනවා. මේ ආණ්ඩුව රටේ ආර්ථික මර්මස්ථාන, ඉඩම් සම්පත විදෙස් රටවලට විකුණමින් තිබෙනවා. යහපත් ආණ්ඩුකරණය ගැන මේ ආණ්ඩුව විවිධ මුසාවන් ප්‍රකාශ කළත් මේ ආණ්ඩුව සිදුකරමින් තිබෙන්නේ දූෂිත ආණ්ඩුකරණයක්. ඒ වගේම ආණ්ඩුවට මහජන ආරක්ෂාව තහවුරු කරන්න බැරිවෙලා තිබෙනවා. එනිසා තවදුරටත් මේ ආණ්ඩුව කිසිදු වගකීමක් ඉසිලිය නොහැකි ආණ්ඩුවක් බව තහවුරුයි." ඔහු ප්‍රකාශ කළේය.

මේ තත්වය තුළ ආණ්ඩුව ඉල්ලා අස්වී මහමැතිවරණයකට අවස්ථාව ලබා දිය යුතුව ඇති බව කී අනුර දිසානායක සහෝදරයා එසේ නොවන්නේනම් ආණ්ඩුව ගෙදර යැවීම සඳහා ජනතාව **02 වැනි පිටුවට**



'රට අරාජික කළ ආණ්ඩුව ඉල්ලා අස්වෙනු'
කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී - 2019.06.12


**03 දේශපාලන අර්බුද...**



ධනවාදයේ පොදු අර්බුදයත් ඉන් සියලුම ජනකොටස් පීඩාවට පත්ව සිටීමත්...

**07 රට යට කරන ණය උගුල්...**




මූල්‍ය තත්වය පිළිබඳව ප්‍රකාශයට අනුව 2018 දෙසැම්බර් 31 දිනට රටේ මුළු වත්කම...

**09 සමාජවාදය තුළ විවේකය...**



පවුලක් තුළ සාමාජිකයින් අතර සිදුවන අදහස් හුවමාරුව පවුලේ සෑම සාමාජිකයෙකුම...

**11 රජයේ උපත හා ව්‍යාප්තිය...**



මාක්ස්වාදයට අනුව ඉතිහාසය තුළ මෙම සමාජ ක්‍රමවල වෙනස්කම් කරනු ලැබුවේ දෙවියන් හෝ රජුන් නොව...

තරුණ........ 04
සංවාදය........ 05
ආවර්ජනා........ 06
ජාත්‍යන්තර........ 08
කාන්තා........ 10
කාලීන........ 12
වේදිකාව........ 13
විශේෂ........ 14


**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## නැගෙනහිර පර්යන්තය විකිණීමට එරෙහි විරෝධතා



කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සංවර්ධනය කිරීමට යැයි පවසමින් එය ජපානය හා ඉන්දියාවට පැවරීම වෙනුවෙන් සහයෝගීතා ගිවිසුමකට ආණ්ඩුව අත්සන් තබා ඇති අතර ආණ්ඩුවේ මෙම ක්‍රියාවලියට එරෙහිව පසුගියදා කොළඹ වරාය ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවැත්විණි. රට පුරා අරඹා ඇති විරෝධතා ව්‍යාපාරයට සමාන්තරව මෙම උද්ඝෝෂණය පැවැත්වන ලද අතර මේ සඳහා වරාය සේවකයෝ විශාල පිරිසක් සහභාගි වූහ.

එසේම මෙම ගිවිසුම පරාජය කිරීමට සහය ලබාගැනීම වෙනුවෙන් සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය දේශපාලන පක්ෂ නායකයින් හමුවීමේ ක්‍රියාවලියකට අවතීර්ණ වී ඇත. ඒ අනුව එම සංගමය මගින් පසුගියදා ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂ නායක ඩිව් ගුණසේකර හා සමසමාජ පක්ෂ නායක තිස්ස විතාරණ එම කාර්යාලවලදී හමුවී ඇත.

එහිදී මෙම ගිවිසුම අහෝසි කර නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක පර්යන්තයක් බවට පත් කිරීම සඳහා කඩිනමින් මෙහෙයුම් උපකරණ මිලදී ගැනීමට ආණ්ඩුවට බලකරන ලෙසත් නැගෙනහිර පර්යන්තයේ ගොඩනැගීමට ඇති ඉතිරි මීටර් 800ක ප්‍රමාණය ශ්‍රී ලංකා රජය මැදිහත්ව ලබා ගන්නා ණය මුදලක් මගින් කඩිනමින් ගොඩනැගීමට ආණ්ඩුවට බල කරන ලෙසත් ඉල්ලා එම දේශපාලන පක්ෂවල සහාය ඉල්ලා සිටි බව සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා පැවසීය.

## ආණ්ඩුව පලවා හැරීමට වතු කම්කරු ජනතාව බලගන්වමින්



2019 වතු කම්කරු සාමූහික ගිවිසුම අත්සන් කරන මොහොතේ පොරොන්දු වූ රු 50/= වතු කම්කරුවන්ට වහාම ගෙවන ලෙස සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කේ. සෙල්වරාජ් සහෝදරයා ආණ්ඩුවෙන් ඉල්ලා සිටී. පසුගියදා සමස්ත ලංකා වතු කම්කරු සංගමය මගින් කොළඹ පැවති මාධ්‍ය හමුවකදී ඔහු මේ බව පැවසීය.

එහිදී ඔහු වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසූයේ 2019 මාර්තු මාසයේදී වතු කම්කරු 1000 සටන මොට කර දමා දිනකට රු 50/=ක් රජයේ මැදිහත්වීමෙන් ලබා දීමට පොරොන්දු වූ නමුත් එය මෙතෙක් ලබාදීමට කටයුතු කර නැති බවත්ය. මේ තත්වය තුළ ආණ්ඩුව පලවා හැරීමට පෙරට එන ලෙසට ඔහු වතු කම්කරු ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

## හෝටල් සේවක ගැටලුවලට ආණ්ඩුව මැදිහත්විය යුතුයි
### හෝටල් සේවක මධ්‍යස්ථානය



පසුගිය අප්‍රේල් 21 දින සිදු වූ ම්ලේච්ඡ අන්තවාදී ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් ශ්‍රී ලංකාවේ බරපතළම හානිය සිදු වූයේ සංචාරක කර්මාන්තයට බවත් ඒ වෙනුවෙන් විශාල ගැටලුවලට මුහුණ දී සිටින හෝටල් සේවකයින්ට ආණ්ඩුව වහා මැදිහත්වීමක් සිදු කළ යුතු බවත් හෝටල් සේවක මධ්‍යස්ථානයේ සභාපති නීතිඥ ජානක අධිකාරී සහෝදරයා පවසයි.

අන්තර් සමාගම් සේවක සංගමයේ හෝටල් සේවක මධ්‍යස්ථානය මගින් පසුගියදා බත්තරමුල්ල Waters Edge හෝටලයේදී මාධ්‍ය හමුවක් පවත්වමින් ඔහු මේ බව පැවසූ අතර එහිදී පහත කරුණු අනාවරණය කරන ලදී.

මෙම කඩා වැටීම හේතුවෙන් සංචාරක කර්මාන්තය තුළ සේවයේ නියුතු ලක්ෂ දෙකකට අධික සේවක පිරිසක් හා ඔවුන්ගේ දරුපවුල් අද අන්ත අසරණභාවයට පත්වී ඇති නමුත් ආණ්ඩුව ඒ පිළිබඳ අවධානය යොමුකිරීමට අපොහොසත් වීම කණගාටුවට කරුණක් බවද ඔහු පෙන්වා දුන්නේය.

## ජ.වි.පෙ. යෝජනා මාලාව වැඩකරන ජනතාවට



ජනතා විමුක්ති පෙරමුණ මගින් රට හමුවේ තබන ලද ආගමික උමතු අන්තවාදයත්, ජාතිවාදයත් පරදා, ජාතික ආරක්ෂාව හා මහජන ආරක්ෂාවත්, ජතික සමගියත් තහවුරු කිරීම සඳහා වන විශේෂ යෝජනා මාලාව වැඩකරන ජනතාවට පිළිගැන්වීම පසුගියදා මරදාන CSR ශාලාවේදී සිදුකරන ලදී. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම අවස්ථාව සඳහා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය වෙනුවෙන් එහි ජාතික සංවිධායක වසන්ත සමරසිංහ සහෝදරයා, ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ රැසක් සහභාගි වූහ.

## නෙවිල් ප්‍රනාන්දු රෝහල වහා රජයට ගනු රෝහල් සේවකයෝ උද්ඝෝෂණයේ



මාලඹේ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල නඩත්තුව සඳහා රජයෙන් මිලියන ගණන් මුදල් වියදම් කළද මේ දක්වා එය රජයට පවරා ගැනීමට පියවර ගෙන නොමැත. එමෙන්ම මේ වනවිට සේවක රැකියා අනාරක්ෂිත වී ඇති බැවින් එහි සේවය කරන 400කට ආසන්න සේවක පිරිස දැඩි ව්‍යාකූල තත්වයකට පත්ව සිටිති.

මෙම කරුණු මුල්කර ගනිමින් මාලඹේ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල වහාම රජයට පවරා ගන්නා ලෙස සේවක අරගලයක් දියත්ව ඇති අතර, එහි පළමු පියවර ලෙස පවත්වන ලද සේවක උද්ඝෝෂණයක් පසුගියදා සෞඛ්‍ය අමාත්‍යාංශය ඉදිරිපිටදී පවත්වන ලදී. මෙම උද්ඝෝෂණය සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ජානක අධිකාරී සහෝදරයාද සහභාගි විය.

## වසන්ත සමරසිංහ 108 වන ILO සැසියට

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 108 වන සැසිවාරය ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර පැවති අතර ඒ සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා සහභාගි විය. ජූනි 10 - 21 දක්වා පැවැති මෙම සැසිවාරය සඳහා ILO සංවිධානය නියෝජනය කරන රටවල රාජ්‍ය නායකයෝ, වෘත්තීය සමිති නියෝජිතයෝ සහභාගි වී සිටියහ.

# එතෙරින්...

## රෝමයේ නෙරපා හැරීම්වලට එරෙහි සටනට ජ.වි.පෙ.ත්




"නෙරපා හැරීම්වලට එරෙහිව සහයෝගීතාවයේ විවෘත නගරයක්" යන තේමාව යටතේ ඉතාලි සහ සංක්‍රමණික ජනතාව විශාල සහභාගිත්වයෙන් පැවැති දැවැන්ත උද්ඝෝෂණයකට ජූනි 22 රෝමයේදී ජනතා විමුක්ති පෙරමුණේ රෝම සහෝදරත්වයද එක් විය.

රෝමයේ සංක්‍රමණික ජනතාවට ඇති නිවාස ගැටලු හා ඔවුන් බලහත්කාරයෙන් ඉවත් කිරීමට එරෙහිව ජ.වි.පෙ. ඇතුළු ප්‍රගතිශීලී සංවිධාන මෙම උද්ඝෝෂණය සංවිධානය කර තිබුණි.

## එක්ව නැගිටිමු! අන්තවාදය පරදවමු!



ස්වීඩනයේ එතෙර අපි සංවිධානය විසින් සංවිධානය කරන ලද "එක්ව නැගීසිටිමු, මව්බිමේ අන්තවාදය පරදමු" මැයෙන් වන සාකච්ඡා සභාවක් පසුගියදා ස්වීඩනයේ ස්ටොක්හෝම්හි ABT - folkets hus Hallundu හිදී පැවැත්විණි.

## හඳුන්නෙත්ති ජර්මනියේ මියුනිච්හිදී සම්මන්ත්‍රණයක




ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා පසුගිය ජූනි 08 ජර්මනියේ මියුනිච් නගරයේදී " අන්තවාදය පැරදවීමට ජාතික සමගිය ගොඩනැගීමට අපගේ කාර්යභාරය" යන තේමාව යටතේ පවත්වන ලද සම්මන්ත්‍රණයකට සහභාගි විය. මෙම සම්මන්ත්‍රණය සූදානම් කොට තිබුණේ ජර්මනියේ ජනතා විමුක්ති පෙරමුණ කමිටුව විසිනි. මීට අමතරව ඩසල්ඩොෆ් හා බර්ලින් නගරයන්හිදී ද මෙවැනිම ජනහමු පැවැත්විණි.

## ජයලත් මනෝරත්නට කටාර්හිදී උපහාර



ජයලත් මනෝරත්න රංගන ශිල්පියානන් අඩ සියවසක තම රංගන දිවියෙන් ශ්‍රී ලාංකේය කලාව වෙනුවෙන් සිදු කළ මෙහෙවර අගැයීමක් පසුගිය ජූනි 14දා කටාර් රාජ්‍යයේ දෝහා නගරයේදී සිදු කරන ලදී.

දෝහා කටාර්හි අල් මයස්සා රංග ශාලාවේදී මෙම සම්මාන ප්‍රදානය සිදු වූ අතර මීට සමගාමීව උදයසිරි වික්‍රමරත්නගේ "සුද්දෙක් ඔබ අමතයි" වේදිකා නාට්‍යයද ප්‍රදර්ශනය කර කෙරිණි. මෙම කටයුතු කටාර්හි 'එතෙර අපි' සංවිධානය විසින් සංවිධානය කර ඇති අතර ජයලත් මනෝරත්නයන් විසින් කටාර්හි ස්ටැෆර්ඩ් ශ්‍රී ලංකා පාසැලේදී විශේෂ දේශනයක්ද පවත්වනු ලැබීය.

## අබුඩාබියේදී රාමසාන් සැමරේ!



රාමසන් සැමරීම උත්සවය වෙනුවෙන් අබුඩාබියේ එතෙර අපි සංවිධානයේ සාමාජිකයින් විසින් අබුඩාබි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේදී මුස්ලිම් සහෝදරත්වය වෙනුවෙන් ඉස්තාර් භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. මේ සඳහා මුස්ලිම් ආගමික නායකයින් මෙන්ම ශ්‍රී ලංකා තානාපති කාර්යාල නිලධාරීන් සහ ශ්‍රී ලංකික ශ්‍රමිකයෝ රැසක් එක්ව සිටියහ.

## රටේ සම්පත්...

01 වැනි පිටුවෙන්

පෙළගැස්වීමට ජනතා විමුක්ති පෙරමුණ නායකත්වය ගන්නා බව පෙන්වා දුන්නේය.

මෙහි පළමු පියවර පසුගිය ජූනි 12දා කොළඹ කොටුවේ පැවති උද්ඝෝෂණයෙන් ආරම්භ කරන ලද අතර ඉන්පසු ප්‍රාදේශීය උද්ඝෝෂණ කිහිපයක් පැවැත්වීමෙන් අනතුරුව ජූලි 10-11 දෙදින පාර්ලිමේන්තුවේ පැවැත්වෙන විශ්වාසභංග විවාදය මූලික කරගෙන ජූලි මාසයේ 07 සහ 08 'වීදි පිරෙන පාද සටන' නමින් විශාල උද්ඝෝෂණ පා ගමනක් සංවිධානය කොට තිබේ. 07වැනිදා කළුතර සිට මොරටුවටත් 08වැනිදා මොරටුවේ සිට නුගේගොඩටත් ළඟා වීමෙන් පසු 08වැනි දින පස්වරුවේ නුගේගොඩදී දැවැන්ත ජනතා රැලියක් සංවිධානය කිරීමටද ජනතා විමුක්ති පෙරමුණ කටයුතු යොදා ඇති බව මෙහිදී අනාවරණය කෙරිණි. වත්මන් ආණ්ඩුව ගෙදර යවන තුරු මෙම උද්ඝෝෂණ මාලාව අඛණ්ඩව දියත් කිරීමට ජ.වි.පෙ. සූදානම් බවද අනුර දිසානායක සහෝදරයා මෙහිදී වැඩිදුරටත් අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# බල අර්බුදයේ මුල කොතැනද?

වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පසුගියදා කළ කථාවකදී, 18වැනි හා 19වැනි ව්‍යවස්ථා සංශෝධන වැරදි බවත් ඒවා ඉවත් කළ යුතු බවත් පවසා තිබුණි. එහිදී ඔහු පැහැදිලි කළේ 18වැනි සංශෝධනය ඒකාධිපතියෙකු නිර්මාණය කළ නිසා එය වැරදි බවත්, 19වැනි සංශෝධනය මගින් ජනාධිපති බලතල අඩුකොට බල මධ්‍යස්ථාන දෙකක් (ජනාධිපති-අගමැති) නිර්මාණය කළ බවත්, වත්මන් ජනපති-අගමැති අරගලයට හේතුව එය නිසා "19" ද ඉවත් කළ යුතු බවත්ය.

ප්‍රථමයෙන්ම මතුකළ යුතු කාරණය වන්නේ මෙම සංශෝධන දෙකටම මෛත්‍රීපාල මහතාද දායක වූ බවය. 18වැනි සංශෝධනයට ඔහු මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ඇමතිවරයෙක් ලෙස සහයෝගය දැක්වූ අතර, '19'ට ඔහු ජනාධිපතිවරයා ලෙස අකමැත්ත සහිතව වුවද දායක විය. දැන් මෙලෙස කථාකරන්නේ එම මෛත්‍රීපාල මහතාය.

'දැන ගියොත් කතරගම නොදැන ගියොත් අතරමග' යැයි කථාවක් අපේ ජනවහරේ තිබේ. වත්මන් ජනාධිපතිවරයා කරගෙන තිබෙන්නේ එයයි. ඔහුට ලැබූ ජනවරමට අනුව ඔහු කළ යුතුදේ නොකර ඒ ඒ වෙලාවේදී බලය වෙනුවෙන් 'ගේම්' ගැසීම් හා ව්‍යවස්ථා විරෝධී කුමන්ත්‍රණ කිරීම් දක්වා ගිය ඔහු අවසානයේ ඔහුත් අතරමංව තම පාක්ෂිකයින්වත් අතරමං කොට රටත් අරාජික කර තිබේ. සිදුව ඇති සත්‍යය එයයි.

ඔහුද කැබිනට් ඇමති ධුරයක් දැරූ රාජපක්ෂ පාලනය විසින් ගෙන එනු ලැබූ 18වැනි සංශෝධනය ඒකාධිපති ජනාධිපති ක්‍රමයේ බලය තවත් වැඩිකරන රාජාණ්ඩු ක්‍රමයකට රට රැගෙන යන එකක් බව ඇත්තය. එහෙත් ඉන්පසු 'දින 100' පාලනය තුළ ගෙන ආ 19වැනි සංශෝධනය මගින් සිදු කළ ප්‍රධාන දෙය වූයේ 18වැනි සංශෝධනය අහෝසි කිරීමය. එබැවින් දැන් '18' අලුතින් අහෝසි කළ යුතු නැත. මන්ද දැනටමත් එහි තිබූ ඒකාධිපති හා රාජාණ්ඩු වර්ගයේ බලතල අහෝසි කර ඇති බැවිනි. එහෙත් 19 යනු, ප්‍රජාතන්ත්‍රවාදයේ පැත්තට තැබූ, ඒකාධිපති බලය අඩු කිරීමේ පැත්තට තැබූ අර්ධ පියවරකි. දැන් කළ යුතු වන්නේ 19 අහෝසි කිරීම නොව 19 තැබූ අර්ධ පියවර සම්පූර්ණ කිරීමය. එසේ නැතිව 18 හා 19 අහෝසි කළ විට ඉතිරි වන්නේ ජේ.ආර්. ජයවර්ධන හදා දුන් ඒකාධිපති ක්‍රමයමය.

ජනාධිපතිවරයාගේ ප්‍රකාශයේ කිසියම් කුඩා ඇත්තක්ද තිබේ. ඒ 19වැනි සංශෝධනය විසින් බල තුලනයක් නිර්මාණය කර තිබීමය. සැබෑ ලෙසම වත්මන් ජනාධිපතිවරයාත්, එ.ජා.ප. ආණ්ඩුවත් බලයට ආවේ විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි කරන බවට පොරොන්දු වෙමිනි. 2015 ජනවාරි 08 ජනවරමේ ප්‍රධාන කරුණ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමය. ජනාධිපති ලෙස දිවුරුම් දෙන මොහොතේදී මෛත්‍රීපාල සිරිසේන මහතා දිවුරා පොරොන්දු වූයේද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමටය. එහෙත් දින 100 පාලනය තුළ විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි කර ගැනීමේ දුෂ්කරතාවය (ව්‍යවස්ථාමය, තාක්ෂණික, හා පුද්ගල) නිසා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන දෙසට තබන පියවරක් ලෙස, අතරමැදි තත්වයක් ලෙස එහි බලතල අඩුකරන '19' සම්මත කර ගන්නා ලදී. ඒ නිසාම '19' යනු අතරමැදි තත්වයකි.

එබැවින් මෛත්‍රීපාල මහතා දැන් කළ යුතු වන්නේ, 19වැනි සංශෝධනයේ ඇති 'අතරමැදි' තත්වයෙන් ඉදිරියට ගොස් විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි කිරීමට කටයුතු කිරීම මිස ආපස්සට ගොස් '19' අහෝසි කිරීම නොවේ.

වර්තමානයේ පවතින ජනපති - අගමැති ප්‍රතිවිරෝධයේ සැබෑ හේතුවද 19වැනි සංශෝධනය නොවේ. එය එලෙස පැවසීම දේශපාලන තක්කඩිකමකි. ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් තමන්ට ලැබුණු ජනවරමට වග වෙන්නේ නම්, තමන්ටම අවංක වී රට හා ජනතාව වෙනුවෙන් කටයුතු කරන්නේ නම්, දැන් පවතින බලතල බෙදීම් කිසිදු ප්‍රශ්නයක් හෝ බාධාවක් වන්නේ නැත. එබැවින් වත්මන් අරාජිකත්වයේ හේතුව '19' නොවේ. මේ දෙදෙනාගේ පටු, පෞද්ගලික, බලලෝභී හා උද්ධච්ච හැසිරීමය.

ජනාධිපති හා අගමැති තම බලය ගැන පමණක් සිතන විට, එය තව වැඩිකර ගැනීමට හා එකිනෙකා නොසලකා කටයුතු කිරීමට පෙළඹෙන විට, පෞද්ගලික ප්‍රතිවිරෝධයන් හා අමනාපකම් මත කටයුතු කරන විට, සාමූහික හැඟීමක් නොමැති වූ විට මෙවැනි තත්වයක් මතුවීම අනිවාර්ය වේ. එබැවින් අහෝසි කළ යුත්තේ, '19' නොව ජනාධිපතිගේත් අගමැතිගේත් උද්ධච්ච හැසිරීමය; වගවීමෙන් තොර හැසිරීමය; බලලෝභී හැසිරීමය.

අනෙක් අතට දැන් සැබෑ ලෙසම කළ යුතු වන්නේ, ජනපති - අගමැති අතීතයේදී පොරොන්දු වූ පරිදි 19 විසින් ආරම්භ කළ ගමන හා දේශපාලනයේ ප්‍රජාතන්ත්‍රවාදී දිශානතිය ඉදිරියට ගෙනගොස් විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි කිරීමය. එසේ නැතිව සත්‍යය සඟවා ජනතාව නොමඟ යවන ප්‍රකාශ කිරීම හෝ යළි ඒකාධිපති ක්‍රමයට යාමට සිහින දැකීම නොවේ.

# ජනාධිපතිවරණය හා දේශපාලනයේ අර්බුද



ලංකාව මේ වනවිට පත්ව ඇත්තේ බරපතළ සමාජ ආර්ථික දේශපාලන හා සංස්කෘතික අර්බුද රැසකටය. රටේ ආර්ථිකය මුහුණ දී ඇති අර්බුදය විශාල හා ගැඹුරු එකකි. එයට වත්මන් ක්‍රමය තුළ විසඳුම් නැත. හිටපු විගණකාධිපතිවරයා පසුගියදා කළ කථාවකදී පෙන්වා දී තිබුණේ ලංකාවේ දිනක ආදායම රු. බිලියන 05ක් වන අතර දිනක වියදම රුපියල් බිලියන 07ක් වන බවය. දිනකට රු. බිලියන 05ක් උපයා 07ක් වියදම් කරන්නේ කෙසේද යන්න ඉන්ද්‍රජාලික ප්‍රශ්නයකි. රජයේ වංචා දූෂණ නාස්තිය අඩුකොට රුපියල් බිලියන 07ක වියදම අඩුකර ගැනීමට හෝ නිෂ්පාදනය ඉහළ නංවා බිලියන 05 ආදායම වැඩිකර ගැනීමට හැකියාවක් හෝ වැඩපිළිවෙළක් ධනවාදී පාලකයන්ට නැත. එහි ප්‍රතිඵලය වන්නේ රට ණය බරින් මිරිකීමත් රටේ සම්පත් විකුණා දැමීමත් රටට අහිතකර වෙළඳ හා ආරක්ෂක ගිවිසුම්වලට යාමට සිදුවීමත්ය. වරක් ලෙනින් කී පරිදි ධනවාදයේ අර්බුදය ධනපති පාලකයන්ට විසඳිය නොහැකි අතර එය හරියටම අයෙක් තමන්ගේ සපත්තු පටිවලින් ඇද තමාවම ඔසවා ගැනීමට තැත් දැරීමක් වැනිය. අප මේ දකින්නේ එම විකටරූපී තත්වයයි.

මේ අතර දැන් ජනාධිපතිවරණයේ දිනයද කිට්ටු වෙමින් තිබේ. මේ වනවිට ලංකාවේ ප්‍රධාන ධනපති කණ්ඩායම් ජනාධිපතිවරණය ඉදිරියේ විශාල දේශපාලන අර්බුදයකටද ලක්ව ඇති බව පෙනේ.

2015 ආරම්භයේදීම තමන්ට ලැබුණ ජනවරමෙන් කැලේ පැන විවිධ දේශපාලන 'ගේම්' ගසමින් ව්‍යවස්ථා විරෝධී කුමන්ත්‍රණ කරමින් අසාර්ථකම දේශපාලන ගමනක් ආ වත්මන් ජනාධිපතිවරයා ජනාධිපතිවරණය අභියස සිටින්නේ තම දේශපාලන ගමන අවසන් කරගත් කෙනෙකු ලෙසය. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට පොරොන්දු වී බලයට පැමිණි ඔහු දැන් විධායක ක්‍රමයේ බලතල තරමක් අඩු කළ 19වැනි සංශෝධනය අහෝසි කිරීමට කථා කිරීම මගින් පෙන්වා දී ඇත්තේ ජනාධිපති පුටුව ඔහුගේ හිස කෙතරම් අවුල් කර තිබේද යන්නය. කෙසේ වෙතත් ඉදිරි ජනාධිපතිවරණයේදී තුන් කොන් සටනක් ඇති නොකරන බව පැවසීම මගින් ඔහු අඟවා ඇත්තේ ඊළඟ ජනාධිපතිවරණයේදී ඔහුට තරග කිරීමටවත් ඉඩ නොලැබෙන අසරණ තත්වයකට ඔහු පත්ව සිටින බවය.

එසේම ජනාධිපති අපේක්ෂකයා පිළිබඳ ප්‍රශ්නය මුල්කරගෙන එ.ජා.ප. තුළද ගැටලු මතුවී තිබේ. ඊළඟ ජනාධිපති අපේක්ෂකයා ලෙස රනිල් වික්‍රමසිංහ කිසිසේත් පිළිගැනීමට එ.ජා.ප. පාක්ෂිකයා සූදානම් නැත. එ.ජා.ප. නායකයන්ද රනිල්ගේ නායකත්වය දුර්වල බව දනී. එම තත්වය තුළ පාක්ෂිකයන්ගේ කැමැත්ත වී ඇත්තේ සජිත් ප්‍රේමදාස නායකයා කොට ජනාධිපති අපේක්ෂකයා කිරීමය. ඒ අතර එ.ජා.ප.යට 2015දී උදව් කළ ඇතැම් අයගේ අදහස වී තිබෙන්නේ ජනාධිපතිවරණය සඳහා කරු ජයසූරිය ඉදිරිපත් කළ යුතු බවය. සජිත් තරග වදින්නේ නම් තමන් සජිත්ට උදව් කරන බවට ඉඟියක් මෛත්‍රීපාල සිරිසේන මහතාද කර තිබුණි. එය කෙසේ වෙතත් සටන අත්හැරීමට රනිල් වික්‍රමසිංහ මහතාද සූදානම් නැත. තම පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා පිළිබඳව ප්‍රසිද්ධියේ අදහස් දැක්වීම් නොකරන ලෙස රනිල් විසින් පක්ෂයට තහනමක් පනවනු ලැබ ඇත්තේද මෙම ගැටුම්වල තත්වය බරපතළ නිසාය. එ.ජා.ප.යට තවමත් සියලුම දෙනා කැමති වන අපේක්ෂකයෙක් නැත. බොහෝ දෙනා රනිල්ට අකමැති වුවත් නායකත්වය අත්හැරීමට රනිල් සූදානම් නැත. මේ තත්වය එ.ජා.ප.ය තුළ නිර්මාණය කර ඇත්තේ අර්බුදයකි.

අනෙක් අතට මහින්ද රාජපක්ෂ කඳවුර තුළද ජනාධිපති අපේක්ෂකයා පිළිබඳ 'සීතල යුද්ධය' උණුසුම් වෙමින් තිබෙන බව පෙනේ. යම් පිරිසක් ඒ සඳහා ගෝඨාභය රාජපක්ෂ ගෙන ඒමට උත්සාහ කළද මේ වනතුරු මහින්ද රාජපක්ෂ ඒ බව ප්‍රකාශ කර නැත. තවමත් ඔහු පවසන්නේ තම අපේක්ෂකයා පිළිබඳ තවම තීරණයක් ගෙන නැති බවය. ඊළඟ ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීමට රාජපක්ෂ පවුලේ බොහෝ දෙනා කැමැත්තෙන් සිටියත් ජනාධිපති අපේක්ෂකකම රාජපක්ෂ පවුල තුළම තබාගැනීමට විරුද්ධ අයද සිටී. වෙල්ගම ඉන් එක් අයෙකි.

රාජපක්ෂවරුන්ට තවත් අර්බුදයක් තිබේ. ඒ සිංහල ජාතිවාදය ඇවිළවීමට ගොස් මුස්ලිම් හා දෙමළ ඡන්ද නැතිකර ගැනීමේ පාඩුවය. පසුගිය වසරේ රාජපක්ෂවරුන් (මහින්ද, ගෝඨාභය, බැසිල්) මුස්ලිම් ඡන්ද දිනාගැනීම සඳහා විශාල උත්සාහයක් ගත් බව අපි දුටුවෙමු. එහෙත් පසුගිය අප්‍රේල් 21 බෝම්බ ප්‍රහාරය සමග රාජපක්ෂ කල්ලියේ අය ඉතාම අශීලාචාර ලෙස ජාතිවාදය ඇවිස්සීම නිසා 'අමාරුවෙන් දිනාගත්' මුස්ලිම් ඡන්ද යළි මහින්ද කණ්ඩායමට අහිමි වී තිබේ. එය ඔවුන්ට ජනාධිපතිවරණයකදී විශාල පාඩුවකි. මේ සියල්ලටම වඩා ඊළඟ ජනාධිපතිවරණයේදී මහින්දට අපේක්ෂකයෙක් ලෙස තරග වැදීමට නොහැක. සමුපකාර ඡන්දයකට පවා මහින්ද නැතිවම බැරිව සිටින මෙම කල්ලිය මහින්ද නැතිව ජනාධිපතිවරණයක් කරන්නේ කෙසේද යන ගැටලුවද දැන් ප්‍රබලව මතුව තිබේ.

මේ සියල්ල විසින් පෙන්වන්නේ, ධනේශ්වර දේශපාලන කණ්ඩායම් සියල්ලම අභ්‍යන්තර හා දේශපාලන අර්බුද රැසකට මුහුණදී සිටින බවය. වත්මන් ලාංකේය සමාජය වෙත අලුත් යමක් ගෙන ඒමට හෝ අලුත් බලාපොරොත්තුවක් ඇතිකිරීමට ඔවුන්ට නොහැක. ඒ නිසාම දේශපාලනය තුළ ඔවුන්ගේ ස්ථානය හොඳින්ම තහවුරු වී හෝ ජයග්‍රහණයක් ස්ථාවර බවට වන සාධක මතුවී හෝ නැත. අලුත් දේශපාලන බලවේගයකට සමාජය තුළ ඉඩක් නිර්මාණය කරන්නේ මෙම අර්බුදය විසින් බව පැහැදිලිය.

ධනවාදයේ පොදු අර්බුදයත් ඉන් සියලුම ජනකොටස් පීඩාවට පත්ව සිටීමත් වසර 71ක තට්ටුමාරු දේශපාලනයේ අත්දැකීම හා ධනපති නායකයන් වයසින් මෙන්ම අදහස්වලින්ද මහලු වී සිටීමත් නව තත්වයට ඔවුන්ගේ ඇති නොගැලපීමත් නිසා නව දේශපාලන ව්‍යාපාරයක් සඳහා වන ඉඩක් සමාජ දේශපාලනය තුළ මතුව තිබේ. එම ඉඩ පවතින්නේ පැරණි ක්‍රමය වෙනුවට නව ක්‍රමයක් වෙනුවෙන් සටන් වැදීමට සූදානම් වමේ හා ප්‍රගතිශීලී බලවේගයන්ටය. එබැවින් නූතන සමාජයේ ගැටලු හඳුනන ඒ සඳහා වන විද්‍යාත්මක හා නවීන ප්‍රතිපත්ති සහිත රැඩිකල් වමේ ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන්ගේ එකතුවකට මේ මොහොතේ සමාජය තුළ සිදුකළ හැකි වෙනස විශාලය. සමාජය තුළ අවකාශය සකස් වෙන්නේ තිබෙන සම්ප්‍රදායක පක්ෂවලට නොව හැම අතින්ම අලුත්කම් සහිත නව බලවේගයකටය. මේ මොහොතේ අවංක ලෙසම රටේ වෙනසක් ප්‍රාර්ථනා කරන වමේ ප්‍රගතිශීලී ප්‍රජාතන්ත්‍රවාදී රැඩිකල් බලවේගයන් කටයුතු කළ යුත්තේ තමන් ඉදිරිපිට නිර්මාණය වී ඇති මෙම අවස්ථාව අත්පත් කර ගැනීමටත් එමගින් රට වෙනස් දේශපාලන මඟකට අවතීර්ණ කිරීමටත්ය.

> ධනවාදයේ පොදු අර්බුදයත් ඉන් සියලුම ජනකොටස් පීඩාවට පත්ව සිටීමත් වසර 71ක තට්ටුමාරු දේශපාලනයේ අත්දැකීම හා ධනපති නායකයන් වයසින් මෙන්ම අදහස්වලින්ද මහලු වී සිටීමත් නව තත්වයට ඔවුන්ගේ ඇති නොගැලපීමත් නිසා නව දේශපාලන ව්‍යාපාරයක් සඳහා වන ඉඩක් සමාජ දේශපාලනය තුළ මතුව තිබේ. එම ඉඩ පවතින්නේ පැරණි ක්‍රමය වෙනුවට නව ක්‍රමයක් වෙනුවෙන් සටන් වැදීමට සූදානම් වමේ හා ප්‍රගතිශීලී බලවේගයන්ටය.

තරුණ



YES WE CAN

# සුදු ඇඳන් එන කළු මහත්හොරු

හැලිය රත්වෙනකම්ලු කකුළුවො දිය කෙළින්නෙ. ඒ වගේම තමා අපේ රටේ නායකයින්ට, නැතිනම් විධායක ජනාධිපති ධූරය සඳහා වලිකන අයටත් වෙලා තියෙන්නෙ. හැලිය රත්වෙනකම් ඔවුන්ගේ කතා සිත්ගන්නා සුළුය. "විධායකය අහෝසි කිරීමට බලය දෙන්න!"- ඒ හිටපු, ඉන්න නායකයින්ගේ ඊනියා පොරොන්දුවයි. එ.ජා.ප සමුළුවේද විධායකය අහෝසි කරන යෝජනාව සම්මත වූවත් දැන් ජනාධිපතිවරණය සඳහා ලකලෑස්ති වන්නේ තවදුරටත් මෙය ඊනියා පොරොන්දුවක් බවට තහවුරු කරමින්ය.

දැන් හැලිය රත්වෙන කාලයයි. සිත්ගන්නා වදන් වෙනුවට දැන් හාස්‍ය මුසු ජවනිකාවන් රඟදක්වමින් තිබේ. අපේක්ෂක කලඑළි මංගල්‍ය ආරම්භ වී ඇත. රනිල්ද? සජිත්ද? එ.ජා.ප.ය අභ්‍යන්තර අර්බුදයකය. රනිල්ගේ සමීපතමයින් කිහිපදෙනෙක්ම සජිත්ගේ ඔඩක්කුවට පැන ඇති නිසා රනිල් කරන්නට යන්නේ නංගි පෙන්නා අක්කා දීමටය. පාක්ෂිකයින්ට කරුෑ පෙන්නා රනිල්ම තරගයට ඒමටය.

අනෙක් පසින් මහින්දද? ගෝඨාද? ඔවුන්ද අභ්‍යන්තර අර්බුදයකය. "ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට වඩා චමල් ලොකු තාත්තා එන එක හොඳයි"- රාජපක්ෂ පුත්‍රයෙකුගේ කටින් එළියට පැන්නේ මේ සීතල යුද්ධයේ ප්‍රකාශනයයි. බැසිල්ද? චමල්ද? ගෝඨද? එමෙන්ම මේ දවස්වල චම්පික රණවකගේද සුදු රෙද්ද තවත් සුදු වී ඇත්තේ රාජයෝගය අත ළඟ ඇති නිසාවෙනි.

දැන් දේශප්‍රේමීත්වයේ ඊනියා සළුපිළි පොරවාගෙන එන්නේද, ගම් උදාවේ පාරම්පරික උරුමය කියාගෙන එන්නේද, සුදට සුදේ බැබළි බැබළී එන්නේද පරණ කළු මහත්හොරුම බව සිහිතබාගත යුතුය. පසුගිය පාස්කු ප්‍රහාරය මේ සියලුදෙනා දැන සිටි බවද නොරහසකි. තුන්සීයකට ආසන්න පිරිසකගේ ජීවිත ම්ලේච්ඡ ත්‍රස්තයන් විසින් බිලිගනිද්දී නොදන්නවා සේ සිටියේ මේ සුදු ඇඳන් එන කළු මහත්හොරුමය. එම ත්‍රස්ත කණ්ඩායම් තම දේශපාලන හා ම්ලේච්ඡ ක්‍රියා සඳහා යොදවා ගත්තේද දැන් දේශප්‍රේමී සළුපිළි තවරාගත් මොවුන්මය. එමෙන්ම රටේ සම්පත් මාරුවෙන් මාරුවට විකුණා අපේ රට මේ තත්වයට ඇද දැමුවේද මොවුන්මය. රටේ ස්වෛරීභාවය ලෝකයා ඉදිරියේ කෙළෙසා දැමුවේද මොවුන්මය.

විවිධ ස්වරූපයෙන් පැමිණ නැවතත් රටේ ජනතාවත්, තරුණ පරම්පරාවත් රවටා බලයට පැමිණීමට උත්සාහ දරන්නේ රටේ සම්පත් විකුණූ, රටේ ස්වෛරීභාවය පාවා දුන්, රටේ ආරක්ෂාව බිලිදුන්, ත්‍රස්තවාදය පෝෂණය කර තරුණ ජීවිත දස දහස් ගණනින් රටට අහිමි කළ, තරුණ අයිතිවාසිකම් අමු අමුවේ උල්ලංඝනය කළ ඊනියා පාලකයින්ම බව අප හොඳින් තේරුම්ගත යුතුය.

මේ නිසාවෙන් මෙම ඊනියා දේශප්‍රේමී මහත්හොරුන්ට රැවටී අපේම අනෙකාට එරෙහිව නැගිටිනවා වෙනුවට, අපේම උන්ව වර්ජනය කරනවා වෙනුවට, අපේම උන්ට එරෙහිව ඉහව්ල ඒරිල ඨරී වැයකරනවා වෙනුවට, රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන්, රටේ ස්වෛරීභාවය වෙනුවෙන්, රටේ සම්පත් ආරක්ෂා කර අනාගත පරම්පරාවට උරුම කරදීම වෙනුවෙන් තරුණයින් ලෙස ජාති, ආගම්, කුල, පාට, පක්ෂ පසෙකලා එක්ව නැගී සිටිය යුතුය. සැබෑ සතුරා; සුදු ඇඳන් එන කළු මහත්හොරු හඳුනාගත යුතුය.

# අන් කවරදාටත් වඩා ඇවැසි සහෝදරත්වය

ජූලි 23 ලාංකේය ඉතිහාසයේ අඳුරු වූ දිනයක් බවට පත් විය. එය "කළු ජූලිය" ලෙස නම් කෙරුණි. ඒ 1983 ජූලියේදී සිදු වූ සිංහල දෙමළ කොලාහලය නිසාවෙනි. එයින් තීව්‍ර වූ විරසකය නිමාවූයේ වසර 30ක යුද්ධයකිනි. ඉන් සිංහල දෙමළ තරුණ තරුණියන් දහස් ගණනකින් ලාංකේය භූමිය ලෙයින් තෙත් කළෝය. මිල කළ නොහැකි තරම් ජීවිත හා දේපළ අප මාතෘභූමියට අහිමි විය. යුද්ධය අවසන් වූවත් ජාතිවාදයෙන් තුවාල වූ සිත් යළි සුව කිරීමට පැවැති ආණ්ඩු සහ නායකයින් සමත් නොවීමට ඉතා කණගාටුදායකය.








එවැනි වටපිටාවක් තුළ යුද්ධය අවසන් වීමටත් පෙර සමාජවාදී තරුණ සංගමය විසින් මෙරට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ ජනයාගේ සහෝදරත්වය වර්ධනය කිරීමේ අටියෙන් යුතුව එම කාර්යබාරයට අඩිතාලම දැමූහ. ඒ 2008 ජූලි මස 23 වැනි දිනයි. එතෙක් මෙතෙක් ලාංකේය ඉතිහාසය තුළ ලිය වූ කළු දිනය හෙවත් කළු ජූලියේ දිනය "සහොදරත්වයේ දිනය" ලෙස සමාජවාදී තරුණ සංගමය විසින් නම් කරන ලදී.

2008 වසරෙන් ඇරඹු එම වෑයම වසර 11 පුරා නොනවත්වා පවත්වෙමින් තිබේ. මෙරට සිංහල, දෙමළ මුස්ලිම් බර්ගර් හා මැලේ ජනතාවගේ සහෝදරත්වය, එකිනෙකාගේ විශ්වාසය හා අන් සංස්කෘතීන්ට ගරු කරමින් ජීවත්වන්නේ කෙසේද යන්න අප ඒත්තු ගැන්වීමට උත්සහ දරුවෙමු. ඒ සඳහා විවිධ සංස්කෘතික වැඩසටහන්, සම්මන්ත්‍රණ, චිත්‍රපටි දර්ශන, සාහිත්‍ය උළෙලවල්, ක්‍රීඩා තරඟාවලි, නාට්‍ය වැඩසටහන්, චිත්‍ර ප්‍රදර්ශන ආදී තවත් බොහෝ දේ විය. මෙයින් ඔබ්බට ගොස් ගම්මාන වැඩසටහන් වසර කිහිපයක් තුළම සිදුකෙරිණි. ඒ විටෙක වවුනියාව, විටෙක යාපනය, විටෙක ත්‍රිකුණාමලය ආදී දිස්ත්‍රික්කවල තෝරාගත් ගම්මානවල සහෝදරත්වයේ කඳවුරු බඳිමිනි. ඒ මෙරට ජනයාගේ අනාගතය සුරක්ෂිතව පවතින්නේ ජාතික සමගිය ගොඩනැගීමෙන් පමණක්ය යන උත්තුංග අරමුණ නිසාවෙනි.

කෙසේ වෙතත් ඉතිහාසයෙන් අප ඉගෙන ගන්නේ යළි වැරදි සිදුනොකරන්නටයි. නමුත් නැවතත් අපි ඉතිහාසයේ පිටුපසට ගමන් කරමින් සිටින්නෙමු. ඒ බව පසුගිය අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසු තහවුරු වෙමින් තිබේ. 83 කළු ජූලිය අප රට වසර 30ක යුද්ධයකට ඇද දැමුවේය. ගණන් කළ නොහැකි දේපළ, ජීවිත අපට අහිමි විය. ආර්ථික වශයෙන් වසර ගණනාවක් රට ආ පස්සට ගියේය. ඒ මතකයන් වියැකෙන්නටත් මත්තෙන් යළිත් එවැනිම බේදවාචකයන්ට අපි මුහුණ දෙමින් සිටිමු. ඉතාමත් සුළුතරයක් වන අන්තවාදී හා ජාතිවාදීන්ටත් බලලෝභී දේශපාලඥයන්ටත් තම පටු අරමුණු ඉටු කරමින් අති බහුතරයක් දෙනාගේ ජීවිත අනතුරේ දැමීමට අප ඉඩ දිය යුතුද? නැත. ඒ සඳහා ලාංකේය තරුණ අපට ඉතා විශේෂ වගකීමක්ද ඇත.

එවැනි වටපිටාවක් තුළ සමාජවාදී තරුණ සංගමය ලෙස අප මෙවරද "සහොදරත්වයේ දිනය" පැවැත්වීමට සූදානම්ව සිටින්නෙමු. ඒ සඳහා අප විසින් වැඩසටහන් රාශියක් සංවිධානය කර ඇත. රටේ සෑම දිස්ත්‍රික්කයක් තුළම තෝරාගත් ගම්මානවල ජාතික සමගි වැඩසටහන් පැවැත්වීමට සූදානම් කර ඇත. ජනතාව දැනුවත් කිරීම් සංස්කෘතික වැඩසටහන් ක්‍රීඩා වැඩසටහන්, චිත්‍රපටි හා නාට්‍ය වැඩසහන් ආදිය මින් කිහිපයකි. මෙවර සහෝදරත්වයේ දින ප්‍රධාන වැඩසටහන ජූලි 23 කොළඹදී පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර එහි දී දේශන, විරෝධතා, සංස්කෘතික වැඩසටහන්, වීදි නාට්‍ය ආදී වැඩසටහන් පැවැත්වීමට සූදානම් කර ඇත.

ඉදින් ලාංකේය භූමිය තුළ ජීවිත් වන සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අතර සමගිය ගොඩනැගීමේ නොනිමි අභියෝගය ජයගැනීම සඳහා එකම ලේ බැම්මකින් බැඳි ශක්තිමත් ශ්‍රී ලාංකික සමාජයක් ගොඩනැගීමේ ප්‍රමුඛ කාර්යයක් අන්කවරදාටත් වඩා අවැසි යුගයකි. ඒ සඳහා ශ්‍රී ලාංකේය තාරුණ්‍යයට අත්නොහළ හැකි භාරදූර වගකීමක් හෙට දවසේ දී ඇත.

## ඈ ගියේ ඩුබායි

හතර වටේ කරක්ගහල
අතට සතේ හොයාගන්න
දරු පැටවුන් බලාගන්න
බැරිව උන්ට කන්න දෙන්න
මිනිහ නැති ගෙදර තියල
කිරිඅම්මව ළඟින් තියල
හැමටම කියල බායි
ඈ ගියේ ඩුබායි..
ඇණ ගහලා
ඔළු පලලා
අත් කපලා
කකුල් කපලා
ගෑනු එද්දිත්
හැමටම කියල බායි
ඈ ගියේ ඩුබායි..
උන්ගෙ කුණු හෝදලා
ලැට් පෝච් අතුල්ලා
උය උයා කවලා
ගෙදර උන්ට හෙටක් දෙන්න
අකුරු කරලා රට හදන්න
දරුවට හරි පාර කියන්න
හැමටම කියල බායි
ඈ ගියේ ඩුබායි...
හොයපු ඩිරාම් පනම
එවලා ගෙදර වියදමට
කිරිඅම්ම මැරුණු දා
ඈ ආවෙ ගෙදර
අඬ අඬා කීවම මළගෙදර...
අම්මා නැතිවුන්ට
කිරිඅම්මා අම්මා වුන..
කිරි නැතිව අඬපු උන්ට
අද නුඹ අම්මා වුන ..
හෙට කන්නෙ කෝමද
අකුරු කරන්නෙ කෝමද..
ආයෙමත් කරගහගෙන
දරු කැක්කුම දරාගෙන
අප්පා නැතිවුන්ට අප්පා නුඹය..
රටටම ණය ගෙවපු
රටම ණය නුඹට
රස්සාවක් නැතුව
හතර වටේ කරක් ගහපු
හැමටම කියල බායි
ඈ ගියේ ඩුබායි..

**- බුද්ධික සම්පත් -**

### ඉවතලන ප්ලාස්ටික්වලින් සපත්තු



ඉන්දියාවේ පිහිටි කර්මාන්තශාලාවක් මගින් ඉවතලන ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කර සපත්තු ඇතුළු විවිධ නිෂ්පාදන සඳහා ලබා දෙන බවට වාර්තා වේ. ඔවුන් දිනකට ප්ලාස්ටික් බෝතල් මිලියන 2 ක් ප්‍රතිචක්‍රීකරණය කර ඒවා පොලිපෙප්ටයිඩ බවට පත් වූ ප්ලාස්ටික් අමුද්‍රව්‍ය නිපදවනු ලබයි. ඔවුහු ඒවා ක්‍රීඩා සපත්තු නිෂ්පාදන සමාගම් ඇතුළු නිෂ්පාදන ආයතනවලට සපයති. සුප්‍රසිද්ධ අඩිඩාස් සමාගමද ඔවුන්ගේ එක් ගැනුම්කරුවෙකි. මේ හරහා ලෝකයේ ප්ලාස්ටික් අර්බුදය විසඳිය හැකි බවට ඔවුහු විශ්වාසය පළ කරති.

### ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය සංචාරකයන්ට විවෘතයි



පෘථිවි කක්ෂය මත පිහිටි ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය 2020 වන විට සංචාරකයන්ට විවෘත කරන බව නාසා ආයතනය පවසයි.
ඒ අනුව එක් සංචාරයක් දින 30 කින් යුත් අතර ඒ සඳහා අයකරන මුදල එක්සත් ජනපද ඩොලර් මිලියන 58ක් එනම් ශ්‍රී ලංකා රුපියල් කෝටි 1,032ක පමණ අගයක් ගනී. කෙසේ වෙතත් ඇමරිකා එක්සත් ජනපද රජය වසර 2024 සිට මෙම මධ්‍යස්ථානය වෙත ලබා දෙන සහයෝගය අත්හිටුවීමට තීරණය කිරීමත් සමඟ මෙම සංචාරක වැඩපිළිවෙළ සංවිධානය වී ඇත.

### රතු කැට සොයන මියන්මාර ජනතාව



මියන්මාරයේ මන්ඩලේහි මොන්ගොක් රතු කැට නිධියට හිමිදිරි පාන්දරම ජනතාව ආයුධ රැගෙන පැමිණෙන්නේ රතු කැට ඇතුළු වෙනත් වටිනා මැණික් වර්ග සෙවීමටය. පිරිසක් රතුකැට ගරන අතර පිරිසක් අඩිගාණක් පොළව යටට කපා ඇති දෝන තුළින් පස් ගොඩට එවීම සිදුකරති.
සෑම දිනකම ගැනුම්කරුවෝද මෙම මැණික් වර්ග මිලදී ගැනීමට පැමිණෙන බව වාර්තා වේ.

### උකුස්සන් සඳහා රෝහලක්



එක්සත් අරාබි එමීරයේ අබුඩාබි නුවර උකුස්සන් සඳහාම වෙන් වූ ලොව විශාලතම රෝහල පිහිටුවා ඇත. අරාබි ගල්ෆ් කලාපීය රටවල සුරතලයටත්, සතුන් දඩයම් කිරීමටත් හා පවුල්වල රැකවලා ලෙසත් අති කරන පක්ෂි විශේෂයක් ලෙස උකුස්සන් හඳුනාගත හැක.
මෙහි ප්‍රතිකාර කිරීමට අමතරව පර්යේෂණ හා පුහුණු කිරීමද සිදු කරයි.

# ආලෝකමත් අනාගතයකට කැමති හැමෝටම
# නව ජනතා මධ්‍යස්ථානයට ආරාධනා කරනවා



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්
**ටිල්වින් සිල්වා සහෝදරයා**

***නියමුවා:- මේ දිනවල ජ.වි.පෙ. ආණ්ඩුව ඉල්ලා අස්වනු කියලා උද්ඝෝෂණයක් පටන් අරන් තියෙනවා. ඇයි මේ හදිස්සියේ?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** නැහැ කිසිම හදිසියක් නැහැ. දැන් මේ ආණ්ඩුවට වයස අවුරුදු හතර හමාරක්. ගෙවුණු කාලය පුරා ආණ්ඩුව සෑම ක්ෂේත්‍රයකම අසමත් වෙලා ඉන්නේ. රටත් ජනතාවත් ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණු කිසිම දෙයක් කරන්න ආණ්ඩුව සමත්වෙලා නැහැ. අඩුම තරමේ මහජනතාවගේ ආරක්ෂාව සලසන්නවත් ඔවුන් සමත් නැහැ. ඔවුන් ජනතාවගේ ජීවිතවලට වගකියන්නේ නැහැ. මේ ආණ්ඩුව රට අරාජික කරලා තියෙන්නේ. ඒ නිසා රටත් ජනතාවත් අනාරක්ෂිතභාවයට පත්කළ, රට අරාජික කළ මේ ආණ්ඩුව තව වසරක් රට පාලනය කිරීම අනතුරුදායකයි. අපි ආණ්ඩුවට ඉල්ලා අස්වෙන්න කියලා කියන්නේ ඒ පදනම මතයි.

***නියමුවා:- ඔබ අදහස් කරන්නේ ආණ්ඩුව රට වෙනුවෙන් කිසිම දෙයක් කරල නැහැ කියන එකද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔව්, ඉතාම පැහැදිලිව මේ ආණ්ඩුව රටට හෝ ජනතාවට හොඳක් වන කිසිම දෙයක් ආණ්ඩුවේ කැමැත්තෙන් කරලා නැහැ. දින 100 කාලේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පියවර කිහිපයක් තියාගන්න අපට පුළුවන් වුණා. 19වැනි සංශෝධනය, තොරතුරු දැනගැනීමේ පනත වගේ. ඒත් ඒවා ආණ්ඩුව කළේ නොකර බැරි නිසා. ජනතාවගේ හා ප්‍රගතිශීලී කණ්ඩායම්වල බලපෑම නිසා. ආණ්ඩුව ලවා ඒ දේවල් කරගන්න සිද්ධ වුණේ "බල්ල නාවන්න ගෙනියනව" වගේ අමාරුවෙන්. ඒවත් කළේ බාගෙට.

අනෙක් අතට ආණ්ඩුව වංචා දූෂණ නවත්වන්නත් ඒවට සම්බන්ධ හොරුන්ට දඬුවම් දෙන්නත් පොරොන්දු වුණා. ඒත් ආණ්ඩුව බැඳුම්කර වංචාව ඇතුළු මූල්‍ය වංචා හා දූෂණ රැසකට සම්බන්ධ වුණා. පසුගිය ආණ්ඩුවේ එකම දූෂකයෙක්ටවත් දඬුවම් දෙන්න තාම බැරිවුණා. ආණ්ඩුව දූෂකයන්ට දඬුවම් දෙනවා වෙනුවට තනතුරු දුන්නා. වෙඩි නොවදින වාහන ගෙනත් දුන්නා. ආණ්ඩුව ආර්ථිකය හැදුවේ නැහැ. වැට්ටුවා. ණය බර වැඩිකළා. රටේ සම්පත් වික්කා. හම්බන්තොට වරාය, කොළඹ වරායේ නැගෙනහිර ජැටිය බදු දුන්නා. තව විකුණන්න හදනවා. මහජන බැංකුව පෞද්ගලීකරණය කරන්න හදන්නේ. රටට හානිකර ගිවිසුම් අත්සන් කළා. තවත් අත්සන් කරන්න හදනවා. මේ ආණ්ඩුව බංකොළොත් නව ලිබරල්වාදය තුළ රට විනාශයට රැගෙන යමින් ඉන්නේ. අඩුම ගණනේ මේ ආණ්ඩුවට වළක්වන්න පුළුවන්කම තියෙද්දී මිනිස් ජීවිත රැසක් විනාශ වීම නතර කරගන්න බැරි වුණා. ජාතිවාදය පරදන්න හෝ ජාතික සමගිය හදන්න බැරි වුණා. තනි වචනයෙන් ගත්තොත් ආණ්ඩුව රට පාලනය කළේ නැහැ. විනාශය කරා ගෙන ගියා. ඒ නිසා තවත් බලා නොසිට ආණ්ඩුව ගෙදර යැවිය යුතුයි. එයයි අපේ උත්සාහය.

***නියමුවා:- ජ.වි.පෙ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන ආණ්ඩුවට එරෙහි විශ්වාසභංග යෝජනාවේ වත්මන් තත්වය කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඒක මේ ජූලි මාසයේ මුල් සතියේ විවාදයට ගන්නවා. අපි කියනවා, පාර්ලිමේන්තුවේ ඉන්න රනිල් විරෝධී හා ආණ්ඩු විරෝධී සෑම දෙනාටම ඒකට සහාය දෙන්න කියලා. පාර්ලිමේන්තුවේ ඉන්න ඇත්ත ආණ්ඩු විරෝධීන්ගේ සැබෑ තත්වය විශ්වාසභංගයේදී අපට බලාගන්න පුළුවන් වෙයි.

***නියමුවා:- ජ.වි.පෙ. ආණ්ඩුවට ඉල්ලා අස්වන්න කියලා ආණ්ඩුව ඉවත් වුණාම කවුද බලයට එන්නේ? මේක රාජපක්ෂවරුන්ට නැවත බලයට එන්න පාර කැපීමක් කියලා කෙනෙක් කිව්වොත්?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** නැහැ, අපේ රටේ ජනතාව නැවත ඒ මෝඩකම කළ යුතු නැහැ. රාජපක්ෂවරුන්ට නැවත බලය දිය යුතු නැහැ. මේ දෙගොල්ලම එකම වර්ගයේ අය. එකම පංතියේ අය. ඒ නිසා තමයි අගමැතිවරයා විපක්ෂ නායකයාට වෙඩි නොවදින අති සුඛෝපභෝගී වාහනයක් අරන් දෙන්න කෝටි 05ක් වෙන් කරන්නේ. මේ අය දවල්ට රණ්ඩු වෙලා රෑට එකට හොරකමේ යන හොර කල්ලියක්. ඒ නිසා මේ ආණ්ඩුවට විකල්පය මහින්ද රාජපක්ෂ කණ්ඩායම නොවෙයි. ඔවුන්ට මේ රටේ කිසිම ප්‍රශ්නයක් විසඳන්න බැහැ. බල ලෝභය හා පවුල්වාදය පමණයි ඔවුන්ට තියෙන්නේ.

***නියමුවා:- ඒක එහෙම නම් විකල්පය වෙන්නෙ මොකක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඉතා හොඳ ප්‍රශ්නයක්. මේ ආණ්ඩුව ගෙදර යවන්න කටයුතු කරන ගමන්ම, ඒ සඳහා මහ පාරේ ජනතාව එක්ක උද්ඝෝෂණ කරන ගමන්ම අපි මේ ආණ්ඩුවත් වසර 71ක මේ ක්‍රමයටත් විකල්ප මහජන ව්‍යාපාරයක් ගොඩනගනවා. මේ ආණ්ඩුව පරදවලා බලයට පත් කළ යුතු විකල්ප වැඩපිළිවෙළක් සහිත මහජන ව්‍යාපාරයක්, ජනතා මධ්‍යස්ථානයක් අපි මේ මාසය තුළම ගොඩනගනවා. අපි ජනතාවගෙන් ඉල්ලනවා වසර 71ක තට්ටු මාරු දේශපාලනය වෙනස් කරලා අලුත් දේශපාලන ගමනකට පෙළගැසීම සඳහා එම ජනතා ව්‍යාපාරය සමග එකතු වෙන්න කියලා.

***නියමුවා:- මේ ගොඩනගන මහජන ව්‍යාපාරයට මේ රට ගොඩනගන්න පුළුවන් වෙයිද? ඒකට එතරම් හැකියාවක් බලයක් තියෙනවද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** පැහැදිලිවම ඔව්. අපි කවුරුත් එකතුවෙලා මේ හදන්න යන්නේ තවත් මැතිවරණ සන්ධානයක් නොවෙයි. මේක රට වෙනස් කිරීම සඳහා ප්‍රතිපත්ති සහිත, එවැනි දේශපාලන සංවාදයක් ගොඩනැගිය හැකි රටේ දේශපාලන සංස්කෘතිය සාධනීය පැත්තට හරවන්න සූදානම්, බලය ලබාගැනීම වෙනුවෙන් කටයුතු කරන, ජනතාව සමග බිම් මට්ටමේ සිට වැඩ කරන පුළුල් හා දිගුකාලීන දේශපාලන ව්‍යාපාරයක්. පසුගිය කාලය පුරා අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නවලදී මානව හිමිකම් පිළිබඳ, ජාතික සමගිය පිළිබඳ ප්‍රශ්නවලදී ඒ වෙනුවෙන් ක්‍රියාකාරී වුණු දේශපාලන සංවිධාන හා විද්වත් වෘත්තික සංවිධාන රැසක් මේ ජනතා මධ්‍යස්ථානය ගොඩනැගීමට දායක වෙමින් ඉන්නවා.

අපේ රට යහපත් දිශාවට වෙනස් කළ හැකි වමේ, ප්‍රගතිශීලී දේශප්‍රේමී හා මානවවාදී සංවිධාන හා පුද්ගලයන් රැසක් මේ ව්‍යාපාරය සමග දැනටමත් සම්බන්ධ වෙලා ඉන්නවා. **ඇත්තටම අපේ රට හදනවනම් ඒක හදන්න ඕන තරම් බුද්ධිමය, අධ්‍යාත්මික හා ක්‍රියාකාරී බලවේගය තියෙන්නේ මෙතැන. අපේ රටේ, අපේ සමාජයේ හොඳම සාරය හොඳම ගුණය තියෙන්නේ මෙතන කියල බය නැතිව කියන්න පුළුවන්. අපේ රටේ තනතුරු පිටුපස ගියේ නැති සැබෑ ලෙසම වමේ වෙනසක් ගැන හිතන වමේ චින්තනයක් සහිත අය, සංවිධාන මේ ව්‍යාපාරය තුළ ඉන්නවා. ඒ වගේම ජ.වි.පෙ. අපිත් ඉන්නවා. ඒ වගේම අපේ රටේ ආණ්ඩුවල තනතුරුවලට තම දැනුම හා හැකියාව පාවා නොදුන් ප්‍රගතිශීලී හා දේශප්‍රේමී විද්‍යාර්ථයින්, උගතුන්ගෙන් සමන්විත විද්වත් සංවිධාන, වෘත්තික සංවිධාන මේ තුළ අඩංගු වෙනවා. අපේ රටේ නිර්මාණශීලී කලාකරුවෝ, මාධ්‍යවේදීන්, පරිසරවේදීන්, සමාජ අසාධාරණයට එරෙහිව සටන් වදින විවිධ කණ්ඩායම් මේ තුළ ඉන්නවා.** ඔවුන් හැමෝම නිර්මාණශීලී අය. අලුත් අදහස් තියෙන අය. තමන්ගේ කාර්යයට අවංක වෙන අය. ඒ නිසා අපි හදන ජනතා ව්‍යාපාරයේ ආධ්‍යාත්මය හා බුද්ධිය ඉතා පොහොසත් එකක්. ඒ වගේම ඒක ප්‍රගතිශීලී එකක්. එවැනි සංවිධානයකට රටේ ලොකු වෙනසක්, ලොකු පෙරළියක් කරන්න පුළුවන් කියල අපි දැඩිව විශ්වාස කරනවා.

***නියමුවා:- හොඳයි, ඔබ කියන විදිහට මේ කටයුතු සිද්ධ වෙන්නේ කොහොමද? කවදද? ඉදිරි ජනාධිපතිවරණයට ජ.වි.පෙ. සූදානම්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මම කලින් අවධාරණය කළා වගේම මේ මහජන ව්‍යාපාරය අපි ගොඩනගන්නේ ජනාධිපතිවරණය සඳහා නොවෙයි. රට වෙනස් කිරීමේ දිගුකාලීන අරමුණක් වෙනුවෙන්. ඒත් ජනාධිපතිවරණය ආවොත් මේ සංවිධානය සංවිධානයක් ලෙස එයට මුහුණ දේවි. ඒ සඳහා මෙම මහජන ව්‍යාපාරය නියෝජනය කරන ප්‍රබල අපේක්ෂකයෙකු ඉදිරිපත් කරනවා.

අනෙක් අතට අපි පක්ෂයක් ලෙස මෙම ජනතා මධ්‍යස්ථානය ගොඩනගන්න අපේ පැත්තේ දායකත්වය උපරිම ලෙස ලබා දෙනවා. ඒ අනුව අපි පැහැදිලිවම මේ මාසයේ මැද වනවිට මේ මධ්‍යස්ථානය නිල වශයෙන් පිහිටුවා අගෝස්තුවලදී එය එළිදැක්වීමේ දැවැන්ත මහජන රැලියක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අතර අපි පක්ෂයක් විදිහට ආණ්ඩුවට ඉල්ලා අස්වන ලෙස බලකරන උද්ඝෝෂණ මාලාව පුළුල් කරමින් ඉදිරියට ගෙනයනවා. මේ ජූලි 7-8 දිනවල අපි ඒ වෙනුවෙන් දැවැන්ත පා ගමනක් හා රැලියක් පවත්වනවා. එක් පසෙකින් ආණ්ඩු විරෝධී උද්ඝෝෂණයත් අනෙක් පසින් ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීමත් යන ප්‍රධාන

15 වැනි පිටුවට

> අපේ රටේ, අපේ සමාජයේ හොඳම සාරය හොඳම ගුණය තියෙන්නේ මෙතන කියල බය නැතිව කියන්න පුළුවන්. අපේ රටේ තනතුරු පිටුපස ගියේ නැති සැබෑ ලෙසම වමේ වෙනසක් ගැන හිතන වමේ චින්තනයක් සහිත අය, සංවිධාන මේ ව්‍යාපාරය තුළ ඉන්නවා. ඒ වගේම ජ.වි.පෙ. අපිත් ඉන්නවා. ඒ වගේම අපේ රටේ ආණ්ඩුවල තනතුරුවලට තම දැනුම හා හැකියාව පාවා නොදුන් ප්‍රගතිශීලී හා දේශප්‍රේමී විද්‍යාර්ථයින්, උගතුන්ගෙන් සමන්විත විද්වත් සංවිධාන, වෘත්තික සංවිධාන මේ තුළ අඩංගු වෙනවා. අපේ රටේ නිර්මාණශීලී කලාකරුවෝ, මාධ්‍යවේදීන්, පරිසරවේදීන්, සමාජ අසාධාරණයට එරෙහිව සටන් වදින විවිධ කණ්ඩායම් මේ තුළ ඉන්නවා.

# රට පාවාදෙන ගිවිසුම්වලට එරෙහිව

ආණ්ඩුව කුමන හෝ කාරණයක් පදනම් කර ගනිමින් වෙනත් රටක් සමග ගිවිසුම් ගත වූවායැයි සැල වූ පමණින් අවිඥානිකව හෝ මතකයට එනු ලබන්නේ වංචනික හෝ රටට අහිතකර යමක් එය තුළ ගැබ් වී ඇති බවය.

මෑත ඉතිහාස ගතහොත් එනම් චන්ද්‍රිකා බණ්ඩාරණායක, මහින්ද රාජපක්ෂ, මෙන්ම වත්මන් රනිල් -මෛත්‍රී වකවානුව තුළද වෙනත් රටවල් සමග විශේෂයෙන් බලවත් රටවල් සමග ඇති කර ගත් ගිවිසුම් සියල්ලම පාහේ රටේ ජනතාවගේ ඇස් වසා අවම වශයෙන් කැබිනට් මණ්ඩලයට පවා රහසේ අත්සන් තබා ඇත.

මේ පිළිබඳව "රට විකුණන,රට පාවා දෙන ගිවිසුම් එපා" යන තේමාව යටතේ පසු ගිය ජුනි 11වැනිදා ජනතා විමුක්ති පෙරමුණ විසින් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. එහි ප්‍රධාන දේශනය ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා විසින් පැවැත්වූ අතර එම අවස්ථාව සඳහා සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයේ ලේකම් චන්ද්‍රසිරි මහගමගේ, අන්තර් සමාගම් සේවක සංගමයේ ලේකම් නීතිඥ ජානක අධිකාරි යන සහෝදරවරුන්ද සහභාගී වී සිටියහ. මෙම සම්මන්ත්‍රණය කොළඹ සේවා මුක්ත හට කණ්ඩායම් ශාලාවේදී පැවැත්වුණි.

මෙම සම්මන්ත්‍රණයේදී කොළඹ වරායේ නැගෙනහිර ජැටිය ඉන්දියාවට සහ ජපානයට පවරාදීම, ඇක්සා , සෝෆා වැනි ගිවිසුම් මගින් ඇමරිකාවේ යුදමය කටයුතු සඳහා මෙරට භාවිතා කිරීමට ඉඩ සැලස්වීම, එසේම චීනයද නව ආරක්ෂක ගිවිසුම්වලට එළඹෙමින් සිය හමුදාමය මැදිහත් කිරීම් මෙරට තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම ආදී කාරණා මෙහිදී අවධාරණය ලක්කෙරුණි.

මේ තේමාව යටතේම සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා පසුගිය ජුනි 21වැනිදා මහනුවරදීද, බිමල් රත්නායක සහෝදරයා ජුනි 27 ගාල්ල නගරයේද සම්මන්ත්‍රණ පැවැත්වූහ.




# ආණ්ඩුවට එරෙහි සම්මන්ත්‍රණ, උද්ඝෝෂණ මාලාවක්




කුමන්ත්‍රණකාරී ලෙස අග්‍රාමාත්‍ය ධූරය ලබා ගැනීමට උත්සහ කළ මහින්ද රාජපක්ෂ එය ව්‍යර්ථ වීමෙන් පසු ලැබුණු විපක්ෂ නායක ධූරය හොබවමින් ද ආණ්ඩුවෙන් ලැබෙන සියලු වරප්‍රසාද හා වරදාන භුක්ති විදිමින්ද සිටින මොහොතක ඉතිහාසයේ තීරණාත්මක කඩඉම්වලදී ඉටු කරන ලද සේම සැබෑ ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ ජනතා විමුක්ති පෙරමුණ විසින් ආරම්භ කර ඇත.

අප්‍රේල් 21 ප්‍රහාරය වළක්වා ගත හැකිව තිබියදීත් ජනාධිපතිවරයා සහ අගමැතිවරයා මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම පසෙක තබා තමන්ගේ ආරක්ෂාව පමණක් තහවුරු කරගත්තේය. එසේම ජාතික සම්පත් විකිණීම මෙන්ම රටේ ස්වාධීනත්වයට හා ස්වෛරීත්වට හානිකර ගිවිසුම්වලටද කිසිදු චකිතයන් තොරව එළඹෙන ලදී.

මේ සියල්ල සැලකිල්ලට භාජනය කරමින් "රට අරාජික කළ, මහජන ආරක්ෂාව බිලිදුන්, ආණ්ඩුව වහා ඉල්ලා අස්වනු!" යන සටන් පාඨය යටතේ ජ.වි.පෙ. විසින් පසු ගිය ජුනි 12වැනිදා කොළඹින් ආරම්භ කළ උද්ඝෝෂණ පා ගමන් සහ මහජන රැස්වීම් මාලාව ජුනි 21, 26 සහ 28 යන දිනයන්හි මාතර, පානදුර සහ අනුරාධපුරය යන නගරයන්හිද අතිසාර්ථකව පැවැත්විණි.

පානදුර නගරයේ පැවති උද්ඝෝෂණ පා ගමන සහ මහජන රැස්වීම ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

# ජාතික සමගිය වෙනුවෙන් රටට වැඩපිළිවෙළක්

ඉස්ලාම් ආගමික අන්තවාදයේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය අප්‍රේල් 21වැනිදා ජීවිත රැසක් විනාශකරමින් සහ තවත් පිරිසක් ආබාධිතයන් කරමින් බෝම්බ මාලාවක් පුපුරා ගියේය. එසේ පිපිරීමෙන් මාසයකට පමණ පසු සිංහල බෞද්ධ අන්තවාදය ක්‍රියාත්මක වෙමින් මුස්ලිම් කඩ විනාශ කිරීම, එම භාණ්ඩ වර්ජනය, සිංහල මව්වරුන් වඳභාවයට පත් කළේයැයි පවසමින් එම වෛද්‍යවරුන් සොයා යෑම ආදී කාරණා පෙළගස්සන්නට විය. රාජපක්ෂ කල්ලිය මෙහි ප්‍රධාන භූමිකාවක් හෙබවූ අතර රනිල් වික්‍රමසිංහ මෙන්ම මෛත්‍රීපාල සිරිසේනත් එම ගැටුම් සමථයකට පත් කිරීම සඳහා කිසිදු දායකත්වයක් නොදැක්වීම කැපීපෙනුණි.

මේ පසුබිම තුළ නැගෙමින් එන ආගමික අන්තවාදයටත්, ජාතිවාදයටත් එරෙහිව ජාතික ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව මෙන්ම ජාතික සමගියත් තහවුරු කිරීම අරමුණු කරගනිමින් ජනතා විමුක්ති පෙරමුණේ විශේෂ යෝජනා මාලාවක් පසුගිය ජුනි 04 වනදා කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ජනගත කෙරුණි. පවතින වාතාවරණයට විසඳුම් වන යෝජනා මාලාවක් ඉදිරිපත් කළ එකම දේශපාලන පක්ෂය වූයේද ජනතා විමුක්ති පෙරමුණ පමණි.

ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. දේශපාලන බල මණ්ඩල සභිකයින් වන විජිත හේරත්, ලාල්කාන්ත යන සහෝදරවරුන් මෙන්ම භික්ෂූන් වහන්සේලා, මුස්ලිම් සහ ක්‍රිස්තියානි පූජකතුමන්, විශ්වවිද්‍යාල ආචාර්යවරු සහ සිවිල් සංවිධාන නියෝජිතයෝ රැසක් සහභාගි වී සිටියහ.

මහජන ආරක්ෂාව, නීති ප්‍රතිසංස්කරණ, ආගමික ආයතන ප්‍රතිසංස්කරණය හා පරිපාලනය, අධ්‍යාපනය, ශ්‍රී ලාංකේය අනන්‍යතාවක් ඇති කිරීම සඳහා වන රාජ්‍ය ආයතන හා පොදු



ප්‍රතිසංස්කරණ, ජනමාධ්‍ය ආගමික වියතුන් සහ විශේෂ කාර්යභාරය යන ක්ෂේත්‍ර පිළිබඳව පුළුල් අධ්‍යයනයක යෙදෙමින් මෙම යෝජනා මාලාව සකස් කර තිබිණ.

# ජාතික ශිෂ්‍ය වීර දිනය අභිමානවත්ව සමරා




ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය යනු පාලක පංතියට රිසි පරිදි මෙහෙයවා ගැනීමට හැකි වූ ව්‍යාපාරයක් නොවේ. එය එසේ වූයේ එම ව්‍යාපාරය පිටුපස තිබූ දේශපාලන මඟ පෙන්වීම මෙන්ම එම අරමුණු වෙනුවෙන් තම ජීවිතය පවා කැපකිරීමට පසුබට නොවුණු සිසු විරුවන් සහ වීරවරියන් සිටි බැවිනි.

ජාතික ශිෂ්‍ය වීර දිනය යනුවෙන් දිනයක් පවා ඉතිහාසයට එක් වනු ලබන්නේ තමන්ගේ පෞද්ගලික වුවමනාවන් පසෙක දමා සමාජ පරිවර්තනයක් වෙනුවෙන් උර දුන් ඒ සිසු, සිසුවියන් වෙනුවෙනි.

සැබෑ ලෙසම ශිෂ්‍ය වීර දිනය සැමරිය හැක්කේ ඔවුන් පැතූ ලෝකය උදාකරගැනීම වෙනුවෙන් කටයුතු කරන ව්‍යාපාරයකට පමණක් බැවින් මේ මොහොතේ එම ශුද්ධ අයිතිය හිමිව ඇත්තේ සමාජවාදී ශිෂ්‍ය සංගමයට පමණි.

එම අර්ථයෙන් "ඔවුහු ඔබට අසීමිතව ප්‍රේම කළහ" යන තේමා පාඨය යටතේ පසු ගිය ජුනි මස 20වැනිදා ජාතික ශිෂ්‍ය වීර දින සැමරුම කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් මහත් අභිමානයෙන් යුතුව පවත්වන ලදී.

මෙහි ප්‍රධාන දේශනය ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා විසින් පැවත්වූ අතර මේ සඳහා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය, අන්තර් විශ්වවිද්‍යාල සේවා වෘත්තිය සමිතියේ විජේතිලක විජේසිංහ, මහා ශිෂ්‍ය සංගම් නියෝජිතයින් විශ්වවිද්‍යාල සිසුන් සහ පාසල් සිසුහු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

# රට යට කරන ණය උගුල හා බංකොලොත් ආර්ථිකයේ හෙට දවස

*(මුදල් අමාත්‍යාංශයේ 2018 වාර්තාව ඇසුරින්)*

2018 වසර සඳහා වන මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. 2003 මූල්‍ය කළමනාකරණ වගකීම් පනත අනුව රටේ වාර්ෂිකව ඇති මූල්‍ය තත්වය පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු වේ. ආණ්ඩුවේ දේශපාලන ලොක්කන් රටේ ආර්ථිකය පිළිබඳව කුමන කයිවාරු ගැසුවද ඇත්ත තත්වය වැසිය නොහැකි බව මුදල් අමාත්‍යාංශය 2018 වසරටද ඉදිරිපත් කර ඇති මෙම වාර්තාවෙන් හෙළිදරව් වේ.

## ජනරජයේ බංකොලොත් ගිණුම

ශ්‍රී ලංකා ජනරජයේ මූල්‍ය **තත්වය පිළිබඳව ප්‍රකාශයට අනුව 2018 දෙසැම්බර් 31 දිනට රටේ ඇති මුළු වත්කම රු. බිලියන 1911 කි. (ට්‍රිලියන 1.9කි.) රු. කෝටිවලින් රු. කෝටි 191,161 කි. නමුත් එදිනට මුළු වගකීම් රු. බිලියන 11,596කි. (ට්‍රිලියන 11.06) රු. කෝටිවලින් 11,59,639 කි. එනම් රටේ වත්කම මෙන් වගකීම හය ගුණයකි. අවුරුදු 71ක දේශීය ධනපති පංතියේ පාලනයේ 2018 දෙසැම්බර් 31 වන විට තර්කානුකූල යථාර්ථය එයයි.** මාරුවෙන් මාරුවට ජනතාව විසින් රට පාලනය බාරදුන් හා බාරගත් දුබල ධනපති පක්ෂ කිහිපයක හවුල් ආණ්ඩු අවසානයේ රටට උරුම කරදී ඇති ප්‍රතිඵලය රටේ මුළු වත්කම මෙන් හය ගුණයක් වගකීම් වැඩි බංකොලොත්භාවයට රට ඇද දැමීමයි.

රටක වත්කම හා වගකීම අතර පරතරය සැසඳීමේදී තවත් වැදගත් සාධකයකි, රටේ අරමුදල්වල ඇති වත්කම් ප්‍රමාණය. රටක මූල්‍ය නොවන වත්කම් මෙන්ම මූල්‍යමය වත්කම්වලට අමතරව ඒකාබද්ධ අරමුදල, විවිධ රජයේ අරමුදල්, අවිනිශ්චිත අවස්ථා අරමුදල, විදේශ ණය චක්‍රීය අරමුදල වැනි අරමුදල්වල ඇති තරම් අරමුදල් තිබේ නම් ඒ රට වගකීම ලෙස ණය ගැනීමට බිය විය යුතු නැත. ණය පියවීමට අරමුදල් ප්‍රමාණවත් වන්නේ නම් මූල්‍ය වත්කමක් තරමටම අරමුදල් හරහාද ආර්ථිකය සුරක්ෂිතය. දැන් ලංකාවේ අරමුදල් තත්වය කවරාකාර වන්නේද? ඒකාබද්ධ අරමුදල රු. බිලියන 303ක් (රුපියල් කෝටි 30,394ක් පමණ) සෘණ මට්ටමේය. එය පසුගිය වසරට වඩා සෘණ අගය වැඩිවීම යනු රටේ භාණ්ඩාගාරයට දෛනිකව ලැබෙන ආදායම පසුගිය වසරට වඩා මේ වසරේදී පහළ බැස ඇති බවයි; දෛනික කටයුතු පවත්වාගෙන යාමටවත් මුදල් නොමැති බවයි. ඉදිරියේදී රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් හා වැටුප් ගෙවීම අර්බුදයක් මට්ටමට පත්වීමේ අනතුරට රට පත්ව ඇති බවට මෙය කදිම සාක්ෂියකි.

## ණය ගැන විගණකාධිපති මතය

අලුතින් පාර්ලිමේන්තුවේ සම්මත කළ ජාතික විගණන පනතට අනුව මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනය (රටේ මුදල් වාර්තාව) පිළිබඳව රජයේ විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණද එම වාර්තාව සමගම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. මෙවර ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ රාශියක් අතර වැදගත්ම කරුණු ඉදිරිපත් කර ඇත්තේ රටේ ණය තත්වය පිළිබඳවය.

විගණකාධිපතිගේ මතය අනුව 2003 මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත අනුවද රටේ පැවතිය හැකි මුළු බැරකම් (වගකීම්) ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් 80%ක් නොඉක්මවිය යුතුය. එය නීතිමය අවශ්‍යතාවයකි. රජය කර ඇත්තේ (රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය) රජයේ බොහෝ ණය, මූල්‍ය ප්‍රකාශවලින් බැහැර කර වෙනම පෙන්නුම් කර තිබීමයි. එයින් 80% උපරිමය ණය සීමාව නොඉක්මවන බව පෙන්වීමට ගණිතමය උපක්‍රමයක් යොදා ඇත. එසේ සිදු කළද 2018 වනවිට ගෙවීමට ඇති රජයේ මුළු ණය වගකීම රු. බිලියන 12,461කි. (රු කෝටි දොළොස් ලක්ෂ 46,100කි) එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 87.75%ක ප්‍රතිශතයකි. (දළ දේශීය නිෂ්පාදිතය බිලියන 14,200කි).

මෙම ණය තොගයට අමතරව භාණ්ඩාගාරයේ ඇප වීම මත රාජ්‍ය ව්‍යාපාර විසින් බැංකුවලින් සෘජුව ලබා ගෙන ඇති (රජයම ගෙවිය යුතු) රාජ්‍ය ණය රු. බිලියන 829ක් සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල ඇතුළත් තවත් බිලියන 213ක් මෙම මුළු ණය එකතුවට ඇතුළත් කර නැත. එම ප්‍රමාණයද ඇතුළත් කළ විට රටේ සමස්ත ණය ප්‍රමාණය මේ වනවිට රු. බිලියන 13,503ක් (රු. කෝටි 13,50,300ක්) වේ. එවිට එම ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 95%කි.

මෙම ගිණුම්වල ඇතුළත් නොකරන ලද ණය ගැන වන විගණකාධිපතිගේ පැහැදිලි කිරීම්වල අපූරු සංඛ්‍යා හෙළිදරව් කිරීම් කිහිපයක්ම තිබේ. ඉන් එක් කරුණක් වන්නේ, රජයේ ගිවිසුම් ගත විදේශ ණය ගිවිසුම් 8ක 2018.12.31 දිනට පැවැති රු. මිලියන 366,126ක් (රු. කෝටි 36,612ක්) ණය මුදල් රජයේ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව නොතිබීමයි. උදාහරණයක් ලෙස රාජපක්ෂ පාලන යුගය තුළ රජය විසින් හම්බන්තොට වරාය ඉදිකිරීමට ලබාගත් ණයවලින් තවත් මිලියන 172,517ක් (රු. කෝටි 17,251ක්) භාණ්ඩාගාරයේ හෝ වරාය අධිකාරියේ ගෙවිය යුතු ණය ලෙස ඇතුළත් නොවේ. ගිණුම් පොත්වලින් ගලවා රටට හැංගුවාට මෙම ණය නොගෙවා පැහැර හැරිය නොහැකිය. මෙලෙසම සූරියවැව ක්‍රීඩාංගණය ඉදිකිරීමට වරාය අධිකාරිය මහජන බැංකුවෙන් ලබා ගත් රු. මිලියන 3,950ක මුදල් පිළිබඳවද දැන් වගකිව යුත්තෙක් නැති තත්වයට පත්ව ඇත.

> මූල්‍ය තත්වය පිළිබඳව ප්‍රකාශයට අනුව 2018 දෙසැම්බර් 31 දිනට රටේ ඇති මුළු වත්කම රු. බිලියන 1911 කි. (ට්‍රිලියන 1.9කි.) රු. කෝටිවලින් රු. කෝටි 191,161 කි. නමුත් එදිනට මුළු වගකීම් රු. බිලියන 11,596කි. (ට්‍රිලියන 11.06) රු. කෝටිවලින් 11,59,639 කි. එනම් රටේ වත්කම මෙන් වගකීම හය ගුණයකි. අවුරුදු 71ක දේශීය ධනපති පංතියේ පාලනයේ 2018 දෙසැම්බර් 31 වන විට තර්කානුකූල යථාර්ථය එයයි.

### 2018.12.31ට රජයේ ණය තත්වය

රුපියල් බිලියන

| | |
|---|---|
| බැංකු අයිරාව | 149 |
| මහ බැංකු අත්තිකාරම | 199 |
| රාජ්‍ය ණය | 11,276 |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකළ වගකීම් (බැරකම්) ශේෂ පත්‍රයෙන් පිට විදේශ ණය | 366 |
| භාණ්ඩාගාර බැඳුම්කර ශේෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම | 344 |
| ප්‍රතිපාදන නොමැතිවීම මත ගිණුම් ගත නොකළ විදේශ ණය | 58 |
| විශ්‍රාම වැටුප් ගෙවීමට වාණිජ බැංකු මගින් ලබාගත් ණය | 65 |
| සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීමට ලබාගත් ණය | 4 |
| | 12,461 |

## 2015 - 2018 රට ණය කිරීම

2015 දී බලයට පත් 'යහපාලන' ප්‍රෝඩාකාරී පාලනය ආර්ථිකය රාජපක්ෂලාගේ ණය උගුලෙන් ගලවා ගන්නේ යැයි සපථ කරමින් ජනවරම ලබාගත් පාලනයකි. දේශපාලන පොරොන්දුව ලෙස විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට පොරොන්දු වූවා මෙන්ම ආර්ථිකයට දෙන ලද පොරොන්දුව වූයේ රට ණය උගුලෙන් ගලවාගෙන නිෂ්පාදන කර්මාන්ත ආර්ථිකයක් සඳහා ගෙන යන බවයි. නව දැනුමේ ආර්ථික සංකල්පයට ඡන්ද එකතු කළේ ඒ අනුවය. මෛත්‍රී පාලනය මාස 60කින් අලුත් රටක් ජනතාවට මවා පෙන්වන ලදී. මුදල් අමාත්‍යාංශයේම වාර්ෂික මූල්‍ය වාර්තාව පෙන්වා දෙන ණය තත්වය අනුව එය කොතරම් ප්‍රමාණයක ජනතාව රැවටීමක්දැයි පැහැදිලි වේ. ඒ සඳහා 2015 - 2018 වසර 03කදී රට ණය කර ඇති ආකාරය සැසඳීමම ප්‍රමාණවත්ය.




**2015 - 2018 රටේ ණය**

| | (රු. මිලියන) 2015 | 2018 |
|---|---|---|
| විදේශ ණය | 3,544,031 | 5,959,547 |
| දේශීය ණය | 4,959,197 | 6,017,992 |
| | 8,503,227 | 11,977,539 |

ඒ අනුව වසර 03කදී පමණක් රජය විසින් රට ණය කළ මුළු ප්‍රමාණය වැඩිවීම පමණක් රු. මිලියන 3,474,312කි. (රු. කෝටි 3,47,431කි.) වසරකදී ආසන්න වශයෙන් රට රු. කෝටි ලක්ෂයක් බැගින් ණය කර තිබීම අසාමාන්‍ය තත්වයකි.

මේ ආර්ථික අර්බුදයට රට පත් කිරීමේ කටයුත්තේදී රනිල් - මෛත්‍රී හවුල් පාලනය එක් කාල පරිච්ඡේදයක කොටස්කරුවන්ය. අධිරාජ්‍යවාදී යටත්විජිත පාලනය විසින් දුබල දූර්වල රාජ්‍යය අත්හළ දිනයේ පටන් පාලන බලය අත්පත් කරගත් වර්තමානය දක්වා රට පාලනය කළ සියලු ආණ්ඩු මේ සඳහා මුළුමනින්ම වගකිව යුතුය.

එසේම වලකට වැටීම මොළයට හොඳ නම් අගාධයකටම වැටීම ඊටත් වඩා මොළය පාදා ගත යුතුයැයි ජනතාවද තේරුම් ගත යුතුය. ජනතාව රවටා පාලකයින් බලය ගන්නවා සේම කැමැත්තෙන්ම රැවටීමට ලක්වන ජනතාවක්ද සිටී. ඒ නිසාම රට මේ දැවැන්ත ණය උගුලෙන් සහ ආර්ථික අර්බුදයෙන් ගොඩගැනීමට සමත් විකල්ප ආර්ථික දැක්මක් සහිත දේශපාලන ආර්ථික පරිවර්තනයක් අභිමුව අපි සිටිමු. එක්කෝ ශිෂ්ටත්වයේ දිශාවට ගමන් කළ යුතුය. නැතිනම් විනාශයේ අගාධයටම රටත් ජනතාවත් ගමන් කිරීම වැළැක්විය නොහැකි වනු ඇත.



"ජනතාව සංවිධානය කිරීම අපගේ කර්තව්‍යයක්. චීනයේ ප්‍රතිගාමීන් සම්බන්ධයෙන්, ඔවුන් පරාජය කරන්නට ජනතාව සංවිධානය කිරීම අපට අයිති වැඩකි. ප්‍රතිගාමී සියලුම දේ ප්‍රතිගාමීය. අප එයට පහර නොදෙන්නේ නම් එය පරාජය වන්නේ නැත. සිරිතක් වශයෙන්, කොස්ස නොවදින තැන කුණු දූවිලි ඉවත් නොවන්නා සේය."

**මාවෝ සේ තුං තෝරාගත් කෘති, 4වැනි කාණ්ඩය, 19 පිටුව**

# ඉරානය හා එක්සත් ජනපදය අතර ලියලන යුද්ධය




මේ දිනවල ඉරානයට අදාළව සිදුවෙමින් තිබෙන සිදුවීම් පෙළ පළමුවන ලෝක යුද්ධයට ප්‍රථම යුරෝපයේ වර්ධනය වූ තත්වය සිහිගන්වයි. තත්වයන් මෝරමින් තිබේ. සියලු පාර්ශ්වයන් විශාල ගැටුමකට සූදානම් වී සිටින අතර යුද්ධය ඇරඹීම සඳහා හේතුවක් සොයමින් සිටී.

පසුගියදා එක්සත් ජනපදය මිනිසුන් රහිත ඩ්‍රෝන ගුවන් යානයක් ඉරාන ගුවන් සීමාව තුළට එවනු ලැබුවේ ඊට පසුපසින් ගමන් ගන්නා යුද හටයන් 35 දෙනෙකුගෙන් යුක්ත ගුවන් යානයක්ද, සමගය. එය පැහැදිලි ලෙසම ඉරාන ගුවන් සීමාව බරපතළ ලෙස උල්ලංඝනය කිරීමකි. ඔවුන් බලාපොරොත්තු වූයේ ගුවන් යානා දෙකම ඉරාන ගුවන් ආරක්ෂක පද්ධතිය විසින් වෙඩි තබා බිම හෙළනු ඇත යන්නයි. එසේ වූයේ නම් එය එක්සත් ජනපද හමුදාවන්ට ඉරානය වෙත ගුවන් ප්‍රහාර එල්ල කිරීමට සාධාරණ හේතුවක් වනු ඇත. එවිට එම ප්‍රහාරය නවීනතම මිසයිල ප්‍රහාරයක් හෝ න්‍යෂ්ටික ප්‍රහාරයක් වුවද විය හැකිව තිබුණි. එවිට හදිසි ආරක්ෂක මණ්ඩල රැස්වීමක් කැඳවනු ලැබෙනු ඇති අතර, එහිදී එක්සත් ජනපද නියෝජිතයා එකී ප්‍රහාරය සාධාරණීයකරණය කරමින් කරුණු දක්වනු ඇත. එලෙස සැලසුම් කර තිබූ ප්‍රහාරය ඵල දැරුවේ නැත.

මෙහිදී ඉරාන බලධාරීහු සැලකිලිමත්ව කටයුතු කිරීමට සමත් වූහ. ඉරාන ගුවන් ආරක්ෂක පද්ධතිය මගින් බිම හෙළනු ලැබුවේ නියමුවන් රහිත ඩ්‍රෝන ගුවන් යානය පමණි. හටයන් 35 දෙනෙකු රැගත් යුද ගුවන් යානයට ප්‍රහාර එල්ල නොකෙරිණි. එබැවින් යුද්ධය ආරම්භ වූයේ නැත.

ඉරාන ඉස්ලාමික විප්ලවීය ආරක්ෂක හමුදාවේ ගුවන් බලකායේ අණදෙන නිලධාරී අමීර් අලි හජිසාඩෙප් පැවසුවේ ඔවුන් යුද ගුවන් යානයට ප්‍රහාර එල්ල නොකිරීමට තීරණය කළ බවයි. "එක්සත් ජනපද ඩ්‍රෝන යානය සමග නිලධාරීන් 35 දෙනෙකු සහිත ඇමෙරිකානු P-8 යානයක් අපගේ ගුවන් සීමාවට ඇතුළු වූවා. අපට එයට පහර දීමට හැකියාව තිබුණත් අප එසේ කළේ නැහැ. මක්නිසාද යත් අපට අවශ්‍යව තිබුණේ ඇමෙරිකානු ත්‍රස්ත හමුදාවට අනතුරු ඇඟවීමට පමණක් වීමයි." ඔහු තවදුරටත් පැවසුවේ බිම හෙළීමට පෙර එක්සත් ජනපද ඩ්‍රෝන යානයට තමන් දෙවරක් අනතුරු ඇඟවූ බවය.

මෙම සිදුවීමත් සමග එක්සත් ජනපද ජනාධිපතිවරයා සහ ඔහුගේ උපදේශකයන් ඉරානයට පහරදීම කල් දැමුවා මිස එය අත්හැර දැමුවේ නැත.

මේ වන විට ඉරානය පිළිබඳ එක්සත් ජනපද පිළිවෙත සම්බන්ධයෙන් එක්සත් ජනපදය තුළ උණුසුම් විවාදයක් වර්ධනය වී ඇත. තොරතුරු අනුව ඊනියා B - කණ්ඩායම (ඊට අයත් වන්නේ එක්සත් ජනපද ජාතික ආරක්ෂක උපදේශක ජෝන් බෝල්ටන්, මැදපෙරදිග රාජ්‍ය නායකයන් වන ඊශ්‍රායලයේ බෙන්ජමින් නෙතනියාහු, සවුදි අරාබියේ මොහොමඩ් බින් සල්මාන්, අබුඩාබියේ මොහොමඩ් බින් සාහෙඩ් සහ එක්සත් ජනපද ජනාධිපති උපදේශක කුශ්නර්ය.) ඩොනල්ඩ් ට්‍රම්ප්ව ඉරාන උගුල වෙත කැඳවාගෙන යමින් සිටී. **නමුත් පෙනෙන හැටියට ජනාධිපතිවරයා ඔහුගේ බලය යුද ප්‍රහාරය මත රඳා පවතින බව විශ්වාස නොකරනු පෙනේ. ඉරාන යුද්ධය උද්‍යානයක් හරහා ගමන් කිරීමක් නොවනු ඇත. එය ඔහුට එරෙහිව දෝෂාභියෝග යක් ගෙන ඒමට වුවද ඉඩකඩ විවෘත කරයි. එබැවින් ඔහුගේ තේරීම විය හැක්කේ යුදමය විසඳුමකට වඩා අඛණ්ඩ පීඩනය යෙදවීම මත ඉරානය අඩපණ කිරීමය.**

දැනගන්නට ලැබෙන පරිදි ඩොනල්ඩ් ට්‍රම්ප් ඕමානය හරහා ඉරාන පාලනයට පණිවුඩයක් යවා ඇතැයි වාර්තා වේ. ඉන් දැනුම්දී ඇත්තේ ඉරානයට පහර දෙන බවත් කෙටි කාලයක් තුළ ඊට ප්‍රතිචාර දැක්විය යුතු බවත්ය. එහිදී ඔහු දැනුම් දී ඇත්තේ තමන් යුද්ධයට වඩා සාකච්ඡාවලට කැමති බවය. එහෙත් එක්සත් ජනපදය හා ඉරානය යන දෙරටම එවැනි පණිවුඩ හුවමාරුවක් සිදුවූ බව තරයේ ප්‍රතික්ෂේප කර තිබේ.

ඉරානය හා එක්සත් ජනපදය අතර යුද්ධය සැබෑවක් වීමේ හැකියාව වර්ධනය වෙමින් තිබේ. ඩොනල්ඩ් ට්‍රම්ප් පාර්ශ්වය ඉරාකය - අෆ්ගනිස්ථානය, ඉරානය හා ලිබියාව මෙන්ම තර්ජනයක් බව දිගින් දිගටම පවසමින් සිටී. ඉරානය සමග යුද්ධය දැනටමත් සැලසුම් කර අවසන් යැයි ගාඩියන් පුවත්පත් තීරු ලිපි රචක ඕවන් ජෝන්ස් පවසා සිටී.

එසේම අප තේරුම් ගත යුත්තේ ඉරානය මත යුද්ධය තීරණය වන්නේ හුදෙක් එක් එක් පුද්ගලයාගේ රුචි අරුචිකම් මතම නොවන බවයි. අර්බුදයට ගිය ධනවාදයේ එක් විකල්පයක් යුද්ධය ලෙස කවදත් සටහන්ව තිබේ.

## උතුරු කොරියාව: කිම් - ට්‍රම්ප් නැවත හමුවෙති

එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සහ උතුරු කොරියානු නායක කිම් ජොන් උන් යළිත් වරක් ජූනි 30 වන දින උතුරු/දකුණු කොරියානු දේශසීමා ගම්මානයේදී මුණ ගැසුණහ. ජපානයේ පැවැත්වෙන G -20 සමුළුව සඳහා පැමිණි ඩොනල්ඩ් ට්‍රම්ප් දකුණු කොරියානු ජනාධිපතිවරයා මුණ ගැසීමෙන් අනතුරුව එහි පැමිණ තිබේ.



## කියුබාව: රාජ්‍ය සේවක වැටුප් ඉහළට

ජූලි මාසයේ සිට කියුබාවේ රාජ්‍ය අංශයේ සේවකයන්ට හා විශ්‍රාමිකයන්ට වැටුප් වැඩිකර තිබේ. ඒ අනුව කියුබානු ජාතිකයෙකුගේ අවම වැටුප එක්සත් ජනපද ඩොලර් 17ක් දක්වා ඉහළ යන අතර, සාමාන්‍ය වැටුප එක්සත් ජනපද ඩොලර් 45 දක්වා ඉහළ යැවේ. කියුබාව මෙම වැටුප් වැඩිවීම එරට රාජ්‍ය සේවකයන් වෙත ලබාදී ඇත්තේ ඩොනල්ඩ් ට්‍රම්ප් යළිත් වරක් කියුබාවට එරෙහි සම්බාධක දැඩි කළ තත්වයක් යටතේදීය. කියුබාවේ අධ්‍යාපන, සෞඛ්‍ය, ආරක්ෂක, සංස්කෘතික, ක්‍රීඩා, සිවිල් සේවාව සහ නිවාස ක්ෂේත්‍රයේ සියලුම රැකියා රාජ්‍ය සේවයට අයත් වේ. මීට අමතරව කියුබාවේ විශ්‍රාමිකයන්ගේ වැටුපද මීට සමාන්තරව ඉහළ දමා තිබේ. කියුබාවේ අධ්‍යාපනය හා සෞඛ්‍යය ඇතුළු සුභසාධන සේවා රැසක් රජයෙන් සැපයෙන අතර පොදුවේ ජීවන වියදම විශාල ලෙස අඩුය.



## එක්සත් ජනපදය: වෙළඳ යුද්ධය මූල්‍ය යුද්ධයක් බවට

චීන - එක්සත් ජනපද වෙළඳ යුද්ධය විසින් වසර දෙකක් තුනක් ඇතුළත මූල්‍ය යුද්ධයක් ඇති කරනු ඇතැයි ජූලියස් බයර් නමැති පර්යේෂණ ආයතනයේ ප්‍රධානී ක්‍රිස්ටියන් ගාටිනර් පවසයි. පවත්නා තත්වය විසින් දැනට නිදහසේ මිල තීරණය වන තත්වයේ සිට පාලිත තත්වයකට ඩොලරය ගෙන ඒමට එක්සත් ජනපදයට සිදුවනු ඇතැයිද එමගින් මූල්‍ය යුද්ධයක් ඇති කරනු ඇතැයිද ඔහු පවසයි.

මීට අමතරව මූල්‍ය යුද්ධයක් ඇතිවීමේ හේතුවක් වන්නේ රටවල් සිය මුදල් ඒකකයන්ගේ වටිනාකම වාසි ලබාගැනීමේ අරමුණින් පහත හෙළීමයි. පසුගිය මාසයේදී එක්සත් ජනපද වෙළඳ දෙපාර්තමේන්තුව මුදල් ඒකකවල වටිනාකම පහත දමන රටවලට ලබාදෙන සහන කප්පාදුව සඳහා නව නීති සම්මත කර ගත්තාය.



# සමාජවාදය තුළ දී විවේකය ගත කරන ආකාරය

සමාජවාදී සෝවියට් දේශය තුළ පුද්ගලයෙකු රැකියාවෙහි යෙදිය යුතු කාලය අඩුකර තිබුණි. ඔවුන්ගේ නිදහස් කාලය වැඩිකර තිබුණි. 1984 පමණ වන විට ලෝකයේ අනෙකුත් රටවලට සාපේක්ෂව සෝවියට් දේශය තුළ පුද්ගලයෙකු රැකියාවෙහි නිරත වන කාලය සතියකට පැය 18කින් අඩුකර තිබුණි. රැකියාවෙහි නිරත විය යුතු කාලය දළ වශයෙන් සතියකට පැය 39.4කට සීමාකර තිබුණි. එය එකල ලෝකයේ අඩුම වැඩ කාලය ලෙස වාර්තා ගත විය. ඒ අනුව සෝවියට් පුරවැසියෙකුගේ වාර්ෂික වැඩ කාලය පැය 400කින් අඩු වූ අතර බොහෝ පිරිසකට වසරකට දින 112ක නිවාඩු කාලයක් හිමි විය. තරුණ පිරිස සඳහා විශේෂ වරප්‍රසාද ලබාදී තිබුණි. ඔවුන්ගේ වැඩ කාලය අඩුකර තිබූ අතර රැකියාවෙහි යෙදෙන අතරතුර අධ්‍යාපන කටයුතුවල යෙදීම සඳහා විශේෂ සහන ලබාදී තිබුණි.

සෝවියට් ජනතාවගේ වැඩ නොකරන කාලය වැඩි වුවද ඒ කාලය ගත කරන්නේ කෙසේද යන්න පිළිබඳ ගැටලුවක් මතුවී නොතිබිණි. එම කාලය ඔවුන්ගේ සංස්කෘතිකමය සහ බුද්ධිමය සංවර්ධනය සඳහා යෙදවීමට සමාජවාදී රජය ඔවුන්ව දිරි ගැන්වීය. ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය පහසුකම් රජය මැදිහත් වී ගොඩනගා තිබුණි. මේ නිසා සෝවියට් දේශය තුළ සමාජ ක්‍රියාකාරිත්වයෙහි නොයෙදුන, දේශපාලනය ගැන උනන්දුවක් නොමැති, තම අධ්‍යාපන තත්වය දියුණු කර ගැනීමට උනන්දුවක් නොමැති පුද්ගලයෙකු සොයා ගැනීම අපහසු විය.

### සමාජමය වැඩ කටයුතු

සෝවියට් දේශය තුළ බොහෝ පුද්ගලයන් වෘත්තිය සමිති, නිවාස කමිටු, පාසල් සඳහා සහයෝගය ලබා දෙන කොමිසම් වැනි ජනතා සංවිධානවල කටයුතු සඳහා සහභාගි වූහ. මක්නිසාදයත් එම සංවිධානවලදී පොදු යහ පැවැත්ම සහ පවුලේ යහ පැවැත්ම පිළිබඳ ගැටලු සාකච්ඡා කර තීන්දු තීරණවලට එළඹි බැවිනි. එය රැකියාවේ හෝ ජීවිතයේ තත්වය පිළිබඳව, දරුවන් රැක බලා ගැනීම පිළිබඳව, පරිසරය සුරැකීම පිළිබඳව විය හැකි විය. එබැවින් සෝවියට් දේශයේ වැඩිහිටි ජනගහනයෙන් 2/3ක්ම සමාජ ක්‍රියාකාරිත්වයේ නිරතවීම පුදුමයක් නොවේ. වැඩිහිටියන්ගේ නිදහස් කාලය යොදවනු ලැබුවේ ඔවුන්ගේ සමාජ වගකීම් ඉටුකිරීම වෙනුවෙනි.

සෝවියට් පාලන කාලය තුළදී කාන්තාවන් සහ පිරිමින් සමාජ ක්‍රියාකාරිත්වය සඳහා යොදවන කාලය පස් ගුණයකින් හෝ හය ගුණයකින් ඉහළ ගියේය. එසේම ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම හා දේශපාලන දැනුම වැඩිකර ගැනීම සඳහා යෙදවූ කාලයද සැලකිය යුතු තරමින් වැඩි විය.

පවුල තුළ සැමියා හා බිරිඳ යන දෙදෙනාම දේශපාලන ක්‍රියාකාරිත්වය පිළිබඳ සැලකිලිමත් වූහ. ඒ නිසා ඔවුහු පුවත්පත්, සඟරා කියවූහ. පිරිමින්ගෙන් 90%ක් සහ කාන්තාවන්ගෙන් 80%ක් නිතිපතා පුවත් කියවූහ. 1920 වසරේදී විශාල කාර්මික හා සංසකෘතික නගර තුනක් ආශ්‍රයෙන් සිදු කළ සමීක්ෂණයකදී හෙළි වූයේ රැකියාවෙහි නිරත පවුල්වල පිරිමින්ගෙන් 45.9%ක්, කාන්තාවන්ගෙන් 40%ක් සහ ගෘහණියන්ගෙන් 13.3%ක් පුවත්පත් කියවූ බවය. සඟරා



කියවූ ප්‍රතිශතය අනුපිළිවෙළින් 41%ක්, 20%ක් සහ 13.3%ක් විය.

### පවුල තුළ සන්නිවේදනය

1981 වසරේදී මොස්කව් නුවර අසල ප්‍රදේශයක සිදුකළ සමීක්ෂණයට අනුව සමීක්ෂණයට භාජනය වූ විවාහක ජෝඩු අතරින් 83%ක්, තමන්ගේ රැකියා පිළිබඳව සහ සමාජ ක්‍රියාකාරිත්වය පිළිබඳව ඔවුනොවුන් සාකච්ඡා කළහ. ඊට සමාන ප්‍රතිශතයක් සැමියන් හා බිරින්දෑවරුන් එකිනෙකා සමග දේශපාලන හා සමාජයීය සිදුවීම් පිළිබඳ සාකච්ඡා කළහ. දෙමව්පියන්ගෙන් 2/3ක්ම තම දරුවන් සමග දේශපාලන සහ සමාජ ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කළහ.

**පවුලක් තුළ සමාජිකයන් අතර සිදුවන අදහස් හුවමාරුව පවුලේ සෑම සාමාජිකයෙකුම විවිධ පැතිවලින් පොහොසත් කරන්නකි. සෝවියට් දේශය තුළ පියවරුන්ට තම දරුවන් සමග කතා කිරීමට සහ ගත කිරීමට කාල වේලාව ඇති තරම් තිබුණි. පවුලේ සහෝදර සහෝදරියෝ එකට සෙල්ලම් කළහ. කුඩා ළමෝ තම මිත්තණිය සමග ඔවුන්ගේ රහස් බෙදා ගත්හ. මෙවැනි දේවලින් පවුල තුළ උණුසුම් හැඟීමක් ජනිත කළ අතර පවුල තුළ යහපැවැත්ම රැකුණි. පවුල් සබඳතාවල සමීපකම පුද්ගලයෙකුගේ ජීවිතය පුරාම රැඳී පැවතුණි.**

සමීක්ෂණයට ලක්වූ දෙමව්පියන්ගෙන් 64.5%ක් ඔවුන්ගේ නිදහස් කාලය ළමුන් සමග ගත කළ අතර, 41%ක් තම ළමුන්ව චිත්‍රපට නැරඹීම සඳහා ගෙන ගියහ. 23%ක් තම ළමුන් සමග නාට්‍ය නැරඹීමට හෝ කෞතුකාගාර වෙත හෝ ගියහ. දෙමව්පියන්ගෙන 9%ක් සිය ළමුන් සමග මුද්දර, පැරණි කාසි වැනි දේ රැස් කිරීමේ නිරත වූහ.

### රූපවාහිනිය සහ චිත්‍රපට නැරඹීම

සෝවියට් දේශයේ පවුල්වලින් 93.5%කට රූපවාහිනී යන්ත්‍ර තිබුණි. නව යොවුන් වියේ තරුණ තරුණියන්ගෙන් 2/3ක්ම සිය නිදහස් කාලය ගෙවා දැමුවේ රූපවාහිනිය සහ චිත්‍රපට නැරඹීමෙනි. තරුණ තරුණියන්ගේ සිත්වලට රූපවාහිනියෙන් හා චිත්‍රපටයෙන් දැවැන්ත බලපෑමක් සිදුකළ හැකි විය. එම බලපෑම විවිධාකාරයෙන් යොදාගත හැකි විය. බොහෝ සෝවියට් චිත්‍රපට හා රූපවාහිනී වැඩසටහන් අඩංගුවෙන් පොහොසත් හා රසවත් වුවද ඇතැම් වැඩසටහන් ඒකාකාරී විය. එසේ වුවද එක් කරුණක් ස්ථිර ලෙස කිව හැකිය. එනම් අනෙකුත් පුද්ගලයන් හෝ ජන කණ්ඩායම් කෙරෙහි වෛරය පතුරුවන හෝ ද්වේශය පතුරුවන හෝ කිසිවක් ඒවායේ නොවූ බවය.

බොහෝ පවුල්වලට ඔවුන් විද්‍යා ක්ෂේත්‍රයේ හෝ සංස්කෘතික ක්ෂේත්‍රයේ හෝ සාමාන්‍ය කම්කරු රැකියාවක හෝ ඉංජිනේරු හෝ කාර්යාල සේවක හෝ වෙනත් කුමන ආකාරයේ රැකියාවක නිරත වුවද කෙනෙකුට හොඳ චිත්‍රපටයක්, හොඳ නාට්‍යයක් හොඳ නර්තනයක්, හොඳ සංගීත ඛණ්ඩයක්, හොඳ චිත්‍රපටයක් රසවිඳිය හැකි විය. අගය කළ හැකි විය. එසේම චිත්‍රපටයක් නාට්‍යයක් බැලීමට යාම සාමූහික කටයුත්තක් විය. ඒ සඳහා වන ප්‍රවේශ පත්‍ර මිල අඩු බැවින් කිසිවෙකු තනියම චිත්‍රපට හෝ නාට්‍ය බැලීමට නොගිය අතර තම යහළු මිත්‍රයන්, අසල්වැසියන් එක්ව යාමට පුරුදු වී සිටියෝය.

එසේ වුවද කාන්තාවන් සහ පිරිමින් සඳහා වූ නිදහස් කාලය අතර සැලකිය යුතු වෙනසක් පැවතුණි. සාමාන්‍ය කාන්තාවක හෝ පිරිමියෙකු නොව විවාහක කාන්තාවක් සහ පිරිමියෙකු පිළිබඳ සලකා බැලූ කල විවාහක පිරිමියෙකුට විවාහක කාන්තාවක් මෙන් 1.5ක නිදහස් කාලයක් තිබුණි. නමුත් එය පවුලෙන් පවුලට වෙනස් වූයේ ළමුන් ගණන සහ ඔවුන්ගේ වයස අනුවය.

### යටිතල පහසුකම්

සෝවියට් රජය එරට පුරවැසියන්ගේ නිදහස් කාලය වැඩි කරීමට සමාන්තරව හොඳ විවේක කාලයක් ගත කිරීම සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍යමය හා තාක්ෂණික පහසුකම්ද පුළුල් කිරීමට කටයුතු කළේය. 1984 වසර වන විට සෝවියට් දේශය පුරා සිනමා ශාලා 1,53,000ක් අංග සම්පූර්ණ නාට්‍ය ශාලා 604ක්, කෞතුකාගාර 1,520ක්, මහජන පුස්තකාල 1,32,000ක්, සමාජ ශාලා 1,38,000ක්, හා සංස්කෘතික හා විවේක උද්‍යාන 1,100ක් ඉදිකර තිබුණි. බිලියන 260කට අධික වූ සෝවියට් ජනතාවගෙන් චිත්‍රපට නැරඹීම සඳහා බිලියන 4.2ක්, කෞතුකාගාර වෙත මිලියන 150ක් නාට්‍ය ශාලා වෙත මිලියන 120ක් වාර්ෂිකව ගොස් තිබුණි.

නාට්‍යකරණයේ යෙදෙන ආධුනික කණ්ඩායම්, ගීතිකා කණ්ඩායම්, සංගීත කණ්ඩායම්, නර්තන කණ්ඩායම් ගණන විශාල වශයෙන් ඉහළ ගියේය. මිලියන ගණන් ජනතාව ඒවාට සම්බන්ධ වී සිටියහ. තරුණ පුරෝගාමීන්ගේ මන්දිර සහ නිවාසවල විශාල විවිධත්වයන් සහිත කව සහ චිත්‍රාගාර පවත්වාගෙන යනු ලැබිණි. නාට්‍යාගාර, සිනමා ශාලා, කෞතුකාගාර, සංස්කෘතික අධ්‍යාපන ආයතන ගොඩනැගීම සඳහාත් ගුරුවරුන් පුහුණු කිරීම සඳහාත්, ආධුනික ප්‍රසංග සංවිධානය කිරීම සඳහාත් රජය සහ වෘත්තිය සමිති විශාල මුදලක් වැය කළේය. මේවායේ අධ්‍යාපන කටයුතු සඳහා සෝවියට් ජනතාවගෙන් කිසිදු මුදලක් අය නොකෙරුණ අතර, නාට්‍ය, චිත්‍රපට, කෞතුකාගාර ආදිය නැරඹීම සඳහා අයකරනු ලැබුවේද ඉතා අඩු මිලකි.

සමාජ සංවිධාන විසින් සෝවියට් දේශයේ පවුල්වලට එක්ව තම විවේක කාලය ගත කිරීමට අවස්ථා නිර්මාණය කර තිබුණි. ශීත කාලය තුළදී විශේෂ පරිශ්‍රයන් තුළත් ගිම්හානයේ දී එළමහනේ දීත්, සාමාන්‍ය පුරවැසියන්ට ජාතික හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ විශේෂඥයන්, සෝවියට් සභා නියෝජිතයන්, පුවත්කලාවේදීන්, ලේඛකයන්, නළුවන්, යුද වීරියන් ආදීන් මුණ ගැසීමට හා සාකච්ඡා කිරීමට අවස්ථා සකස් කරන ලදී.

### ක්‍රීඩා සංස්කෘතිය

සෝවියට් පුරවැසියන් සිය නිදහස් කාලයෙන් වැඩි කොටසක් ක්‍රීඩා සහ ශාරීරික ව්‍යායාම් සඳහා වැය කිරීමට පුරුදු වී සිටියහ. අනෙකුත් ධනපති රටවල් තුළ මෙන් නොව සෝවියට් රජය විසින් පුරවැසියාගේ ක්‍රීඩා සංස්කෘතිය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාරීරික ව්‍යායාම් සඳහා දැවැන්ත මුදලක් යෙදවීය. විප්ලවයට පෙර සෝවියට් රුසියාවට අයත් භූමියේ තරුණ ජනතාවගෙන් 45%ක් ශාරීරිකව අවවර්ධනයට ලක්ව සහ සෞඛ්‍යමය වශයෙන් දුර්වල අය වූහ. ක්‍රීඩා සමාජ තිබුණේ සිය ගණනකි. ඒවාටද සම්බන්ධ විය හැකිව තිබුණේ ධනවත් සහ ප්‍රභූ පවුල්වල අයට පමණි. විප්ලවයට අවුරුද්දක් ගතවෙද්දී ක්‍රීඩා සංස්කෘතිය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ක්‍රීඩා සංස්කෘතික සමාජ ඇති කිරීම ආරම්භ කෙරුණි. 1984 වන විට ක්‍රීඩා සංස්කෘතික සාමූහිකයන් 2,32,000ක් ගොඩනගා තිබූ අතර එහි සාමාජිකත්වය මිලියන 63.6ක් විය. සෝවියට් දේශය පුරා ගෘහස්ථ ක්‍රීඩාංගණ 3,500ක්, ක්‍රීඩාගාර 74,000ක් පිහිනුම් තටාක 1,750ක්,

15 වැනි පිටුවට

> පවුලක් තුළ සමාජිකයන් අතර සිදුවන අදහස් හුවමාරුව පවුලේ සෑම සාමාජිකයෙකුම විවිධ පැතිවලින් පොහොසත් කරන්නකි. සෝවියට් දේශය තුළ පියවරුන්ට තම දරුවන් සමග කතා කිරීමට සහ ගත කිරීමට කාල වේලාව ඇති තරම් තිබුණි. පවුලේ සහෝදර සහෝදරියෝ එකට සෙල්ලම් කළහ. කුඩා ළමෝ තම මිත්තණිය සමග ඔවුන්ගේ රහස් බෙදා ගත්හ. මෙවැනි දේවලින් පවුල තුළ උණුසුම් හැඟීමක් ජනිත කළ අතර පවුල තුළ යහපැවැත්ම රැකුණි. පවුල් සබඳතාවල සමීපකම පුද්ගලයෙකුගේ ජීවිතය පුරාම රැඳී පැවතුණි.



"නවීන ධනපති ක්‍රමයේ සෑම ජනේලයකින්ම සමාජවාදය අප වෙත බැලුම් හෙළාගෙන සිටියි. මෙම නවීන ධනපති ක්‍රමයේ පදනම අනුව ඉදිරි පියවරක් වන සෑම වැදගත් කටයුත්තක්ම මගින් සමාජවාදයේ කටු සටහන එක එල්ලේම සහ ප්‍රායෝගික වශයෙන් සලකුණු කරනු ලැබේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5වැනි වෙළුම,**
**263 පිටුව**

# එක් පියවරක් දිගු ගමනක්

"අනේ බලන්න අපේ දුව ඊයේ බ්‍රෙසියර් එකක් ගත්තා. ඒකේ මොනවද ඇට වර්ගයක් අහුවෙනවා කියලා දැන් කෝල් කරලා කියනවා. "

"අනේ වඳ බෙහෙත් වෙන්න ඇති.... අර අහවල් කඩෙන්ද ගත්තේ? (මුස්ලිම් ජාතිකයෙකුට අයත් ව්‍යාපාරයක නමක්)"

" නෑ පුතේ ... ( ප්‍රකට සිංහල ව්‍යාපාරයක නමක් )"

"ඒවාට නම් වඳ බෙහෙත් දානවලු අම්මෝ අපිනම් යන්නේ නෑ."

ඉහත සඳහන්ව ඇත්තේ අගනුවර උසස් බාලිකා විදුහලක මා හිතවත් ගුරු මහත්මීන් දෙදෙනෙකු අතර ටික කලකට ඉහතදී ඇතිවූ සංවාදයකි. වර්තමානය වන විට වඳ බෙහෙත්, වඳ සැත්කම් හා පොදුවේ මුස්ලිම් විරෝධය ප්‍රබල මාතෘකා ලෙස සමාජගත වී තිබේ. පාසල්වල, කාර්යාලවල හා මහමඟද දස දෙසින් ජාතිවාදයේ ගිනි පුළිඟු මතු වෙමින් පවතියි. පාලක පන්තිය අභිමුව කොඳුනාරටි බිඳගත් මාධ්‍ය ආයතන හා සමාජ මාධ්‍යවල ඉන්ද්‍රජාලිකයින්ද මේ ගිනි පුළිඟු මහා ගින්නක් බවට පත්කරලීම උදෙසා නොමසුරුව වියළි පිදුරු සපයමින් හිඳිනු දක්නා ලැබේ.

ආගම හා ජාතිකත්වය (ඔවුන්ට අනුව ජාතිය) මූලික සටන්පාඨය ලෙස හුවා දක්වන ඔවුන් මේ භීතිකා සමාජගත කරන්නට හොඳම සුදුස්සා ලෙස තෝරා ගන්නේ කාන්තාවයි. බමුණු දවස ගැහැනුන්ගේ නුවණ හැඳිමිටේ දිග යැයි පැවසූ මතය සනාථ කිරීමට වෙහෙසෙමින් කිසිදු වගවිභාගයකින් තොරව බහුතර කාන්තා පිරිසක් මෙසේ සමාජය අවුළුවාලීමේ කාර්යභාරය ඉතා මැනවින් සිදු කරමින් හිඳීම කණගාටුදායක තත්වයකි.

වඳ සැත්කම්, වඳ බ්‍රෙසියර් හා වඳ කොත්තු යනාදිය කරළියට එන්නේ කාන්තාවන් වඩා මේ පිළිබඳ උනන්දුවෙන් හා සංවේදී ලෙස කටයුතු කරන නිසා විය යුතුය. අප්‍රේල් 21 ප්‍රහාරයට පෙරද මේ පිළිබඳව වරින් වර මතුවී ආ අතර ඒ අනුව මුස්ලිම් ව්‍යාපාර වර්ජනය කරන්නට අන් අය පෙළඹවීමේ කාර්යය මැනවින් ඉටුකළේ කාන්තාවන්ය. නමුත් විවිධ අහිතකර රසකාරක දැමූ ක්ෂණික ආහාරවලින් වඳභාවයට පත්විය හැකි බව නොදැන ඔවුන් තම දරුවන්ට ඒවා කවමින් හිඳීම විහිළු සහගතය. ජෙල් බ්‍රා නැමති බ්‍රෙසියර් විශේෂය ගැන නොදැන එහි ඇති ජෙල් විශේෂය වඳ බෙහෙත් යැයි සැක කරමින් එය වීඩියෝ කර සමාජ මාධ්‍ය වෙත මුදා හැරීම සිදුකරන ලද්දේද මෙමු හය හතර නොදත් කාන්තාවන්මය.

වඳ සැත්කම් පිළිබද පුවත මේ වනවටත් අසත්‍ය බවට තහවුරු වී තිබියදී පවා කාන්තාවන් අතර කතා බහට ලක්වන්නේ වඳ සැත්කම් 4000ක් කරලා යනුවෙන් වූ මුල් පුවත පමණකි.

මෙවන් ගිනි අවුළුවන්නේ කවුද? ගමේ ගොඩේ නූගත් කාන්තාවන් පමණක්ද? නැත, උගත් යැයි සම්මත බහුතරයක් කාන්තාවන්ද මේ සඳහා තම නොමසුරු දායකත්වය ලබාදෙනු දැකිය හැකිය. විශේෂයෙන් ඉතා කනගාටුදායක ලෙස පාසැල් ගුරුවරියෝ සිසු දරුවන් හා දෙමාපියන් මගින් මේ ප්‍රශ්නය සමාජගත කරමින් හිඳිති. එක් පසෙකින් වඳ සැත්කම් කළායැයි පැවසෙන වෛද්‍යවරයාට සාප කරමින් දේවාල ගානේ යමින් පොල් ගසන කාන්තාවන්ය. ඔවුන් හෙට දවසට මිත්‍යාව දායාද කරමින් හිඳියි. අනෙක් පසින් රටේ අනාගත පරපුර බිහිකරන ගුරුවරුන් විසින් ජාතිවාදය ආගම්වාදය දරුවන්ගේ ඔළු ගෙඩි තුළට කාවද්දමින් හිඳිති. මෙවන් වටපිටාවක ශ්‍රී ලාංකේය ජාතියේ අනාගතය කෙසේ වනු ඇද්ද?



මේ ජාතිවාදී, ආගම්වාදී මිත්‍යාවන් වපුරන කාන්තාවන් බහුතරයකට මුස්ලිම් ළමා විවාහ පිළිබඳ ගැටලුව අදාළ වන්නේම නැත. සමාජයේ බරපතළම ප්‍රශ්නයක් වී ඇති මුස්ලිම් ළමා විවාහයන් තහනම් කළ යුතු බවට හඬ නගන්නේ සමාජ අසාධාරණය පිළිබඳ මනා වැටහීමක් ඇති අය පමණකි. අඩුම තරමින් මුස්ලිම් සමාජයේ පවා මේ පිළිබඳ කතාබහක් ඇති නොවීම ඛේදජනක තත්වයකි. කෙසේ වුවත් සමාජයේ කතාබහට ලක්විය යුතු කරුණු කාරණා බොහෝ තිබියදී ඒවා ගැන හාන්කවිසියයක්වත් වගක් නැතිව නිද්‍රාශීලිව කටයුතු කරන බහුතර කතුන් ප්‍රමාණයක් සිටින රටක මිත්‍යාව වැපිරීම අසීරු නොවේ. එවන් මිත්‍යාවන්ට, ජාතිවාදයන්ට යට වෙන බහුතර කාන්තාවන් පිරිසක් ඉන්නා රටක, ඔවුන්ගේ ඡන්දයෙන් 71 වසරක් පුරා මෙවන් පාලකයන් පත්වීම පුදුමයට කරුණක්ද නොවේ.

නමුත් ගැටලුව වන්නේද එයයි. ඔවුන් සිදුකරන ජාතිවාදී ක්‍රියාන්විතයන් මගින් ආගාධයට යන්නේ සමස්ත ශ්‍රී ලංකාවයි. රටේ අනාගත පරම්පරාවයි. මීට වසර 26කට එපිට අතීතයක කළු ජූලියක අත්දැකීම් අප විඳ ඇත්තෙමු. ඒ අමිහිරි සිදුවීම් විසින් අපට අපේ සමීපතම දෙමළ මිතුරා අහිමි කළ අතර, රට තිස් අවුරුදු යුද්ධයක් උරුම වූ බව අද ජාතිවාදයට උඩගෙඩිදෙන බොහෝ දෙනා කල්පනා කරන්නේ නැත. වර්තමානයේ අප සමාජය තල්ලු වෙමින් හිඳින්නේ නැවතත් එවන් ඛේදජනක ඉරණමක් අපට උරුම කරවන දිශාවකට නොවේද?

එකෙත් අප නිහඬව බලාසිටිය යුතුද? නැත කෙතරම් බාධක පැමිණියද, ජාතිවාදියා අපට කෙතරම් ගල් ගසන්නට උත්සාහ කළද අප නිවැරදි තැන සිට ගත යුතුමය. සෙමෙන් සෙමෙන් වුවද, අප දන්නා හඳුනන කාන්තාවන්ට මේ ව්‍යසනය තේරුම් කර දිය යුතුය. අප අවබෝධ කරගත් සත්‍යය අනෙක් අයටද අවබෝධ කර දිය යුතුය. ජාතිවාදයට, ආගම්වාදයට හා මිත්‍යාවට කොන්දේසි විරහිතව එරෙහි විය යුතු අතර, කාන්තාවන් හිංසනයට පත්කරන කවර හෝ නීතියක් ඇත්නම් එයට විරුද්ධව කාන්තාවන් පෙළගැස්විය යුතුමය.

එය මේ මොහොතේ අපට අසීරු කාර්යයක් වුවද අප ඒ වෙනුවෙන් තබන එක් පියවරක් දිගු ගමනක ඇරඹුමක් වනු ඇත.

# තවත් බෝම්බයක් එනතුරු



**ආදරය තියෙන තැන**

**රජවරුනි, මගේ කෝපය ද**
**වැසියනි, මගේ ශෝකය ද**
**පිළිගන්න...**

**ඔය පේළියේ ලේ සුවඳ නම්**
**ආදරය තියෙන තැනකින් ඇවිත් හිටගන්න...**

**දිනු රාජගුරු**

එසේය... අප්‍රේල් 21 දා පුපුරා ගියේ කලින් සැලසුම් කළ රජවරු දැන සිටි බෝම්බයකි... වැසියන් නොදැන සිටි, උන් දැන සිටි බෝම්බයකි.

අපි දශක ගණනාවක් ගෙවා දැමූයේ බෝම්බ භීතියෙනි. ඉන්පසු තවත් දශකයක් පමණ ගෙවුණේ බෝම්බයක් එනතුරු බලා සිටිමිනි. බලා සිටි බෝම්බය එළඹ තිබේ. ජාතිවාදී බෝම්බයක බර මියගිය හිස්ගෙඩි ගණනින්ද තුවාල වූ අතපය ගණනින්ද ගිණිය නොහැකිය.

සමාජය මතට වැටෙන ඕනෑම බෝම්බයක් වරක් ඒ මත පතිත වනවිට එහි බර ද්විගුණව ගැහැණිය මත පතිත වනු ඇත. දශක ගණනාවක් ගෙවුණු යුද්ධයේ නටබුන් තවමත් ඉතිරිව ඇති වටපිටාවක ඇගේ ඇස අග තිබූ කඳුළ වියැලෙන්නටත් පෙර තවත් කඳුළක් ඉපදිණි. ඕනෑම පීඩාකාරී සංසිද්ධියක වඩා වැඩි බර නිසගවම පතිත වනුයේ අවවරප්‍රසාදිතයින් මතය. වැඩිම පීඩනය එල්ල වනු ඇත්තේ අඩුම වරප්‍රසාද ලත් තැනැත්තා වෙතය. ගැහැණුන්ද දරුවන්ද සිටිනු ඇත්තේ එතැනය... එතැන අග්ගිස්සේය.

බුර්කාව නිර්මාණය කළේ ගැහැණිය නොවේ. එයද මෙම පුරුෂ මූලික පංති සමාජයේම නිර්මාණයක් මිස වෙනත් කිසිවක් නොවේ. කෙනෙකුට තමන් කැමති ඇඳුමක් ඇඳ ගැනීමට අයිතිය සමාජයක් තුළ තිබිය යුතුය. ඇඳුම තුළ පවා ගැහැනිය හිර කරන්නට තතනන සමාජයකට අපි ආවඩමුද? නොඑසේ නම් වෙනස් වී ඉදිරියට යමුද? පහත කවි කොටස ඔබට යමක් පවසනවාදැයි බලන්න.

**පාස්කු බෝම්බයට බයේ දුවපු ෆාතිමා**
**මරණ බයේ එළියටවත් නාපු ෆාතිමා**
**කුහුඹුවකුටවත් වරදක් නොකළ ෆාතිමා**
**තාමත් හරි අහිංසකයි තමයි ෆාතිමා**

**දේව මැදුරු පාළු වෙලා ගිහින් ෆාතිමා**
**වීදි පුරා පාළුව රජ වෙලා ෆාතිමා**
**නිකාබ් එක උඩු සුළඟේ දමා ෆාතිමා**
**ඇවිළෙන ගිනි නිවා ගන්න එන්න ෆාතිමා**

**දිනේෂ් සුරංග බරණිගේ**

'පෙති' සහ 'පිටි' පටලවාගැනීමක් පවා ජාතිවාදී ගැටුමකට මඟ පෑදූ රටක බෝම්බයකට කළ හැකි තරම කොතරම්දැයි අපට පෙන්වා දෙමිනි, පසුගිය මාස කිහිපයම ගෙවී ගියේ. ඉදින් අප කාටවත් තවදුරටත් සැහැල්ලුවෙන් හුස්ම ගත හැකිද?

තමන්ට කැමති ආගමක් ඇදහීමේ අයිතිය මෙන්ම ආගමක් නොඇදහීමේ අයිතියද රැක ගනිමින් අපට අපේ මිත්‍රත්වයද රැකගත නොහැකිදැයි අපට අපෙන්ම අසා ගන්නට බලකරමු... ඒ ගැන සිතන්නට නැවතෙමු.... නැවති ප්‍රශ්න කරමු...!

## සිව්දෙසින්

### ට්‍රම්ප්ට එරෙහිව මෝර්ගන්

ඇමරිකා එක්සත් ජනපදයේ සොකර් ක්‍රීඩාවේ තාරකාවක් හා ජාතික කණ්ඩායමේ සම නායිකාව වන මෝර්ගන් රැපිනෝ, ප්‍රංශයේ පැවැත්වෙන 2019 ෆිෆා කාන්තා ලෝක කුසලාන තරගයේ ජුනි 20 දින ස්වීඩනය හා එක්සත් ජනපදය අතර පැවති තරගයේ දී සිය ජාතික ගීය ගැයීම වර්ජනය කළාය.

2016 සැප්තැම්බර් මස සිට සාමාන්‍යයෙන් තරගයක් ආරම්භ වීමට ප්‍රථම ජාතික ගීය ගැයෙන අවස්ථාවේ ඇය දණ ගසා සිටින්නේ ඇමරිකා එක්සත් ජනපදය තුළ සුළු ජාතික ප්‍රජාවන්ට සිදුකෙරෙන මර්දනය හා පොලිස් වදහිංසාවන්ට විරෝධතාවය ප්‍රකාශ කිරීමටයි. ජාතික ගීය ගැයෙන අවස්ථාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් නැගී සිටිය යුතු යැයි එක්සත් ජනපද සොකර් ෆෙඩරේෂණය රෙගුලාසියක් නිකුත් කළ බැවින් ඇය නැගී සිටින නමුත් ජාතික ගීය ගායනා නොකරන්නීය.

එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ඇයගේ මෙම ක්‍රියාව හෙළාදකින අතර මෑතක දී මෝර්ගන් සහ ඇයගේ සහය ක්‍රීඩිකාවන් විසින් පිරිමි හා කාන්තා සොකර් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සමාන වැටුප් ගෙවන ලෙස කරන ලද යෝජනාවද ප්‍රතික්ෂේප කර තිබිණි.

එසේම කාන්තා සොකර් කණ්ඩායම එක්සත් ජනපද සොකර් ෆෙඩරේෂණයට විරුද්ධව නඩුවක් ගොනු කළේ එය සමානාත්මතාවය උග්‍ර ලෙස උල්ලංඝනය කරන බවට චෝදනා කරමිනි. එසේම පිරිමි සොකර් කණ්ඩායම



ලොකයේ 30වැනි ස්ථානයේ පවතින අතර කාන්තා කණ්ඩායම ප්‍රථම ස්ථානයේ පසුවෙයි. ඒ අනුව ඔවුන් සම වැටුප් ලැබීමට ඇති අයිතිය දක්ෂතාවයෙන්ද ඔප්පු කර තිබේ. මෝර්ගන් ප්‍රසිද්ධියේම ඩොනල්ඩ් ට්‍රම්ප් ලිංග භේදවාදී, ජාතිවාදී මෙන්ම යහපත් පුද්ගලයෙකු නොවන බවද ප්‍රකාශ කර සිටී.

### ස්විස් කාන්තාවන් සටන් බිමට



පසුගිය ජුනි 14 වන දා ස්විට්සර්ලන්තය පුරා කාන්තාවන් දහස් ගණනක් වීදි බැස උද්ඝෝෂණ ව්‍යාපාරයක නිරත වූයේ වැඩි වේතන ද, වැඩි සමානාත්මතාවයක් ද, වැඩි අභිමානයක් ද ඉල්ලා සිටිමිනි.

ස්විට්සර්ලන්තය පුරා කාන්තාවන්ට සම අයිතිය ඉල්ලමින් මේ ආකාරයේ උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් වූයේ වසර 28 කට පමණ පසුවය. විරෝධතා රට පුරා ක්‍රියාත්මක වූ අතර සංවිධායකයින් ප්‍රකාශ කොට සිටින්නේ කාන්තාවක් වීම හේතුවෙන් වෙනස්කොට සැලකීම්වලට මුහුණ දීමට සිදුවීම එරට සාමාන්‍ය තත්වයක් වී ඇති බවය. එසේම එය රටක් වශයෙන් පෙන්වන සංවර්ධනය හමුවේ කාන්තාවන්ට උරුම කර ඇති අසමානතාවය අදෘෂ්‍යමාන තත්වයකට පත්ව තිබෙන බව ද ඔවුහු පෙන්වා දෙති. රැකියාවල නියුතු කාන්තාවන් සලකා බැලූ විට ඔවුන්ගේ ඉපයීම් පිරිමින්ට වඩා 19%ක් අඩුය. එසේම ජාත්‍යන්තර ක්ෂමා ආයතනයට අනුව කාන්තාවන්ට සිදුවන ලිංගික අතවර ප්‍රමාණයද ඉහළ ගොස් තිබේ. ජුනි 14 පැවති උද්ඝෝෂණ සාර්ථක වීමෙන් පසු ඉල්ලීම් දිනාගන්නා තුරු ජාතිවාදයට හා ධනවාදයට එරෙහිව සටන් වැදීමට ඔවුහු බලාපොරොත්තු වෙති.

# රජයේ උපත හා ව්‍යාප්තිය




මෙතෙක් පැවතුණු ඉතිහාසය (ලිඛිත ඉතිහාසය) පංති සටන් ඉතිහාසයක් යැයි මාක්ස් - එංගල්ස් නිවැරදිවම පැවසූහ. එසේම මිනිසාගේ ලිඛිත ඉතිහාසය යනු රජය ව්‍යාප්ත කිරීමේ, ආක්‍රමණ හා යුද්ධ කිරීමේ ඉතිහාසයක්ද වේ. ලෝකයේ මුළු ඉතිහාසයම පිරී පවතින්නේ ආක්‍රමණවලින්, යුද්ධවලින් හා රාජ්‍ය බලය වෙනුවෙන් කළ කුමන්ත්‍රණවලිනි. එය ආරම්භ වන්නේ සමාජය තුළ දේපළ මත පංති බිහි වීමත් ඒ සමගම ඒ වෙනුවෙන් රජය නම් බලහත්කාරී ආයතනය බිහිවීමත් සමගය.

ඉතිහාසය තුළ රජය බිහිවීම ඉතාම සංකීර්ණ ක්‍රියාදාමයක් විය. එය විවිධ භූමි භාගයන් තුළ විවිධ ගෝත්‍ර තුළ විවිධ රටවල වෙනස් වෙනස් ආකාරයන්ගෙන් සිදු වන්නට ඇත. ඒතාක් ඒ හැමතැනකදීම රජය බිහි වීමේ පදනම වූයේ, රජය බිහි වීමේ හේතුව වූයේ අන් කිසිවක් නොව පෞද්ගලික දේපළ බිහිවීමය. පෞද්ගලික දේපළ බිහිවීමත් සමග සමාජය දේපළ මත ප්‍රධාන පංති දෙකකට බෙදිණි. ඒ දේපළ හිමි පංතිය හා දේපළ අහිමි පංතිය ලෙසය. මෙහිදී අප කලින්ද සඳහන් කර ඇති පරිදි රාජ්‍ය බලය ගොඩනගා ගත්තේ දේපළ හිමි පංතියය. ඒ පෞද්ගලික දේපළ ආරක්ෂා කර ගැනීමටත්, සූරාකෑමට හා තවතවත් දේපළ කොල්ලකෑමටත් දේපළ අහිමි පංතියේ ප්‍රතිවිරෝධය පාගා දැමීමටත්ය. ඒ අනුව හැම විටම දේපළ හිමි පංතිය පීඩක පංතිය වූ අතර දේපළ අහිමි පංතිය පීඩිත පංතිය විය.

## රජය පංති ප්‍රතිවිරෝධයේ ප්‍රකාශකයෙක් ලෙස

රජය බිහි වීම පිළිබඳ ඉතාම විද්‍යාත්මක විග්‍රහයක් කරන එංගල්ස් සිය 'පවුල පෞද්ගලික දේපළ හා රජය ඇති වූ සැටි' නම් කෘතියේ ඒ පිළිබඳ මෙසේ සඳහන් කරයි. **"රජය පැන නැගුණේ ප්‍රතිවිරෝධී පංතිවල අරගල වළක්වාලීම සඳහාය. නමුත් ඒ අතරම එය පැන නැංගේ මේ පංතිවල සට්ටනය මැදය. එය රීතියක් වශයෙන්, රජයේ මාධ්‍ය තුළින් දේශපාලනමය වශයෙන් බලපාන පංතිය බවට පත්වූයෙන් පැගෙන පංතිය යටපත් කිරීමට හා සූරාකෑමට අලුත් අලුත් මාධ්‍යයන් ලබා ගන්නා වූ, අතිශයෙන්ම බල සම්පන්න ආර්ථික වශයෙන් ප්‍රබල පංතියේ රජය වන්නේය."** (173 පිටුව)

එංගල්ස් ඉන් අවධාරණය කළේ පංති ප්‍රතිවිරෝධයන් වැළැක්වීමට රජය පැන නැගුණද එය අපංතික ආයතනයක් නොවූ බවත් එය දේපළ හිමි පංතියේ පීඩක උපකරණය වූ බවත්ය. ඒ නිසා රජය යනු පංති අතර සමාදානය සලසන සියලු පංතීන්ට සාධාරණව සලකන, අපක්ෂපාතී ආයතනයක් නොව දේපළ අහිමි පංතිය මැඩ සූරාකෑම සඳහා වූ දේපළ හිමි පංතියේ පංති උපකරණය බව පැහැදිලිය. මේ පිළිබඳව තම කෘතියේ එංගල්ස් යළිත් අවධාරණය කරයි. **"ඓතිහාසික රාජ්‍යයන් වැඩි හරියක, පුරවැසියන්ගේ අයිතිවාසිකම් කොටස් කර තිබෙනුයේ ඔවුන් සතු ධනය අනුවය. රජය ඒ අනුව අහිමි පංතියට එදිරිව හිමි පංතිය ආරක්ෂා කිරීම සඳහා වූ සංවිධානයක්ය යන්න කෙලින්ම ප්‍රකාශ කරයි."** (173 පිටුව)

මෙලෙස පෞද්ගලික දේපළ මත බිහිවූ රජය පෞද්ගලික දේපළ ආරක්ෂා කිරීම සඳහාත් තව තවත් දේපොළ (සම්පත් හා භූමිය) ගොඩගසා ගැනීම සඳහාත් ඒවා යළි පැහැර ගැනීම වැළැක්වීම සඳහාත් අවිගත් බලයක් ලෙස සංවිධානය වී ලොව පුරා මිනිස් ඝාතන යුද්ධ ආක්‍රමණ විශාල ප්‍රමාණයක් කරනු ලැබීය.

## ඉතිහාසයේ රාජ්‍ය වර්ග

ධනේශ්වර අධ්‍යාපනය තුළ ඉතිහාසය ඉගැන්වීමේදී බොහෝවිට රජවරුන් හා පාලකයන් උත්කර්ෂයට නැංවීම කර තිබේ. ලංකාවේ දුටුගැමුණු, මහා පරාක්‍රමබාහු, විජයබාහු ආදීන් උදාහරණ වේ. ලෝක ඉතිහාසයේද රණකාමී පාලකයින් හා රජුන් උත්කර්ෂයට නැංවූ අවස්ථා රැසක් තිබේ. රෝමයේ සීසර්, නැපෝලියන් බොනපාට්, මහා පීටර් සාර්, මහා අක්බාර් චින්ගිස්ඛාන්, මහා ඇලෙක්සැන්ඩර් එයට උදාහරණ කිහිපයක් පමණි. අනෙක් අතට ඉතිහාසය ඉගැන්වීමේදී රජවරුන්ගේ ඉතිහාසය ගමන් ගත් අයුරු උගන්වන ධනේශ්වර අධ්‍යාපනය ඉතිහාසයේ යුග පෙරළි හෙවත් සමාජ ක්‍රමයන්ගේ වෙනස් වීම් එලෙස උගන්වන්නේ නැත.

එහෙත් මාක්ස්වාදයට අනුව ඉතිහාසය තුළ මානව සමාජය ආ ගමනේදී එය සමාජ ක්‍රම හෙවත් නිෂ්පාදන මාදිලි කිහිපයක් පසුකර පැමිණ තිබේ. ඒවා නම් රජය බිහිවීමට පෙර තිබූ ප්‍රාථමික සාමූහික ක්‍රමය, ඉන් පසු රජය බිහිවීමෙන් පසු ඇති වූ වහල් හිමි ක්‍රමය, වැඩවසම් ක්‍රමය ඊට සමගාමීව ආසියාතික නිෂ්පාදන ක්‍රමය, ධනපති ක්‍රමය හා සංක්‍රමණීය අවධියක් වූ සමාජවාදී පරිවර්තන අවධිය වේ. මෙයට අදාළ රාජ්‍ය වර්ග 5ක් ඉතිහාසය විසින් බිහි කර ඇත. ඒ I. වහල් හිමි රාජ්‍යය II. වැඩවසම් රාජ්‍යය III. ආසියාතික ක්‍රමයේ රාජ්‍ය IV. ධනේශ්වර රාජ්‍යය හා V. සමාජවාදී රාජ්‍යයයි. මෙහිදී සමාජවාදී රාජ්‍යය යනු සමාජය ධනවාදයේ සිට කොමියුනිස්ට්වාදය වෙත සංක්‍රමණය වීමේදී ඒ සඳහා සංක්‍රමණීය අවධියක රාජ්‍යය වේ.

## ඉතිහාසය භෞතිකවාදී ලෙස

මාක්ස්වාදයට අනුව ඉතිහාසය තුළ මෙම සමාජ ක්‍රමවල වෙනස්කම් කරනු ලැබුවේ 'දෙවියන්' හෝ රජවරුන් නොව, සමාජ සංවර්ධනයේ නියාමයන්ට අනුව නිෂ්පාදන බලවේග යන්ගේ දියුණුව විසිනි. ඒ අනුව සමාජයේ සෑම පිම්මක්ම සෑම සමාජ විප්ලවයක්ම නිර්මාණය කිරීමේ හේතුව වූයේ භෞතික හේතුවකි. ඒ නිෂ්පාදනය හා නිෂ්පාදන උපකරණයන්ගේ සංවර්ධනයයි. නිෂ්පාදන උපකරණයන්ගේ සංවර්ධනය හෙවත් නිෂ්පාදන බලවේගවල වර්ධනය විසින් සෑම විටම ඊට ගැලපෙන නිෂ්පාදන සබඳතාවක්ද නිර්මාණය කරන අතර එම නව සබඳතාවය නව සමාජ ක්‍රමයකට උපත ලබා දී ඇත. සියලු රජවරුන්, යුද වීරයන් හා ප්‍රභූන් විසින් සිදුකර ඇත්තේ එකී සමාජ සංවර්ධනයට අනුව තමන්ට ඉතිහාසය තුළ පැවරෙන කාර්යය ඉටුකිරීමය. රජුන් හෝ වීරයන් විසින් ඉතිහාසය නිර්මාණය කරනවා නොව ඉතිහාසය විසින් රජුන් හා වීරයන් නිර්මාණය කරන බව මාක්ස්වාදය පවසන්නේ මේ අනුවය.

ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී හා එහි සිදුවීම් ඉගෙන ගැනීමේදී ඉහත පදනම මත පිහිටා අධ්‍යයනය කිරීම ඉතිහාසය නිවැරදිව වටහා ගැනීමට උපකාරී වේ.

ඉතිහාසය සංයුක්ත විෂයකි. ඉතිහාසයේ සෑම සිදුවීමක්ම, සෑම සොයාගැනීමක්ම එකිනෙකට බැඳුණු පැහැදිලි හේතු සාධක මත සිදුවන ඒවා වේ. රාජ්‍ය වර්ග වෙනස් වීම, විද්‍යාවේ තාක්ෂණයේ බිහිවීම, කලාවේ වර්ධනය, ආගම බිහිවීම හා ඒවායේ වෙනස්කම්, දේශපාලනයේ වෙනස්කම් ආදී සියල්ලම සමාජ සංවර්ධනයේ වුවමනාවන් සමඟ බැඳුණු හා එකිනෙකට අන්තර් සම්බන්ධ දේවල් වේ. ඒ නිසා ඉතිහාසය ඉගෙන ගත යුත්තේ, මේ සියල්ල වෙන වෙනම මෙන්ම එකටද අධ්‍යයනය කරමිනි.

කෙසේ වෙතත් සමාජය තුළ දේපළ මත රාජ්‍ය බිහිවීම සෑම තැනකම එක ආකාරයකින් සිදු වී නැත. එක් එක් රටවල භූමි ප්‍රදේශ තුළ මෙය විවිධාකාරයෙන් සිදුවූ බව පැහැදිලිය. ඒ සඳහා සෑම රටකම ඉතිහාස කතන්දර, ජනශ්‍රැතියේ කථා හා 'නිල' ලෙස පිළිගත් ඉතිහාස කතාද ඇත. එබැවින් ලොව පුරා රාජ්‍ය බිහිවූ ආකාරය හා එය පැතිර ගිය ආකාරයද වටහා ගැනීම වැදගත්ය. මීළඟට ඒ ගැන කතා කරමු.

> මාක්ස්වාදයට අනුව ඉතිහාසය තුළ මෙම සමාජ ක්‍රමවල වෙනස්කම් කරනු ලැබුවේ 'දෙවියන්' හෝ රජවරුන් නොව, සමාජ සංවර්ධනයේ නියාමයන්ට අනුව නිෂ්පාදන බලවේගයන්ගේ දියුණුව විසිනි. ඒ අනුව සමාජයේ සෑම පිම්මක්ම සෑම සමාජ විප්ලවයක්ම නිර්මාණය කිරීමේ හේතුව වූයේ භෞතික හේතුවකි. ඒ නිෂ්පාදනය හා නිෂ්පාදන උපකරණයන්ගේ සංවර්ධනයයි.



"රජය ඒ අනුව සදාකාලිකව පැවති එකක් නොවේ. රජය හා රාජ්‍ය බලය පිළිබඳ විකල්පනයක් නැති, රජය රහිත සමාජ පැවැතිණි. සමාජය පංතිවලට බෙදීයාම නිසා ආර්ථික සංවර්ධනයේ එක්තරා අවධියකදී රජය පැන නැගි අතර එය මේ බෙදීම සමග අවශ්‍යයෙන්ම බැඳී ඇත."

**එංගල්ස්**
**පවුල පෞද්ගලික දේපල හා රජය ඇතිවූ සැටි,**
**174 පිටුව**

# ශ්‍රී ලංකා ආර්ථික දේහයේ මව මරා දමන
# කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය පැවරීම



ශ්‍රී ලංකා වරාය අධිකාරිය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විශාල පංගුවක් සැපිරීම සඳහා ඉමහත් කැප කිරීමක් සිදුකර ඇත. භාණ්ඩ ප්‍රවාහනය සහ ප්‍රති අපනයන කටයුතු සිදුකිරීම තුළින් විශාල ආදායමක් හිමිකර ගනිමින් පාඩු නොලබන ආයතනයක් ලෙස මේ දක්වා පවත්වාගෙන යනු ලබයි. කෙසේ වුවද මෙම තත්වයට කණ කොකා හඬමින් පවතී. එසේ වන්නේ නාවික ක්ෂේත්‍රයේ ලෝකයේ හොඳම වරායක් ලෙස පවතින ශ්‍රී ලංකාවේ වරායන් විදෙස් සමාගම් විසින් අත්පත් කර ගැනීමට පැවති රජයන් හා වත්මන් රජය කටයුතු කිරීම හේතුවෙනි.

80 දශකයේදී ලෝකයට හඳුන්වාදෙනු ලැබූ බහලුම් මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම තුළින් කොළඹ වරායටද ඊට අනුගත වීමට සිදුවිය. එය ජය ගැනීම සඳහා කොළඹ වරායේ සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් කටයුතු සිදුකළ රැජින පාලම වෙත බහාලුම් මෙහෙයුම් සිදුකිරීම සඳහා ග්‍රැන්ට් දොඹකර (බහලුම් මෙහෙයුම් දොඹකර) දෙකක් සවිකර පසුව තවත් එක් දොඹකරයක්ද සවිකිරීම මගින් රැජින ජැටිය බහාලුම් මෙහෙයුම් ප්‍රවාහනය සඳහා සූදානම් කිරීමට කොළඹ වරාය සමත් විය. එහිදී බහාලුම් ගබඩා කිරීමේ හැකියාව 20,000ට පමණ සීමාවීම හේතුවෙන් ජපාන ජයිකා වැඩපිළිවෙළ යටතේ ජය බහාලුම් පර්යන්තය ගොඩනංවනු ලැබිණි. එවකට පැවති බහාලුම් ප්‍රවාහන නෞකා සඳහා වරායේ පැවති මීටර් 14ක ගැඹුර ප්‍රමාණවත් විය. ජය බහාලුම් පර්යන්තයේ බහාලුම් 50,000ක් පමණ ගබඩා කිරීමේ හැකියාවක් අත්පත් කර ගැනීම හේතුවෙන් 90 දශකයේ ලෝකයේ හොඳම වරායක් ලෙස නමක් දිනා ගැනීමට කොළඹ වරායට හැකි වූ අතර අන්තර්ජාතික නාවික වෙළඳ කටයුතු සඳහා ඍජුව සම්බන්ධ වෙමින් රටට විශාල ධනයක් උපයා ගැනීමට කොළඹ වරායට හැකි විය.

1999 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට පළමු ප්‍රහාරය එල්ල කරුණු ලැබුවේ එවකට චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුව විසිනි. කොළඹ වරායේ බහාලුම් පර්යන්තයක් වූ එලිසබත් රැජින පාලම (SAGT (South Asia Gateway Terminal) විකුණා දැමීම මගින් වරාය අධිකාරිය එතෙක් අත්පත් කර ගෙන තිබූ බහාලුම් ධාරිතාව පහළ ගියේය. අන්තර්ජාතික නාවික වෙළඳාමේ ඉදිරි පියවරයන් ලෙස නැව් සමාගම් විසින් විශාල නෞකා මගින් බහාලුම් ප්‍රවාහනය කිරීම ආරම්භ කරන ලදී. 90 දශකයේ අගභාග යේදී නැව් සමාගම් බහාලුම් ප්‍රවාහනය කිරීම සඳහා විශාල නෞකා නිෂ්පාදනය කළ අතර එම නෞකා මුහුදු මට්ටමේ සිට ගැඹුර මීටර් 15 දක්වා පැවතිණ. එම අභියෝගය ජය ගැනීමට නම් ගැඹුරින් වැඩි වරායන් අවශ්‍ය විය.

### විකිණීමේ ඉතිහාසය

කොළඹ වරායේ පැවති වරායන්හි ගැඹුර මීටර් 14 වූ බැවින් විශාල බහාලුම් ප්‍රවාහන නෞකා ඇතුල්වීමට නොහැකිවීම හේතුවෙන් කොළඹ වරායට පිටතින් මීටර් 18ක ගැඹුරින් යුතු කොළඹ දකුණු වරාය ව්‍යාපෘතිය සඳහා 2006.12.18 දින පැවති රජය විසින් මුල් ගල තබන ලදී. දිය කඩනය ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 350ක මුදලක් ලබා ගනිමින් 2008 වර්ෂයේදී එහි වැඩකටයුතු ආරම්භ කරනු ලැබිණි. ප්‍රධාන දිය කඩනයේ දිග මීටර් 5140 වූ අතර දෙවැනි දිය කඩනයේ දිග මීටර් 1700ක් විය. දිය කඩනයන් නිර්මාණය වූ පසු ඒ තුළ පර්යන්තයන් තුනක් ඇති කිරීමේ හැකියාව පැවතිණ. ඒ අනුව 2013 වර්ෂයේදී (දිය කඩනය නිම වීමෙන් පසු) කොළඹ දකුණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ එහි දකුණු කොටස දිග මීටර් 1200ක පර්යන්තයක් ගොඩනැගිය හැකි ප්‍රමාණයක් CICT (Colombo International Container Terminal ) සමාගම වෙත පැවරිණි. එය ආරම්භ වීමත් සමග මේ වන විට ගැඹුරින් වැඩි විශාල නෞකා මෙහෙයුම් කටයුතු සියල්ල සිදුකරනු ලබන්නේ CICT සමාගම විසිනි. දැනට එම සමාගමේ මෙහෙයුම් ධාරිතාවය උපරිමය දක්වා පැමිණ ඇත. ගැඹුරින් වැඩි පර්යන්තයක අවශ්‍යතාවය කොළඹ වරායට අවශ්‍ය වන හෙයින් එහි නැගෙනහිර කොටස මීටර් 1200ක දිගින් යුතු නැගෙනහිර පර්යන්තයද ඊට සමගාමීව ගොඩනගනු ලැබිණි. එහි මීටර් 440ක පමණ ප්‍රමාණයක පර්යන්තය 2014 වසර තුළදී අවසන් කරන ලද අතර එහි ග්‍රැන්ට් දොඹකර 04ක් සවිකර ක්‍රියාත්මක කිරීමේ හැකියාව පැවතිණ. මෙම දොඹකර සඳහා රාජපක්ෂ ආණ්ඩුව වංචා සහගත ලෙස වැඩි මිලකට ටෙන්ඩර් ප්‍රදානය කිරීමට උත්සාහ දැරීම හේතුවෙන් මහත් මතභේදකාරී තත්වයක් ඇතිව තිබිණි. කෙසේ වුවද 2015 බලයට පත් වත්මන් ආණ්ඩුව, දොඹකර මිලදී ගැනීම සඳහා වරාය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා අනුමැතිය ලබා නොදී එය ඉන්දියාව වෙත පැවරීම සඳහා විටින් විට උත්සාහ කරමින් සිටියේය. කෙසේ වුවද වෘත්තීය සමිති හා ජ.වි.පෙ. මැදිහත්වී එම උත්සාහයන් අවස්ථා ගණනකදී පරාජය කරනු ලැබීය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය රටේ සේවා අවශ්‍යතා සඳහා මුදල් උපයා දුන් ආයතනයකි. වරාය අධිකාරිය මගින් ඉපයූ මුදල්වල වගකීම මහා භාණ්ඩාගාරය මගින් පාලනය වූ අතර රටේ අධ්‍යාපනය, සෞඛ්‍ය, මහමාර්ග, ප්‍රවාහනය, ක්‍රීඩා ඇතුළු මහජන සේවාවන් සඳහා මුදල් ලබා දුන් ආයතනයකි. මෙම ආයතනය හුදෙක් වරාය සේවකයන්ට හිමිකමක් ලෙස පවතින ආයතනයක් නොවේ. එය සමස්ත රටේ ජනතාවට අයිති සම්පතකි.

හම්බන්තොට වරායද 2017 වර්ෂයේදී වත්මන් රජය මගින් විරෝධතාවන් නොසලකා චීනය වෙත 99 අවුරුද්දකට පවරා දෙනු ලැබීය. නුදුරු අනාගතයේදී මෙමගින් කොළඹ වරායට බලපෑම් එල්ල නොවනු ඇතැයි කිසිවෙකුටත් කිව නොහැකිය. මේ වන විට වරාය අධිකාරිය යටතේ පවතින්නේ කොළඹ, ත්‍රිමලේ, ගාල්ල, ඔලුවිල්, කන්කසන්තුරේ යන වරායන්ය. වරාය අධිකාරියේ සේවක සංඛ්‍යාව 10,000ක් වන අතර සියලු වරායන්හි නඩත්තු සේවා සහා ආරක්ෂක කටයුතු එම සේවකයන් විසින් සිදුකරනු ලබයි. මෙම සේවකයන්ගේ සියලු කටයුතු සඳහා වැඩි මූල්‍ය දායකත්වයක් ලබා දෙන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොළඹ වරායෙන් උපයන මුදලෙනි.

### අවසන් හිමිකමත් විදේශයට

කොළඹ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහාලුම් මෙහෙයුම් ධාරිතාව සීග්‍රයෙන් අඩුවෙමින් පවතී. මීට ප්‍රධාන හේතුවක් වනුයේ කොළඹ වරාය තුළ ගැඹුරින් වැඩි CICT පර්යන්තය පෞද්ගලික අංශය විසින් ක්‍රියාත්මක කිරීමත් ගැඹුරින් අඩු SAGT සමාගම (රැජින පාලම) ක්‍රියාත්මක වීම මගින් පෞද්ගලික සමාගම් බහාලුම් මෙහෙයුම් උපරිමය දක්වා පැමිණීමත් සමග ජය බහාලුම් පර්යන්තයේ බහාලුම් මෙහෙයුම් ධාරිතාව පහළ බැස ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය තවදුරටත් ලාභ ලබන තත්වයෙන් පවත්වා ගැනීමට නම් අනිවාර්යයෙන් නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් ක්‍රියාත්මක කළ යුතුය. එමගින් බහාලුම් ධාරිතාව 80,000 දක්වා පවත්වාගෙන යා හැකිය. එහෙත් වත්මන් ආණ්ඩුව 2019 මැයි 28 දින ඉන්දියාව, ජපානය හා ශ්‍රී ලංකාව අතර සහයෝගිතා ගිවිසුමක් අත්සන් කළේය. එමගින් ශ්‍රී ලංකාවට 51%ද ඉන්දියාව හා ජපානයට කොටස් 49%ක්ද පිරිනැමීමට එකඟ වී ඇත. ඉදිරි මාස දෙකක කාලයකදී තවත් කරුණු ඇතුළත් කරගනිමින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය. මෙමගින් ඩොලර් මිලියන 500ක ණය මුදලක් ලබා දෙන බවත් යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමත් පර්යන්තයේ ඉතිරි මීටර් 860ක කොටස ඉදිකිරීමට හැකි බවත් ඉදිරි කටයුතු එම සමාගම විසින් සිදුකරන බවත් සභාපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිණ. එහෙත් වරාය සතු 51%ක කොටස වෙනත් පාර්ශවයකට පිරිනැමීමට හැකි වන පරිදි හා ඉන්දියාවට එය ලබා ගැනීමට හැකි වන අයුරින් ගිවිසුමට ඇතුළත් වීම හේතුවෙන් පවතින කොටස් ප්‍රමාණය රැක ගැනීමට අවස්ථාවක් නොමැත. මේ අනුව මෙම ගිවිසුම රටට විශාල බලපෑමක් එල්ල කළ හැකි ගිවිසුමක් ලෙස දැනටමත් තහවුරු වේ.

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය රටේ සේවා අවශ්‍යතා සඳහා මුදල් උපයා දුන් ආයතනයකි. වරාය අධිකාරිය මගින් ඉපයූ මුදල්වල වගකීම මහා භාණ්ඩාගාරය මගින් පාලනය වූ අතර රටේ අධ්‍යාපනය, සෞඛ්‍ය, මහමාර්ග, ප්‍රවාහනය, ක්‍රීඩා ඇතුළු මහජන සේවාවන් සඳහා මුදල් ලබා දුන් ආයතනයකි. මෙම ආයතනය හුදෙක් වරාය සේවකයන්ට හිමිකමක් ලෙස පවතින ආයතනයක් නොවේ. එය සමස්ත රටේ ජනතාවට අයිති සම්පතකි.** නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට පැවරීම මගින් රටට ඇතිවිය හැකි අනාරක්ෂිතභාවයට ඉඩ නොදී කටයුතු කළ යුතුව ඇත. මෙය රැක ගැනීම සඳහා ගුරුවරුන්, දෙමාපියන්, වෛද්‍ය හෙද, රෝහල් කාර්යය මණ්ඩල, ප්‍රවාහන පද්ධතියේ සේවක පිරිස්, විශ්වවිද්‍යාල සිසුන් දෙමාපියන්, ආචාර්ය මහචාර්යවරුන් ඇතුළු රටේ සමස්ත ජනතාවම මැදිහත් විය යුතුව තිබේ.

**ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.**

2019 ජුනි 04

# නැගෙනහිර ජැටිය ඉන්දියාවට දුන්නේ දකුණු වරාය චීනයට දීමට හිලව්වටද?

(ස්ථාවර නියෝග 27/2 යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින්)

## ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක අනුර දිසානායක සහෝදරයා



කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තය අවබෝධතා ගිවිසුමක් යටතේ ඉන්දියාවට සහ ජපානයට පවරා දී ඇති බවට වන පුවත් හේතුවෙන් පැනනැගී ඇති ගැටලුකාරී තත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

කොළඹ වරායේ වැදගත්ම කොටසක් වූද, විශාල නැව් පැමිණිය හැකි ලෙසට 2015දී නවීකරණය කර තිබුණාවූද, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් නැගෙනහිර බහාලුම් පර්යන්තය හෙවත් නැගෙනහිර ජැටිය, ඉන්දියාවට සහ ජපානයට පැවරීමට ආණ්ඩුව විසින් පසුගිය 28දා ගිවිසුම් අත්සන් කර ඇති බවට මාධ්‍ය වාර්තා කළා.

සමාජයේ සියලු දෙනාගේම අවධානය වෙනත් දේවල්වලට යොමුවෙලා තිබෙන වෙලාවක, සමාජයේ විවිධ ගැටලුකාරී සහ අර්බුදකාරී තත්වයක්, ව්‍යසනකාරී තත්වයක් මතුවෙලා තිබෙන වෙලාවක, ආණ්ඩුව ඉතාම කුමන්ත්‍රණකාරී හා සැලසුම් සහගත ලෙස පසුගිය 28වන දා මෙම ගිවිසුම අත්සන් කොට කොළඹ වරායේ නැගෙනහිර ජැටිය ඉන්දියාවට සහ ජපානයට පවරා දී තිබෙනවා.

මෙම ජැටිය ලංකා බැංකුවේ ඩොලර් මිලියන 80ක ණය මුදලක ආධාරයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2015දී නවීකරණය කර තිබුණා. එහි ඉතිරි වැඩකටයුතු අවසන් කර මෙහෙයුම්වලින් ලාභ ලබාගැනීම සඳහා කළ යුතු කාර්යයන් පිළිබඳව වරාය වෘත්තීය සමිති විසින් ඒ කාලයේම ආණ්ඩුවට යෝජනාද ඉදිරිපත් කර තිබුණා. කෙසේ වුවද ආණ්ඩුව පසුගිය කාලය පුරාවටම එම යෝජනා සැලකිල්ලට ගත්තේ නැහැ. විශේෂයෙන්ම එම යෝජනා මත පදනම් වෙමින් හිටපු වරාය අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයට කරන ලද යෝජනාවක් ප්‍රතික්ෂේප කරන ලද බවද වාර්තා වුණා.

මා දන්නවා, අර්ජුන රණතුංග මහත්මයා වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා හැටියට කටයුතු කරන කොට, එම නැගෙනහිර ජැටිය වරාය අධිකාරිය අතේ තබාගෙන, එහි හිමිකාරිත්වය වරාය අධිකාරිය සතුව තබාගෙන, එම ජැටිය රටේ ආර්ථිකයට ඉවහල් වන විධියට, ආර්ථිකයට ප්‍රතිලාභ ලැබෙන විධියට මෙහෙයවිය යුත්තේ කෙසේද කියන එක පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ බව. නමුත් තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය කළේ මොකක්ද? එම කැබිනට් පත්‍රිකාව ප්‍රතික්ෂේප කළා. හැබැයි, මේ කැබිනට් මණ්ඩලය, එය ඉන්දියාවට සහ ජපානයට පවරා දෙන්න හදනකොට නවීන් දිසානායක අමාත්‍යතුමා පවා එකහෙළාම අත ඔසවනවා.

> ආණ්ඩුව එය රහසේම විදෙස් රටවල් දෙකකට පැවරීමට තීරණය කර තිබෙනවා. පසුගිය 28 දින හදිසියේම ඉන්දියානු මහකොමසාරිස්වරයා, ජපාන තානාපතිවරයා හා වරාය ඇමතිවරයා අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් එහි පාලනය එම රටවලට පවරා දී ඇතැයි වාර්තා වුණා. මේ වන විට කොළඹ වරායේ 'සවුත් ඒෂියා ගේට්වේ' බහාලුම් පර්යන්තය ජෝන් කීල්ස් සමාගම මගින් පාලනය වනවා. 'කලම්බු ඉන්ටනැෂනල්' බහාලුම් පර්යන්තය චයිනා මර්චන්ට් හෝල්ඩිං සමාගම මගින් පාලනය වනවා. මෙලෙස විදෙස් අයිතියකට පවරා දී ඇත්තේ විශාල නැව්වලට අදාළ මෙහෙයුම් සිදු කළ හැකි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු එකම ජැටියයි.

මෙවැනි තත්වයක් තුළ **ආණ්ඩුව එය රහසේම විදෙස් රටවල් දෙකකට පැවරීමට තීරණය කර තිබෙනවා. පසුගිය 28 දින හදිසියේම ඉන්දියානු මහකොමසාරිස්වරයා, ජපාන තානාපතිවරයා හා වරාය ඇමතිවරයා අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් එහි පාලනය එම රටවලට පවරා දී ඇතැයි වාර්තා වුණා. මේ වන විට කොළඹ වරායේ 'සවුත් ඒෂියා ගේට්වේ' බහාලුම් පර්යන්තය ජෝන් කීල්ස් සමාගම මගින් පාලනය වනවා. 'කලම්බු ඉන්ටනැෂනල්' බහාලුම් පර්යන්තය චයිනා මර්චන්ට් හෝල්ඩිං සමාගම මගින් පාලනය වනවා. මෙලෙස විදෙස් අයිතියකට පවරා දී ඇත්තේ විශාල නැව්වලට අදාළ මෙහෙයුම් සිදු කළ හැකි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු එකම ජැටියයි.**

වාර්තා වන අන්දමට ආණ්ඩුව විසින් මෙම ගිවිසුමට එළඹීමේ හදිසි තීරණය ගෙන තිබෙන්නේ ඉන්දියානු මැතිවරණයේ ප්‍රතිඵල අනුව මෝදි නැවතත් අගමැති ධුරයට පත්වන බවට ස්ථිර වෙමින් තිබියෙදී ඉන්දියානු බලපෑමට නතු වීමෙනුයි.

නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය ඉදිරියට ගෙනයාම හැරෙන්නට වෙනත් විකල්පයක් නොමැති ආණ්ඩුව සිදුකරමින් සිටින්නේ කවරාකාරයේ හෝ නාමකරණයක් යටතේ ස්වභාවික සම්පත් සහ රාජ්‍ය දේපළ අයිතිය අත්හැර දැමීමයි. රාජ්‍ය දේපළක් ලෙස තබාගනිමින් ලාභ ලැබිය හැකිව තිබූ මෙම නැගෙනහිර බහාලුම් පර්යන්තය විදෙස් රටවලට පැවරීමද එහිම දිගුවක් වන බව පැහැදිලියි. විශේෂයෙන් මේ හේතුවෙන් වරායේ සේවය කරන 10,000ක් පමණ වන සේවකයන්ගේ රැකියා අහිමිවීමේ අවදානමක් ඇතිවන බවට වෘත්තීය සමිති චෝදනා කරනවා. කොළඹ වරාය වැනි ආර්ථික මර්මස්ථානයක මෙබඳු රාජ්‍ය අයිතිය අත්හැරීමක් රටේ ආර්ථික ස්වාධීනත්වය පාවාදීමක් බවද ප්‍රකාශ වනවා.

විශේෂයෙන් චීනය කොළඹ වරාය ආශ්‍රිතව ස්ථාන ගත වීම නිසා ඉන්දියාවටද එහි ස්ථානගත

15 වැනි පිටුවට

2019 ජුනි 04

# ජාතිවාදය ලිහා දැමුවාට පසු ඕනෑ මොහොතක බෝතලයට දමා ගත නොහැකියි

(තේ පර්යේෂණ මණ්ඩල සංශෝධන පනත පිළිබඳ විවාදයට එක් වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා



අපේ තේ අපනයනයේදී මැද පෙරදිග රටවල්, ඒ වාගේම ඉරානය, රුසියාව වාගේ රටවල් විශාල වශයෙන් වැදගත් වෙනවා. මීට මාස 4කට කලින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණා, ඉරානයට එරෙහිව සම්බාධක පැනවීම සම්බන්ධ ගැසට් පත්‍රයක්. එය විදේශ කටයුතු අමාත්‍යාංශය සකස් කර තිබුණා. ඒ ගැසට් පත්‍රය ගැන අපි ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ප්‍රශ්න කළා. මොකද, ඇමෙරිකාවට ඉරානයත් එක්ක තිබෙන ප්‍රශ්නය වෙනම එකක්. ඒවා මත පදනම් වෙලා ලංකා ආණ්ඩුව ඉරානයට තහංචි පනවන්න ගියොත් ඇති වන තත්වය පිළිබඳව අපි ප්‍රශ්න කළා. එතැනදී විදේශ කටයුතු අමාත්‍යාංශය යම්කිසි පැහැදිලි කිරීමක් කර තිබුණා. මේවා ඇමරිකානු සම්බාධක නොවෙයි. මේවා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්බාධක කියලා. කෙසේ වුවත්, අප දකින දේ තමයි, ඇමරිකාව සහ ඉරානය අතර තිබෙන ප්‍රශ්නය නිසා රටක් වශයෙන් ශ්‍රී ලංකාව විශාල පීඩාවකට ලක් වෙලා තිබෙනවාය කියන එක. මෙහි ඇති වැදගත්ම කාරණය තමයි, විදේශ කටයුතු අමාත්‍යාංශය එවැනි දෙයක් කරද්දී - ඇමරිකාව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන නිසා සම්බාධක පනවන්න මෙහේ ගැසට් ගහද්දී- අඩුම ගණනේ තේ මණ්ඩලයෙන් වත් ඒ ගැන විමසා තිබුණේ - අහලා තිබුණේ- නැති එක.

අනෙක් කාරණය තමයි, රටේ අභාග්‍යයට, විවිධ හේතු නිසා දැන් රුපියල කඩාගෙන වැටිලා ඩොලර් එකේ වටිනාකම වැඩි වෙලා තිබීම. ඩොලර් එක රුපියල් 175ට, 178ට, 180ට ගියත් තේ දලු හිමියාගේ දලුවලට ලැබෙන මිල වෙනස් වන්නේ නැහැ. රුපියල කඩාගෙන වැටීමෙන් වන ඔක්කොම නරක දේවල් ඇතුළේ අපනයනය කරන අයට යම්කිසි වාසියක් ලැබෙනවා. නමුත්, ඒ වාසිය තේ දලු හිමියාට යන්නේ නැහැ. දලු හිමියාට ලැබෙන්නේ, දලු කිලෝවකට රුපියල් 85, 90, 95 අතර මුදලක්ම පමණයි. ඒ නිසා පහළ මට්ටමේ සිටින තේ දලු නිෂ්පාදනය කරන පුද්ගලයන්ට ඒ වාසිය නොලැබීමේ ප්‍රශ්නය තිබෙනවා.

තේ කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් සෙස් අරමුදලක් පවත්වාගෙන ගියා. දැන් ආණ්ඩුව කර තිබන දේ මොකක්ද? දැන් තේ වලින් එන සෙස් බද්ද සහමුලින්ම -සියයට සියයක්ම- කෙළින්ම යන්නේ භාණ්ඩාගාරයට. ඒ සෙස් අරමුදල දැන් සහමුලින්ම භාණ්ඩාගාරය විසින් ගිල ගන්නා නිසා තමයි කුඩා තේ වතු හිමියන් ඇතුළු තේ වතු හිමියන්ට පොහොර සහනාධාරය ලබා දීමේදී, නැවත පැළ වගා කිරීමේදී අවශ්‍ය සහන ලබා දෙන්න බැරි වෙලා තිබෙන්නේ. මොකද, ඕනෑම කර්මාන්තයක දියුණුව සඳහා පාවිච්චි කරන්න තමයි මෙවැනි අරමුදල් තිබෙන්නේ.

සහරාන්ලාගේ බෝම්බයෙන් පස්සේ මේ රටේ සමස්ත මුස්ලිම් ප්‍රජාවම ඉලක්ක කරගෙන, ඉතා දැනුවත්ව ඇතැම් අය යම් යම් කටයුතු කළා. 21වැනි දා සිද්ධ වූ ඒ අන්තවාදී ප්‍රහාරය නිසා මුස්ලිම් ජනතාවට එරෙහිව සාමාන්‍ය ජනතාව තුළ ස්වාභාවිකව විවේචනයක, විරෝධයක්, හැඟීමක් එන එක අපට පිළිගන්න පුළුවන්. නමුත්, එහෙම නොවී, යම් පිරිසක් මේ සිද්ධිය අමු අමුවේ දේශපාලන ව්‍යාපාරයක් බවට පත් කරගෙන, නඩත්තු කළා. ඒක ඉතාම දුර්දාන්ත ආකාරයෙන් සිද්ධ වුණා. මුස්ලිම් මනුස්සයෙක් කියන්නේ ත්‍රස්තවාදියෙක් කියන ඒ Islamophobia එක මේ රටේ ජනමාධ්‍යවලින් තදට හැදුවා. ඒකෙන් වාසි ගත්ත දේශපාලන ව්‍යාපාරයක්, විශේෂයෙන් විපක්ෂයේ රාජපක්ෂ මැතිතුමාගේ පක්ෂයේ ඉන්න සැලකිය යුතු කණ්ඩායමක් හිටියා. නමුත් ඒ පක්ෂයේ ඔක්කම මන්ත්‍රීවරු නොවෙයි. මම ඒක වගකීමෙන් කියනවා. සැලකිය යුතු ලෙස ජාතිවාදී උන්මත්තකයන් වාගේ කටයුතු කරන පිරිසක්, සහරාන්ගේ සිංහල සහෝදරයන් කියලා හඳුන්වන්න පුළුවන් මට්ටමේ පිරිසක්, ඒ ගොල්ලන්ගේ media channels බලයත් යොදා ගෙන දැවැන්ත විරෝධයක් හැදුවා. එක්සත් ජාතික පක්ෂයේ සමහර මැති ඇමතිවරුත් ඒකට යටින් support කළා. මොකද, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඡන්ද දිනන්න සිංහල ජාතිවාදය ඕනෑ. අපි ඒක දන්නවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ කරන කථාව නොවෙයි, එතුමන්ලාගේ ආසනයේදී කළේ. අපි ඒකත් දන්නවා.

එක පැත්තකින් මේ ත්‍රස්ත ප්‍රහාරය ගැන දැනුවත්ව ඉඳලාත්, ඒක වළක්වන්න කටයුතු කරපු නැති ජනාධිපතිවරයා, අගමැතිවරයා ඇතුළු මුළු ඇමති මණ්ඩලයම ඒකට වගකිව යුතු නිසා, මුස්ලිම් ඇමතිවරුනුත් ඒ වගකීමට අයිතියි. ඒ නිසා ඒ අය ඉල්ලා අස්වුණාට කමක් නැහැ. හැබැයි, මුස්ලිම් ඇමතිවරු පමණක් ඉල්ලා අස්වෙලා හරි යන්නේ නැහැ. ඔවුන් මුස්ලිම් වීම නිසා නොවෙයි මේකට වගකියන්න ඕනෑ. ඇමතිවරු වීම නිසායි. නමුත් ප්‍රශ්නය ගෙනාවේ කොතැනටද? අමු ජාතිවාදී විධියට සහමුලින්ම මුස්ලිම් ජනතාවට විරුද්ධ තැනකටයි ප්‍රශ්නය ගෙනාවේ.

> ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඉල්ලා සිටින්නේ මෙයයි. මුස්ලිම් ජනතාව රට පැත්තට - ශ්‍රී ලංකාව පැත්තට- දිනා ගැනීම වෙනුවෙන් කළ යුතු හැම දේම කළේ නැත්නම් මේ අන්තවාදය බෝවෙනවා; ව්‍යාප්ත වෙනවා; මුළු රටම විනාශයට පත් වෙනවා. ඒක තමයි අපි පසුගිය දවස්වල දැක්කේ. ජනාධිපතිවරයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන්, අගමැතිවරයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන්, රාජපක්ෂ මහත්මයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන් තමයි කටයුතු කළේ.

15 වැනි පිටුවට

කවුළුව හැරමි තබමි

# ඔහු යනු 'මිනිස් යුගයකි'



ඔහු මිනිසෙකි. නිකම්ම නිකම් මිනිසකු නොව මිනිස් සමාජයක්, එනම් මානවවාදී සමාජයක් උදෙසා සටන් වැද ඒ වෙනුවෙන් සිය ජීවිතය පවා පුද කළ මිනිසෙකි. එනිසාම ඔහු යුගයකි. යුගයේ මිනිසා ඔහුම විය. ලාංකේය සමාජ ඉතිහාසයේ යුග මිනිසා ඔහුය. ඔහු උපන්නේ 1942 ජූලි 14 වැනිදාය. තංගල්ලේ දී උපන් මේ පුංචි මිනිසා පසුව අපේ යුගයේ විප්ලවීය යෝධ මිනිසා බවට පත් විය. ඔහු නමින් රෝහණ විජේවීරය.

ලාංකේය ඉතිහාසයේ පරිච්ඡේදයක් අලුත් කළ මිනිසා ඔහුය. අද සිටියා නම් ඔහුගේ වයස අවුරුදු 76කි. එහෙත් ඔහුට ජීවත් වීමට හැකි වූයේ වසර 46ක් පමණි. එම වසර 46ක කෙටි කාලය තුළ ඔහු ලාංකේය සමාජයට කළ මෙහෙය ඉතිහාසයේ කිසිවෙකුටත් සමකළ නොහැකිය. ලංකාවේ ප්‍රථම වෘත්තීය විප්ලවවාදියා වූයේද ඔහුය.

ධනේශ්වරයට කත් ඇද අතරමං කර දමා තිබූ ලාංකේය වමේ ව්‍යාපාරය නිවැරදි මාවතට ගෙන, දෙපයින් නගා සිටවූ වූයේ අන් කවරකුවත් නොව රෝහණ විජේවීර සහෝදරයාය.

මාක්ස්වාදය හා සමාජවාදය ලාංකේය සමාජයට අනුරූපව ප්‍රතිනිර්මාණය කළ නිර්මාණාත්මක විප්ලවවාදියා වන්නේද රෝහණ විජේවීරයන්මය.

"අප ගොඩනැගිය යුත්තේ අප පසුපස ගාටන මිනිසුන් නොව අප අභිබවා යන මිනිසුන්ය." මේ ඔහුගේ මුවින් නිතර පිට වූ වදන්ය. අවුරුදු 46දී සතුරා විසින් ඔහුව අපෙන් උදුරා ගන්නා ලදී. එහෙත් ඔහු පැළ කළ විප්ලවීය පක්ෂය මහා වෘක්ෂයක් බවට පත් වී තවමත් දළුලා වැඩෙයි. එය සිඳවිය නොහැකි උල්පතක් බවට අද පත්ව ඇත. රෝහණ විජේවීරයන් යුගයක් වන්නේද ඒ නිසාමය. සතුරා ඔහුව මරා දැම්මේය. නමුත් සතුරාට ඔහුව පරාජය කළ නොහැකි විය. එය ඉදිරියටත් එසේමය.

# රාජපක්ෂ නර නාටක සහ විශ්වාසභංගය

අප්‍රේල් 21 උමතු අන්තවාදී ම්ලේච්ඡ ප්‍රහාරයේ උණුසුම ලාංකේය සමාජයෙන් තවමත් මැකී ගොස් නොමැත.

ඒකාබද්ධ විපක්ෂය මෙම ම්ලේච්ඡ ප්‍රහාරයේ වගකීම එක් පුද්ගලයෙකුට ලසු කොට ඔහු පිට දමා ව්‍යාජ විශ්වාසභංගයක් අටවා එම ප්‍රහාරයේ වගකීමෙන් ආණ්ඩුව ගලවාගැනීමේ සුපුරුදු ජඩ සූදුවේ නියැලුණේය. පසුව අදාළ ඇමතිවරයා සිය ධුරයෙන් ඉල්ලා අස්වීමත් සමග එම කුප්‍රකට දීන ප්‍රයත්නයෙන් ගැලවී ගියේ ඔවුන් ඇඳ සිටි රෙදිය.



මේ අන්තවාදී ප්‍රහාරයේ වගකීම මූලිකවම පවතින සමස්ත ආණ්ඩුවම ගත යුතු බවත් ආණ්ඩුව එහි වගකීමේ මූලිකයා බවත් ජනතාවට හා රටට ආරක්ෂාව සැපයිය නොහැකි ආණ්ඩුව වහා ඉල්ලා අස්විය යුතු බවත් අවධාරණය කරමින් ජ.වි.පෙ. විසින් සමස්ත ආණ්ඩුවට එරෙහිව විශ්වාසභංගයක් ඉදිරිපත් කළේ මේ අතරය. අද වලංගු වී ඇති එකම විශ්වාසභංගයද එය පමණි.

මුලදී මෙම විශ්වාසභංගයට එරෙහිව ඒකාබද්ධ විපක්ෂය ඇතුළු සකලවිධ සතුරන් ජ.වි.පෙ.ට විරුද්ධව අනේකවිධ අපවාද හා චෝදනා නගමින් එයට විරෝධය දක්වන ලදී. නමුත් දැන් ඒකාබද්ධයේ මෙන්ම විපක්ෂයේ ද නායකයාද වන මහින්ද රාජපක්ෂ ප්‍රසිද්ධියේම පවසා සිටින්නේ ජ.වි.පෙ. ගෙනා විශ්වාසභංගයට සම්පූර්ණ සහාය දෙන බවය. දැන් ජ.වි.පෙ.ට අවලාද නැගූ සතුරන්ගේ මුඛ පූට්ටු වී ඇත. "කන්න ඕනෑ වූ විට කබරගොයා තලගොයා කර ගන්නවා" යැයි කියන්නේ මෙවැනි වැඩවලටය.

මේ ආණ්ඩුව බලයට පත් වූ දා සිට අවුරුද්දේ හැම වෙසක් පෝයකටම පෙර ගෙදර යවන්නේ යයි කියමින් පාරම්බෑ රාජපක්ෂ නඩයට, ඒ සඳහා ගත් සෑම ප්‍රයත්නයක්ම දැන් ගඟට කැපූ ඉනි ගාණට වැටී ඇත. අවසානයේ ඔවුන් එල්ලී සිටින්නේ ජ.වි.පෙ. විශ්වාසභංගයේය. කෙසේ වුවද මෙම විශ්වාසභංගයෙන් පරාජය කළ යුතුව ඇත්තේ මේ ආණ්ඩුව පමණක් නොව ඉහත වර්ගයේ ජනතා ද්‍රෝහීන් සියලුදෙනාය.

# වඩු බාස් සහ මක බාස්



අපේ රටේ වත්මන් ජනාධිපතිවරයා අරුම පුදුම කතා කීමට නම් හරිම රුසියෙකි. ඔහු බලයට පත් වූ විගස කීවේ රටේ දූෂිතයන් සහ මිනීමරුවන් එල්ලා දමන බවය. ඒ සඳහා වූ කඹයක්ද ආනයනය කළේය. දැන් අලුගෝසුවන් තේරීමේ වගකීම තමා භාරගන්නා බව ඔහු ප්‍රකාශ කරයි. ඊළඟට ඔහු කියා ඇති තවත් රසවත් කතාවක් වන්නේ ගිය වෙසක් පෝයට පෙර රටේ කසිප්පු වුවද මුළුමනින්ම තුරන් කරන බවය. තවත් රසකතා බොහෝය. ඒ අතරට එක්තු වූ අලුත්ම රසකතාව වන්නේ ලංකාවේ වඩු මඩු වසා දැමීමේ කතාවය. ඔහුට අනුව ලංකාවේ කැලෑ විනාශ කිරීමෙන් පරිසර දූෂණය කිරීමේ ප්‍රධාන වගකිවයුත්තා වන්නේ වඩුවා සහ වඩුමඩුය. ඔහු කියූ පරිදි ඉදින් ලංකාවේ ඊට එකම උත්තරය වඩුමඩු වැසීමය. ඉන්පසු වඩු කර්මාන්තයේ නියුක්ත වූවන්ට වෙනත් රැකියාවක් සොයාගැනීමට අවුරුදු පහක් කල් දෙන්නේය. උපාධිධාරීන් ඇතුළු ලක්ෂ සංඛ්‍යාත පිරිසකට රැකියා නැති මේ රටේ වඩුවන්ට රැකියා සොයා ගැනීමට නම් අඟහරු ග්‍රහයා වෙතටම යායුතුය. අවුරුදු පහක් කල් දී ඇත්තේ ඒ නිසා විය හැක. එක්තරා රටක විකට නළුවෙකු ජනාධිපති වී ඇති බව වාර්තා වූයේ මේ මෑතකදීය. විකටයෙකුට පිස්සු හැදී ඔහු යම් රටක නායකයා වුවහොත් ඒ රටට කුමකින් කුමක් සිදුවේදැයි සිතා ගැනීමටවත් නොහැක.

කැලෑ පාළු දේශපාලුවෝ තම සාක්කුවේ දමාගෙන ආරක්ෂා කරමින් අහිංසක වඩුවන්ගෙන් පලිගන්නා ලෝකයේ එකම නායකයා ඉන්නේ අපේ රටේම පමණි. ශ්‍රී ලංකා 'ස්පෙෂල්' කියන්නේ මේවාටය. "මේව අහල පණ පලයන් ලබන සුමානේ" කියලා කොල්ලන් කියන්නේ නිකමට නොවේ.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක උදේ එන ගමන් පංතිය ඉස්සරහ කොරිඩෝවෙ බර කතාවකට සෙට් වුණා, හිස්ටීරියාව එක්ක. ළමයි කනට ඇහෙන නෑහෙන ගාණට කතාව. සද්දෙ වැඩි වුණොත් පොලිටික්ක පංතියට ආපහු එයි කියල. ඊත් ඉස්සරහ පේළිවල හිටපු සමහරු කිවුවෙ කෑනොගහ හිටපල්ල කියන්නෙ මොනවද කියල අල්ලගන්න පුළුවන් වෙයි කියල. සෑහෙන වෙලාවකට පස්සෙ හිස්ටීරියාව ඔරලෝසුව දිහා බලල දුවන්න පටන් ගත්තාම පොලිටික්ක පංතිය ඇතුළට ආවා.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය 'ගුඩ්' කියන්නම දතකට මැදගෙන හිටිය.

"ගුඩ් මෝනිං සර්" අනුරුද්දිය වසන්තියගෙම කම්පන තරංගයක් වගෙ.

"ගුඩ් මෝනිං ළමයිනේ... හැබැයි ගුඩ් කිවුවට අහන්න ලැබෙන දේවල්නම් හොඳ ඒවා නෙමෙයි" පොලිටික්ක අත් දෙකෙන් මූණ පිහදාගෙන කතාව පටන් ගන්නකොට පොත් දිග ඇරගෙන හිටපු දෙතුන්දෙනත් ඒවා වහල දැම්ම.

"අද විශේෂ මොකද්ද සර්, අති විශේෂද? පෙරාපු රත්තරන්ද රත්තරන් පෙරාපුවද?" මංජුව දඟ පන්දුවක් දාලා බැලුව.

"මොන අති විශේෂද ළමයෝ?" පොලිටික්ක පන්දුව නිදැල්ලේ ඇරිය.

එහෙනම් බෝම්බද සර්? බොම්බයි ළූණුද? බොම්බයි මොටයිද?" මංජුව 'බොම්' භාෂාවෙන් ප්‍රශ්නයක් දැම්ම.

"බෝම්බ මොනවද? අම්මල 4000ක් වඳකරලලු" පොලිටික්ක අලුත් සොයාගැනීමක් වගේ කියනව.

"අයියෝ සර්, පරණ කතාවක්නෙ. ඕසෙට පැමිණිලි කරන් ආවට දැන් ඒක බොරුවක් කියල එළිවේගෙනත් යනව නේද?" කනියත් දන්න දේවල්.

"ඕකුන්ව මෛත්‍රී මහත්තය කරන්න හදනව වගේ එල්ලල මරන්න තියෙන්නෙ" පොලිටික්ක ඇහුණෙ නෑ වගේ යනව.

"ඕකුන්ව කිවුවෙ සර්, අපේ අහිංසක කනියද? අනේ පවු සර්.." චමිය කම්මුලේ අත තියාගත්ත.

නෑ ළමයිනේ... කවුරුහරි මේ අපරාධ කළානම් ඒ අය" පොලිටික්ක ටිකක් විතර වමට කැපුව.

"හැබැයි මහින්ද මහත්තයනම් කියල තිබුණෙ මරණ දඬුවමට විරුද්ධයි කියල නේද සර්?" මංජුවගෙන් වේග පන්දුවක්.

"ආ ඔව්. රනිල් මහත්තයත් විරුද්ධයි කියල තිබුණ." අනුරුද්දියත් මැද සාලෙ කතාවක් රිපීට් කළා.

"ඇත්තද... මහින්ද මහත්තය එහෙම කියල තිබුණද? පොලික්ක අප්ඩේට් නැතුව අන්දුන් කන්දුන් "...එහෙනම් ඒ ගැන හිතල බලන්න වෙනව නේද?" පොලිටික්ක හෙමිහිට රිවස් ගියර් එකට මාරු වුණා.

"රට පාලනේ කරපු අය අද ඔය විරුද්ධයි කියන්නෙ බොරුවට. එයාල මරන්න නියෝග දෙනකොට ඔහොම හිතුවෙ නෑනෙ. 'ධර්මිෂ්ඨ සමාජයක්' කියල බෝඩ් ගහගෙන ආපු ජේආර්ල ප්‍රේමදාසල රනිල්ල එල්ලල මැරුවෙ නැහැ. ඊත් දාස් ගාණක් මැරුව. මල් වට්ටි අරන් පන්සල් ගාණෙ ගියපු මහින්ද මහත්තයත් කවුරුවත් එල්ලල මැරුවෙ නැහැ. ඊත් එයාට මරන්න ඕන වුණ අයව මැරුව" සමන කීප දෙනෙක් මරපු විදිහත් පෙන්නන ගමන්.

"ඒ කියන්නෙ නීතියෙන් මැරුවෙ නෑ, නීති විරෝධීව මැරුව කියන එකද?" චමිය පැහැදිලි කිරීමක් ඉල්ලනව.

"නීතියට අනුවත් මැරුවා. නීති විරෝධීවත් මැරුවා. නීති නැත්නම් නීති හදල හරි මැරුව. එයාලට මරන්න ඕන වෙච්ච අයව මැරුව. නීතී බාධාවක් කරගත්තෙ නෑ. අද එයාලා විරුද්ධයි කියන්නෙ රැල්ලට. දැන් සමාජයෙ ශිෂ්ට සම්පන්න වෙන්න ඕන කියල කතාවක් තියෙනවනෙ. ඉතින් එයාලා තමන්ගෙ ඇත්ත වුවමනාකම් හංගගෙන අද බොරුවට සිල් ගන්නව, අපිට පේන්න" සමනගෙ කතාව අස්සෙ පීරියඩ් එක ඉවරවෙන බෙල් එක වදිනව ඇහිල තියෙන්නෙ පොලිටික්කට විතරයි.

## රටේ අභියෝග...

05 පිටුවෙන්

කාර්යයන් දෙක අපේ න්‍යාය පත්‍රයේ මේ මොහොතේ ප්‍රමුඛ කාරණා ලෙස තියෙනවා.

***නියමුවා:- අවසාන වශයෙන් මේ සම්බන්ධයෙන් ඔබ ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔව්, වසර 71ක් ධනපති දේශපාලන කණ්ඩායම් දෙකකට මාරුවෙන් මාරුවට රැවටුණ අපේ ජනතාව යළිත් එම රැවටීමට ලක්විය යුතු නැහැ. වසර 71ක් ආණ්ඩු පිහිටුවා වැටුණ වළේ නැවත වැටිය යුතු නැහැ. දැන් ඉන් ගොඩ එන මඟක් සෙවිය යුතුයි. දැන් මඟක් තිබෙනවා. ධනපති පාලකයන් විසින් විනාශ කළ මේ රට ගොඩනැගිය හැකි ප්‍රතිපත්ති හා හැකියාව සහිත නව ජනතා මධ්‍යස්ථානයක් දැන් බිහිවෙනවා. ඒ නිසා අඳුරු අතීතය වෙනස් කර ආලෝකමත් අනාගතයකට පිය නගන්න කැමති වමේ, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී, දේශප්‍රේමී, හා අවංක හැම දෙනාටම, සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනාටම අප සමඟ, මේ නව ජනතා මධ්‍යස්ථානය සමඟ අත්වැල් බැඳගන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

## සමාජවාදය තුළදී...

09 පිටුවෙන්

පාපන්දු පිට්ටනි 1,08,000ක්, බාස්කට් බෝල, ටෙනිස් සහ අත්පන්දු පිට්ටනි 4,00,000ක් තිබුණි. සෝවියට් දේශය තුළ ක්‍රීඩා සමාජ සාමාජිකත්වය සඳහා කිසිදු මුදලක් අය නොකෙරිණි.

ඉරිදා සතියේ ප්‍රධාන ක්‍රීඩා දිනය විය. එදින ඇතැම් විට මුළු පවුලම කඳු නැගීමට ගියහ. සමහරු හිම මත ලිස්සායාමට කැමැති වූහ. සමහරු ඇවිදීමට ගියහ. තවත් සමහරු පිහිනීම සඳහා පිහිනුම් තටාක වෙත ගියහ. පවුල් පිටින් ක්‍රීඩාව සඳහා ගෘහස්ත ක්‍රීඩාගාර, ක්‍රීඩා කඳවුරු, ක්‍රීඩා පිට්ටනි, උද්‍යාන වෙත ගියහ.

විනෝද චාරිකා යාම සෝවියට් පුරවැසියන් සිය විවේක කාලය ගත කළ තවත් ආකාරයකි.

සමාජවාදය තුළදී නිදහස් කාලයෙහි අයිතිය පුද්ගලයා සතු විය. එහෙත් ඔහු අයිති වූයේ සමාජයටයි. එබැවින් ඔහුගේ නිදහස් කාලය ඔහුගේත්, පවුලේත්, සමාජයේත් යහපැවැත්ම තහවුරු වන ආකාරයට ගතකිරීම පිළිබඳ සහතිකයක් සමාජයට අවශ්‍ය විය. සමාජවාදී රජය ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම, අවශ්‍ය මාධ්‍යයන් හා අවස්ථා උපරිම ආකාරයෙන් ලබාදීමට කටයුතු කළේය.

V. YAZYKOVA ගේ Socialist Life Style and The Family ඇසුරිනි.

## ඇත්ත ජනතා ප්‍රශ්න...

16 පිටුවෙන්

ලබාදුන් ඒ පොරොන්දුවට අනුවත් දැන් මේ ආණ්ඩුව ඉල්ලා අස්විය යුතුයි. ඒවගේම වසර හතරක් තිස්සේ මේ රට අරාජික කරපු ආණ්ඩුවට තවදුරටත් රට පාලනය කරන්න කිසිදු අයිතියක් නැහැ. ඒ නිසාම මේ ආණ්ඩුව ඉල්ලා අස්විය යුතුයි. දැන් රට ඉබාගාතේ යනවා. පාලකයෝ තමන්ට වෙඩි නොවදින වාහන මිලට අරගෙන පාර්ලිමේන්තුවේ සී.සී.ටී.වී. කැමරා හයිකරගෙන තමන්ගේ ආරක්ෂාව හදාගන්නවා. නමුත් ජනතාවගේ ආරක්ෂාව අයාලේ යනවා. තේරීම් කාරක සභාවේදී නිලධාරීන්ගේ සාක්ෂිවලින් පස්සෙත් ජනාධිපතිවරයා කරමින් තිබෙන්නේ කුමක්ද? තමන්ගේ අඩුපාඩු හදා ගන්නවා වෙනුවට ජනාධිපතිවරයා 21 ප්‍රහාරය සම්බන්ධයෙන් ඇත්ත තොරතුරු ලබාගන්න ජනතාවට අවස්ථාව උදා කරපු පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව අකර්මණ්‍ය කරන්න උත්සාහ කරනවා. මහින්ද රාජපක්ෂ කණ්ඩායමත් එයට උදව් කරමින් ඉන්නවා. අපි ජනාධිපතිවරයාගෙන් අහනවා, ජනතාවට ඇත්ත තොරතුරු ලබා ගැනීමට අයිතියක් නැද්ද කියලා.”

මෙම අවස්ථාවට ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික ලක්ෂ්මන් නිපුණාරච්චි සහෝදරයාද සහභාගි විය.

## මහජන ආරක්ෂාව...

16 පිටුවෙන්

අර්ජුන් මහේන්ද්‍රන් එකඟ නොවීම නිසා විශාල පාඩුවක් සිදුවී ඇති බව තහවුරු වෙනවා. එනිසා ජනාධිපති කොමිෂන් වාර්තා විසින් නිර්දේශ කර තිබෙනවා, එම ගනුදෙනුවේ පාඩුව වන රු. මිලියන 688 අර්ජුන මහේන්ද්‍රන්ගෙන් අයකර ගත යුතු බව. එය ඉතාම වැදගත් නිර්දේශයක්.

රටේ අධිකරණයටත් බැහැර කරන්න බැහැ දේශපාලන සම්බන්ධතා. අර්ජුන මහේන්ද්‍රන් ලංකාවට කැඳවීම, ඔහු මහ බැංකු අධිපතිවරයා ලෙස පත්කිරීම, මුදල් අමාත්‍යාංශය යටතේ තිබුණ මහ බැංකුව අගමැතිවරයා යටතට ලබාගැනීම, අර්ජුන මහේන්ද්‍රන්ගේ බෑනා තැරැව්කරුවෙකු බව දැන දැනම මහ බැංකු අධිපති තනතුර ලබාදීම, කෝප් පරීක්ෂණවලදී ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් තොරතුරු එළියට ලබාදීම, විගණකාධිපතිවරයාට ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් බලපෑම් කිරීම, අගමැතිවරයා විසින් ඔවුන්ට වාසිදායක ලෙස පිටිපන කමිටුව පත්කිරීම, යන සියල්ල මෙම ගනුදෙනුවට සම්බන්ධ දේශපාලන සම්බන්ධතාවයක් තිබෙනවා. ඒ වගේම රවී කරුණානායක අමාත්‍යවරයාට තමන්ගේ ඇමතිධුරය අහිමි වුණේ පර්පචුවල් සමාගම සමග සම්බන්ධතා තිබුණු නිසයි. ඔහුට නැවත ඇමතිධුරය ලැබුණේ නිවැරදි වූ නිසා නොව දේශපාලන බලය නිසයි. එම නිසා රවී කරුණානායක තවමත් නිවැරදි වෙලා නැහැ. එම නිසා මෙම දේශපාලකයින්ගේ සම්බන්ධතාවය නිලධාරීන්ගේ සම්බන්ධතාවය සහ අනෙකුත් චෝදනා ලැබූ සියලුම දේශපාලනඥයින් අධිකරණය හමුවට ගෙන ආ යුතුයි.

මෙම බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් වෝහාරික විගණනයක් සිදුකළ යුතු බව කෝප් කමිටුවෙන්ද නිර්දේශ කොට තිබෙනවා. මෙම වෝහාරික විගණනය විදෙස් සමාගම්වලට ලබාදීමේ සූදානමක් තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 900ක් වැයවන බව ගණන් බලා තිබෙනවා. නමුත් මෙම වෝහාරික විගණනය විදෙස් සමාගමකට ලබාදීම පිළිබඳව අපිට බරපතළ සැකයක් මතුවෙනවා. මොකද මෙහි ඇතැම් දුරකතන සංවාද තිබෙන්නේ සිංහල භාෂාවෙන්. ඒවා භාෂා පරිවර්තනයකට ලක්කළ යුතුයි. මේවා ගැන සලකා බලද්දී විදෙස් සමාගමකට ලබාදීම කල් මැරීම සඳහා කරන උපක්‍රමයක් බව පැහැදිලියි.”

## නැගෙනහිර ජැටියේ...

16 පිටුවෙන්

අපි අහනවා මෙම වරාය නැගෙනහිර ජැටිය විකිණීම ගැන මොකද කියන්නේ කියලා. කරු ජයසූරිය එ.ජා.ප.යේ අපේක්ෂකයා ලෙස කතාබහක් තිබෙනවා. ඔහු සිය මතය ප්‍රකාශ කළ යුතුයි. ඒ වගේම සජිත් ප්‍රේමදාස ගැනත් කියවෙනවා. ඔහුටත් රටේ ජාතික ප්‍රශ්න ගැන මතයක් නැහැ. ඒ වාගේම පොහොට්ටු පක්ෂයේ අපේක්ෂකයා ලෙස කියැවෙන ගෝඨාභය රාජපක්ෂ තම මතය ප්‍රකාශ කළ යුතුයි.

නැගෙනහිර ජැටිය විකණීම නතර කිරීමේ සටන ජයගත යුතුව තිබෙනවා. හම්බන්තොට වරාය විකුණනකොට අපි සටනක් කළා. ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කළා. නමුත් විකුණන එක නතර කරගන්න බැරිවුණා. ඉඩම් ටිකක් බේරගන්න පුළුවන් වුණා. දකුණු කොළඹ වරාය චීනයට දුන්නා. නමුත් ඒ වෙලාවේ සැලකිය යුතු සටනක් පැනනැගුණේ නැහැ.

අපේ රටේ ගොඩක් සටන් තියෙනවා, රට ජාතිය රැකගැනීමේ සටන්. නමුත් එම සටන් ජාතික වශයෙන් ප්‍රමාණවත් නැහැ කියලා තමයි අපිට තියෙන අදහස. අපේ රටට ස්වාධීන ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස ස්වාධීනව නැගී සිටින්න ජාත්‍යන්තර බලවේග ඉඩ දෙන්නේ නැහැ. තමන්ගේ යටතට ගන්න උත්සහ කරනවා. ප්‍රශ්නය තිබෙන්නේ අපේ රටේ පාලකයෝ එම බලපෑම්වලට යටත් වෙලා ඉන්නේ.

ත්‍රෛනිකායික මහනායක ස්වාමීන්වහන්සේලාගෙන් ඉල්ලනවා, මේ ගැන අවධානය යොමු කරන්න කියලා. ඒ වගේම අපේ රටේ කාදිනල්තුමාටත් ආරාධනා කරනවා මේ සටනට එකතු වෙන්න කියලා. අපි වරාය ඇතුළේ සටන ආරම්භ කරලා තිබෙනවා. මේ සටන ප්‍රගතිශීලී සටනක් කියලා හිතනවානම් රට ජාතිය ගැන හිතන සියලු දෙනාට මේ සටනට එකතු වෙන්න කියලා අපි ආරාධනය කරනවා.”

## පසුගිය 21වැනි දින...

13 පිටුවෙන්

වීමේ බලවත් වුවමනාවක් තිබූ බව පැහැදිලියි. පසුගිය මහින්ද රාජපක්ෂ පාලනය මෙහි ඉතාම වැදගත්, දකුණු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ලබා දුන්නේ චීන සමාගමක් වෙත බව, ඒ නිසා ඉන්දියාවෙන් නිරන්තරයෙන් බලපෑම් එල්ල වුණා. වරායේ නැගෙනහිර ජැටිය ඉන්දියාවට ලබා ගැනීම වෙනුවෙන්, ආණ්ඩුව සිදුකර ඇති මෙම ගිවිසුම අත්සන් තැබීම, පෙර තත්වයට හිලව් කප්පම් ගෙවීමක් ලෙස හැඳින්විය හැකියි.

විශේෂයෙන් රටේ ජනතාවගේ අවධානය වෙනත් දිශාවකට යොමු වී ඇති මොහොතක ආණ්ඩුව විසින් ජනතාවට රහසේ හදිසියේම මෙම ගිවිසුම අත්සන් තැබීම මෙම සභාවේ අවධානයට ලක්විය යුතු යැයි සිතනවා.

මේ තත්වය තුළ පැන නගින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

1.රටේ මුදල් ආයෝජනය කර නවීකරණය කරන ලද නැගෙනහිර බහාලුම් පර්යන්තයේ වැඩ අවසන් කොට ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ වෘත්තීය සමිති ඇතුළු වරාය අධිකාරියේ යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබුවේ මන්ද?

2. කොළඹ වරායේ නැගෙනහිර ජැටියේ පාලනය ඉන්දියාවට සහ ජපානයට පවරා දීමේ ක්‍රියාවලිය මේ වන විට අවසන් වී තිබේද?

3. විදෙස් රටකට පැවරීමෙන් තොරව නැගෙනහිර ජැටිය වැඩි දියුණු කළ නොහැකි බවටත්, ලාභ ලැබිය නොහැකි බවටත්, තීරණය කළේ කවුරුන් විසින්ද? ඒ සඳහා උපයෝගී කර ගන්නා ලද නිර්ණායකයන් කවරේද?

4. වරාය ජැටිය ඉන්දියාවට පැවරීම සඳහා ආණ්ඩුවට යම් බලකිරීමක් හෝ ඒ අන්දමේ කවර හෝ බලපෑමක් විදෙස් රටකින් ලංකාවට සිදුවීද? එසේ වී නම් ඒ කවර රටකින් ද? ඒ කුමන ආකාරයෙන් ද?

5. පසමිතුරු බල කඳවුරු දෙකකට කොළඹ වරායේ හිමිකම් පැවරීම, පැවති පාලනය කොළඹ වරායේ දකුණු ජැටිය චීනයටත්, පවතින පාලනය කොළඹ වරායේ නැගෙනහිර ජැටිය ඉන්දියාවට සහ ජපානයටත් පැවරීම, කොළඹ වරාය යුදමය වශයෙන් අනාරක්ෂිත වීමට බල නොපාන්නේද? ඒ පිළිබඳව ආණ්ඩුවට ඇති සහතිකය කුමක්ද?

6. රටේ ආර්ථික මර්මස්ථානවල පාලනය රාජ්‍ය පාලනයෙන් ගිලිහීම රටේ ආර්ථික ස්වෛරීභාවයට තර්ජනයක් බව ආණ්ඩුව විසින් පිළිගනු ලබන්නේද? මේවා රාජ්‍ය අයිතියේ තබා ගනිමින් වැඩිදියුණු කිරීමට ආණ්ඩුවට කටයුතු නොකරන්නේ මන්ද ?

## මේ මොහොතේ නිවැරදිම...

මම ඒකට උදාහරණ දෙකක් කියන්නම්. මොකද, ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපට හොඳට අත්දැකීම් තිබෙනවා. අදහස් තිබෙනවා. මේ හදිසි නීති, අර නීති, මේ නීති, සමාන්‍ය, සාධාරණ මිනිසුන්ට විරුද්ධව පාවිච්චි කරන්නේ කොහොමද කියලා. ඔබතුමන්ලා දන්නවා. 1987, 1990 කාලයේ තරුණයන් අත්අඩංගුවට ගෙන මරපු බව. යුද්ධය කාලයේ, දෙමළ වීම නිසා අවුරුදු දෙක, තුන, හතර පහ නිකරුණේ අත්අඩංගුවේ තබා ගත්ත දෙමළ මිනිස්සු හිටියා. අද ඒ තත්වයටම මුස්ලිම් ජනතාවත් පත් කරමින් තිබෙනවා. මම ඊට උදාහරණ දෙකක් කියන්න කැමැතියි. මහියංගනයේදී කාන්තාවක් අත්අඩංගුවට ගත්තා ඇයගේ ඇඳුමේ නැවක සුක්කානමක පින්තූරයක් තිබුණාය කියලා. ඇය අත්අඩංගුවට ගත්ත එකත් වැරදියි. ඊළඟට, ඇය රිමාන්ඩ් කළා. ඇප දිය නොහැකි ආකාරයට. ICCPR කියන එක්සත් ජාතීන්ගේ ඒ සම්මුතියට අත්සන් කර තිබෙන නිසා. ඒ පනත මහජනතාවගේ සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කරන්න තිබෙන පනත පාවිච්චි කරලා අර කිසිම දෙයක් දන්නේ නැති දුප්පත්, නූගත් කාන්තාව රිමාන්ඩ් කළා. ඇප දෙන්න බැරි විධියට. පොලිසියෙන් මා දන්නා තරමින් ඊයේ තමයි ඇයට ඇප දුන්නේ. ත්‍රස්තවාදී කාන්තාවක් නම් ධර්ම චක්‍රය හෝ නැවක සුක්කානම ඇඳුමේ ගහගෙන යනවාද? හොඳ posh ඇඳුමක් ඇඳගෙන යන්න පුළුවන්නේ.

මම තව උදාහරණයක් කියන්නම්. මීට මාසයකට කලින් පුත්තලමේදී අත්අඩංගුවට ගත්තා, මුස්ලිම් කාන්තාවක් ඇයගේ ස්වාමි පුරුෂයා එක්ක. ඇයගේ නම ෆාතිමා රිනෝසා. ඇය අත්අඩංගුවට ගත්තේ මොකටද? අත්අඩංගුවට ගත්තේ මුහුණ අර්ධ වශයෙන් වහ ගෙන ගියා කියලායි. මුහුණ වහගෙන යන්න එපා කියලා තිබියදී මුහුණ වහගෙන යන එකේ වැරැද්දක් තිබෙනවා තමයි. හැබැයි, ඇයව රිමාන්ඩ් කළේ කොහොමද? ඇයව රිමාන්ඩ් කරලා තිබෙන්නේ මේ ICCPR එක යටතේ. මා දන්නා තරමට ඇය මාස නවයක ගැබිණි කාන්තාවක්. ඇය රිමාන්ඩ් බන්ධනාගාරයේ තවමත් ඉන්නවා. දරුවා හම්බවෙන්න ළඟයි. මේ ආණ්ඩුවේ නිලධාරින්ට උපදෙස් දීල තිබෙනවා. මොකක්ද? ඉතාම දරුණු ඇප දිය නොහැකි පනත් යටතේ මේ පුද්ගලයන්ව සිරගත කරන්න කියලා.

ඒක නිසා අපි කියන්න කැමැතියි, මේක ජාතිවාදී බිල්ලෙක් බව. මේ අන්තවාදී බිල්ලා මුස්ලිම් සමාජයත් ගිලගෙන තිබුණා. ඒ තමයි සහරාන්ලා. රාජපක්ෂ මහත්මයාත් පසු ගිය කාලයේ ජාතිවාදය ක්‍රමානුකූලව පෝෂණය කළා. දැන් රාජපක්ෂ මහත්මයාත් ඒ ජාතිවාදී බිල්ලාගේ බෙල්ල මුලට අහුවෙලා තිබෙනවා. ජාතිවාදය ලිහා දැම්මාට පස්සේ තමන්ට ඕනෑ වෙලාවට බෝතලයට දමා ගන්න බැහැ. අද රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා මේ ජාතිවාදයට කැමැතියි. මොකද දැන් රටේ ආර්ථික ප්‍රශ්න ගැන මිනිස්සු මොකුත් කථා කරන්නේ නැහැ. බඩු මිල ගැන කථා කරන්නේ නැහැ. මේ ගැන තමයි කථා කරන්නේ.

**ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඉල්ලා සිටින්නේ මෙයයි. මුස්ලිම් ජනතාව රට පැත්තට - ශ්‍රී ලංකාව පැත්තට- දිනා ගැනීම වෙනුවෙන් කළ යුතු හැම දේම කළේ නැත්නම් මේ අන්තවාදය බෝවෙනවා; ව්‍යාප්ත වෙනවා; මුළු රටම විනාශයට පත් වෙනවා. ඒක තමයි අපි පසුගිය දවස්වල දැක්කේ. ජනාධිපතිවරයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන්, අගමැතිවරයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන්, රාජපක්ෂ මහත්මයා තමන්ගේ දේශපාලන වාසි වෙනුවෙන් තමයි කටයුතු කළේ.** රාජපක්ෂ මහත්මයා ළඟ එල්ලිලා සිටින සහරාන් වර්ගයේ සිංහල ජාතිවාදී කල්ලිය නිසා අද මොකක්ද සිදුවෙලා තිබෙන්නේ? අද මුළු රටම එකම ජාතිවාදී ගින්නකට ගිහිල්ලා තිබෙනවා. ඒක නිසා ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඉතාමත් වග කීමෙන් මේ කාරණය කියනවා. අපි විශ්වාසභංග යෝජනාව ඉදිරිපත් කරන කොට අපට කිවුවා. අපි ආණ්ඩුව රකින්නයි ඒක කරන්නේ කියලා.

හැබැයි, ජනතා විමුක්ති පෙරමුණේ අපි දුර දිග බලලා ඉදිරිපත් කළ විශ්වාසභංග යෝජනාව විතරයි දැන් තිබෙන්නේ. එම නිසා අපි රටේ ජනතාවට කියන්නේ ජාතිවාදයට කොටු වෙන්නට එපා; ජාතිවාදයට ගොදුරු වෙන්නට එපා; අන්තවාදයට ගොදුරු වෙන්නට එපා කියන එකයි. මුස්ලිම් මිනිහාට ගහලා දිනන්නට පුළුවන් දෙයක් නැහැ. එම නිසා අපි සිංහල, දෙමළ හෝ මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ දරුවෙකු නැති වුණේ නැහැ. මම research කරලා තිබෙනවා. තිස් අවුරුදු යුද්ධයෙන් එකදු සිංහල, දෙමළ හෝ මුස්ලිම් මන්ත්‍රීවරයෙකුගේවත් දරුවෙකු නැති වුණේ නැහැ. මම කියන්නේ නැහැ, එහෙම වෙන්න ඕනෑ කියලා. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් එකදු මන්ත්‍රීවරයකුගේවත් දරුවෙකු හෝ අඩුම තරමින් ඥාතියකුවත් නැති වුණේ නැහැ. යුද්ධයක් ආවොත් වන්දි ගෙවන්නේ, ජාතිවාදයෙන් වන්දි ගෙවන්නේ සාමාන්‍ය මිනිස්සුයි. එම නිසා සිංහල, දෙමළ, මුස්ලිම් අපි තුන්ගොල්ලන්ම එකතුවෙලා ජාතිවාදය පරද්දලා, අපේ මාතෘ භූමිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ජාතික සමගිය පැත්තෙන් ක්‍රියාමාර්ග තෝරා ගන්න ඕනෑ.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ආණ්ඩුවට ඉල්ලා අස්වන ලෙසට බල කර... කොළඹදී



ජාතික සමගිය වෙනුවෙන් යෝජනාවලිය රට හමුවේ තබා...




වෙනිසියුලාවට අත නොතබනු
විරෝධතා බැනරය අත්සන් තබමින්... කොළඹදී




ආණ්ඩුවට ඉල්ලා අස්වන ලෙසට බල කර... අනුරාධපුරයේදී




ආණ්ඩුවට ඉල්ලා අස්වන ලෙසට බල කර... පානදුරේදී



රට පාවා දෙන ආණ්ඩුවේ ගිවිසුම්වලට එරෙහිව... කොළඹදී

# ඇත්ත ජනතා ප්‍රශ්න වෙනුවෙන් ජ.වි.පෙ. උද්ඝෝෂණ මාලාවකට සූදානම්

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

ඇතැම් දේශපාලන කණ්ඩායම්වලට ජාතිවාදය අවුස්සමින් බලය ලබා ගැනීමේ අරමුණක් තිබෙන නමුත් ජනතා විමුක්ති පෙරමුණ ලෙස තමන් ජාතිවාදය යටපත් කොට ජනතාවගේ ඇත්ත ප්‍රශ්න පෙරමුණට ගැනීම සඳහා උද්ඝෝෂණ මාලාවක් සංවිධානය කර ඇතැයි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ප්‍රකාශ කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේ පැවසුවේ පසුගිය 10වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවක් අමතමිනි. වැඩිදුරටත් කරුණු දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද කියා සිටියේය.

"රට අරාජික කරපු, රට පාවාදෙන, රටේ සම්පත් විකුණන, ජනතාව මත බදු බර පටවන, ආණ්ඩුව ඉල්ලා අස්වන ලෙස බල කරමින් 12වැනිදා සිට ජනතා විමුක්ති පෙරමුණේ අපි දැවැන්ත උද්ඝෝෂණ මාලාවක් ආරම්භ කරනවා. ජ.වි.පෙ. සහ වෘත්තීය සමිති, ගොවි සංගම්, ධීවර සමිති සහ ජ.වි.පෙ.ට මිතුරු සංවිධාන ඇතුළු ප්‍රගතිශීලී මහජන බලවේග මෙම දැවැන්ත උද්ඝෝෂණ මාලාව සඳහා සහය ලබාදීමට නියමිතයි.

පසුගිය ඔක්තෝබර් 26වැනිදා කුමන්ත්‍රණය පරාජය කළාට පසුව මේ ආණ්ඩුව පොරොන්දු වුණා, කෙටි කාලයක් තුළ ජනතාවට ඡන්දයකින්



පස්සේ ආණ්ඩුවක් හදාගන්න අවස්ථාව ලබාදෙනවා කියලා. මොකද එම කුමන්ත්‍රණයෙන් පස්සේ කිසිදු කණ්ඩායමකට සදාචාරසම්පන්න ලෙස ආණ්ඩුවක් හදාගන්න අවස්ථාව තිබුණේ නැහැ. ඒ නිසා ජනතාවට කැමති ආණ්ඩුවක් හදාගන්න අවස්ථාවක් ලබාදිය යුතුව තිබෙනවා. ආණ්ඩුව

15 වැනි පිටුවට

# මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ සියලු දේශපාලකයින්ට දඬුවම් දිය යුතුයි

## ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

බැඳුම්කර ගනුදෙනුව සිදුවූ මොහොතේ පමණක් පාඩුව බිලියන 1.6ක් වන නමුත් ඊට අමතර වශයෙන් ඇති බිලියන 40ක ගනුදෙනුව සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් ආරම්භ වී නොමැති බවට චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, මෙම තත්වය තුළ පොලී අනුපාත 9% සිට 15% දක්වා ඉහළ ගිය බවත් සාමාන්‍ය ජනතාව ඉහළ ගිය පොලී අනුපාතවල බලපෑමට ලක්වී ඇති බැවින් බැඳුම්කර ගනුදෙනුවෙන් වාසි ගත් අගමැතිවරයාගේ සිට මෙම ගනුදෙනුවට සම්බන්ධ සියලුම දේශපාලකයින්ට දඬුවම් ලබාදිය යුතු බව අවධාරණය කළේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 14වැනිදා මහ බැඳුම්කර ගනුදෙනුවේ චූදිතයින් කිහිපදෙනෙකුට එරෙහිව නඩු පවරන ලෙස නීතිපතිවරයා විසින් නියෝග කිරීම පිළිබඳව අදහස් දක්වමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"මෙවැනි කුප්‍රකට ගනුදෙනුවක් සිදුවිය හැකි බව දැන දැනත් රනිල් වික්‍රමසිංහ විසින් අර්ජුන මහේන්ද්‍රන්ව මහ බැංකු අධිපති තනතුරට පත්කොට තිබෙනවා. එනිසා මෙම මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවේ චූදිත ලැයිස්තුවේ පළමුවැන්නා බවට පත්විය යුත්තේ රනිල් වික්‍රමසිංහයි. මෙම



ගනුදෙනුව සිදුවූ පසුව රනිල් වික්‍රමසිංහ කිවුවා, අර්ජුන මහේන්ද්‍රන් ගනුදෙනුවට සම්බන්ධ වුණේ නැහැ කියලා. නමුත් අර්ජුන මහේන්ද්‍රන් තොරතුරු ලබාදුන් බව විමර්ශනවලදී හෙළිවුණා. ඒ වගේම ටෙන්ඩර් මණ්ඩලය යෝජනා කළ මුදලට

15 වැනි පිටුවට

# නැගෙනහිර ජැටියේ අයිතිය රටට ගන්න පෙරට එන්න

## ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත සහෝදරයා

මේ වන විට කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විකිණීම සඳහා එකඟතාවයක් අත්සන් කර ඇති බවත් එබැවින් වගකිව යුතු දේශපාලඥයින් වරාය ආරක්ෂා ගැනීමට අවධානය යොමු කළ යුතුව ඇති බවත් කියා සිටි ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත සහෝදරයා මේ තත්වය තුළ කොළඹ වරාය බේරා ගැනීම සඳහා සටනක් ඇරඹිය යුතුව ඇති බවත් ඒ සඳහා රට ජාතිය ගැන හිතන සියලු දෙනාට එකතු වෙන්නැයි ආරාධනය කරන බවත් ප්‍රකාශ කළේය.

ලාල්කාන්ත සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 17වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. එහිදී තවදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද කීය.

"කොළඹ වරාය කියන්නේ ශ්‍රී ලංකාවේ හදවත කියලා තමයි කියන්නේ. මේ සටන මගහැරියොත් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වරායක් නැතිවෙනවා. ඒ සඳහා මේ අයගේ මතය රටට ප්‍රකාශ කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මහින්ද රාජපක්ෂ නිතරම කතා කරන්නේ දේශප්‍රේමය ගැන. නමුත් දැන් ඔහු වරාය විකිණීම ගැන ගොළු වෙලා. අපේ පක්ෂ නායක අනුර දිසානායක සහෝදරයාගේ මතය පැහැදිලියි. අපි පක්ෂයක් ලෙස වරාය ආරක්ෂා කිරීමේ සටනට අවතීරණ වෙලා ඉන්නවා. දෙමළ ජාතික සන්ධානයේ නායක ආර්. සම්බන්ධන්ගේ මතය මොකක්ද? රාවුෆ් හකීම්ගේ මතය



මොකක්ද? රිෂාඩ් බදුර්දීන්, තොණ්ඩමාන් මේ ගැන මොකක්ද කියන්නේ කියලා ප්‍රකාශයක් කළ යුතුයි.

ඒ වගේම මේ වනවිට ජනාධිපතිවරණයේ අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වීමට බලාපොරොත්තුවෙන් සිටින පිරිසක් ගැන කියවෙනවා. ඒ අතර ඉන්න කිහිප දෙනෙක්ගෙන්

15 වැනි පිටුවට

# මහජන බැංකුව විකිණීමට ඉඩ නොදිය යුතුයි

## ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා



සේවකයන්ට සහ ගිණුම් හිමියන්ට කොටස් ප්‍රාග්ධනය ලබා දෙන බව කියමින් මහජන බැංකුව පෞද්ගලීකරණය කිරීමට ආණ්ඩුව උපක්‍රමශීලී ලෙස ක්‍රියා කරමින් සිටින බවට චෝදනා කළ ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය මත කොටස් විකුණන බව ප්‍රකාශ කරමින් මහජන බැංකුව විකිණීමට ගන්නා ක්‍රියාමාර්ගවලට විරුද්ධව ජ.වි.පෙ. වෘත්තීය සමිති අනෙකුත් වෘත්තීය සමිති සමග ඒකාබද්ධව දැවැන්ත උද්ඝෝෂණයක් ආරම්භ කරන බවට අනතුරු ඇඟවීය.

බිමල් රත්නායක සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 23වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවක් අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද කියා සිටියේය.

"මහජන බැංකුව පෞද්ගලීකරණය කරන්න සූදානම් වෙන්නේ ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම, ඒ වෙනුවෙන් සේවකයන්ට කොටස් නිකුත් කිරීම සහ තැන්පතුකරුවන්ට කොටස් නිකුත් කිරීම යන ක්‍රියාවලියට මුවා වෙලා. ඒත් බැංකුව උපයන ලාභ වසර කිහිපයක් භාණ්ඩාගාරයට නොගෙන ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමට යොදා ගත හැකිව තිබෙනවා.

දැනටමත් අපේ පක්ෂය මේ ආණ්ඩුව ගෙදර යැවිය යුතුයි කියන උද්ඝෝෂණ මාලාව පටන් ගෙන තිබෙනවා. ජාතික සම්පත් විකිණීම යටතේ මහජන බැංකුව විකිණීමට විරුද්ධ සටන් පාඨයත් එයට අපි එකතු කරගෙන මේ ක්‍රියාමාර්ගය පරාජය කරනවා."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.